
# THE WHITE HACKLE


HAPPY NEW YEAR 1996





**JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY**




1. රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ 6 වන සංවත්සරය වෙනුවෙන් 1995.10.22 දින රාත්‍රියේ පනාගොඩ කඳවුරේ දී පැවැති සර්ව රාත්‍රික පරිත්‍රාන ධර්මදේශනය ආරම්භ කිරීමට බෙර වාදනය සහ සක් පිඹීම



2. ධර්ම ශ්‍රවනය කිරීම සඳහා පැමිණි මේජර් ජෙනරාල් ජ්එම්යූ සෙනවිරත්න, එන්ඩීසී, එම මැතිණිය, ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසු නිලයින්.




3. රෙජිමේන්තු මධ්‍යස්ථානයේ 6 වන සංවත්සරය වෙනුවෙන් 1995.10.23 දින මහා සංඝයා වහන්සේලා උදෙසා බති 1 එන්ඩබ් සපුතන්ත්‍රී සහ බති 1 ආර්එම් රත්නායක විසින් දන් පිළිගන්වන අවස්ථාව.




4. ලුතිනන් කර්නල් එන් ජ් ජයසූරිය, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී ශ්‍රීලපාහ විසින් රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රීලපාහ දේශන ශාලාවේදී ආබාධිත සෙබළුන් හට කෘතිම පාද දෙකක් සාද ගැනීම සඳහා පේශණ පත් ප්‍රදනය කිරීම.

# THE WHITE HACKLE

JANUARY 1996, VOLUME 03 NO. 01




## ආබාධිත රණවිරුවන් උදෙසා....

පට 10

## රිවිරැස මෙහෙයුමත් සමග 4 වන බලඇණිය....

රිවිරැස ක්‍රියාත්විතය සිදුවන අවස්ථාවේ යාපනය ප්‍රදේශයේ දමිළ වැසියන් සමග 4 ශ්‍රීලපාහ අ:නි: ලුති: කර්නල් ජ්කෝඩිපේ ජි සිරිවර්ධන ආර්ඩබ්ජි, ආර්එස්පි, පීඑස්සී, ප්‍රදේශයේ විස්තර විමසමින් සිටි අයුරු

පිටුව 16





## 1 ශ්‍රීලපාහ පුනරීන්....

සැම තැනම මැරී වැටී තිබූ ත්‍රස්ථවාදීන්ගේ මළ සිරුරු කිහිපයක්

පිටුව 32

## Headlines


යුධ හමුදපති පණිවිඩය 6
රෙජිමේන්තු ආඥාපතිගේ අවුරුදු පණිවිඩය 8

**EDITORIAL**

Morale 5

**HISTORY AND TRADITIONS**

1 වන බලඇණියේ ඉතිහාසය 22

**ක්‍රියාත්විත සටහන්**

රිවිරැස මෙහෙයුමත් සමග 4 වන බලඅණිය 14
රිවිරැස 3 වන බලඇණිය 24
1 ශ්‍රීලපාහ පුනරීන් ප්‍රදේශයෙහි පිහිටීම 31

**පිය සටහන්**

ආබාධිත රණවිරුවන් උදෙසා 10

**FEATURES**

බංකරයෙන් ඇසෙන කුරුටු ගී 37
Chemical Warfare 39

**DEPARTMENTS**

Feedback 2
What's New 26
තල් අරඹේ සිට 19
The Old Soldiers Column 12
Focus on People 9


**FRONT COVER :** (Main Picture) Major General AMU Seneviratne Ndc, Deputy Chief of Staff ofthe SL Army takes the Salute at the Passing Out Parade of SLMA Officer Cadet Batch No. 40 Alpha at Diyatalawa .

PRINT WELL (PVT) LTD.

THE WHITE HACKLE

**SRI LANKA**
**LIGHT INFANTRY MAGAZINE**

**Regimental Commander,**
Brigadier SHS Kottegoda, RSP
**Oftg. Centre Commandant**
Lieut. Col. DGS Balthazaar,

*The White Hackle*, Staff

**Editor-in Chief** - Lieut. Col DGS Balthazaar

**Associate Editor** - Major HW Hewaarachchi RWP,

**Sub Editors** - Major DU De Lanerolle RWP
Major J. Jayaweera
- Capt. IGRG Bogodawatte
- Capt. DM Wijerathne

**Honorary Consultants** - Maj. Gen. HV Athukorale VSV, psc - FBIM (Rtd) (Reg force)
Brigadier AER Abeysinghe KSV (Rtd) (vol force)

**Publisher** - Regimental Centre
Sri Lanka Light Infantry.

*The White Hackle* - is published quarterly under the Supervision of the Regimental Commander to provide the Regiment with information on people, policies, Operations, technical developments, views, opinions and ideas about the SriLanka Light Infantry. ◆ Manuscripts of interest to the Regiment are invited. ◆ Direct Communication is authorized to Editor, or Asst Editor The White Hackle, Regimental Centre, Army Cantonment Panagoda, Homagama, Phone 855204 or 437073 - 4 Extn 4340 or 4341. ◆ Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ◆ Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94 ◆ Use of Funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conferance held at Welioya.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

## Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the seventh issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through "The White Hackle" the journal of the oldest and proudest Regiment of them all' If you have much to say about your Battalion's experience go ahead and write in to the "WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien", I Serve"/ Let "WHITE HACKLE" be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all a happy New Year '96 and Compliments of the Season.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හඬ ඉතා උසස් ලෙස නංවන "වයිට් හැකල් සඟරාවේ" තෙවන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක, තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. "වයිට් හැකල් සඟරාවේ" ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සඟරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සඟරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. "වයිට්. හැකල් සඟරාව" ශ්‍රී ලංකා යුධ හමුදාවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන ප්‍රෞඪ තම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් ත්‍රෛමාසිකව පල කරනු ලබයි.

මෙම ප්‍රෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු හා සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් "වයිට් හැකල් සඟරාව" වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්ත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි "වයිට් හැකල් සඟරාවේ" පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සඟරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය යන "සේවය කරමි" මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදාවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their Families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words - a post card will do - and include your name, rank and address. We'll withhold your name if you so desire and may condense your views because of space. We can't publish or answer every one, but we'll use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama

2560 Kingston Road #1004
Scarborough, Ontario
Canada MIMILB

6th Nov. '95.

Lt. Col. D. G. S. Balthazaar
The Editor in Chief
The White Hackle
Regt. HQ. S. L. L. I
Army Cantonment
Panagoda, Homagama
Sri Lanka.

Dear Sir,

Thank you for registering me as a subscriber to the White Hackle and printing my letter in it.

Please find enclosed, a cheque for $10.00, of which please use Rs. 50.00 to send me the C. L. I. History book by Maj. Gen Athukorala. If it is possible, please use the balance of the $10.00 to obtain a photocopy of the other book (by Capt Oscar Abeyratne) or any other Regimental History book relating to the Colonial period, Ceylon Garrison Artillery, Ceylon Artillery Volunteers, Ceylon Mounted Infantry, Ceylon Mounted Rifles or the Ceylon Planters Rifle Corps. If that is not possible, please send me old issues of the White Hackle.

Also, can you please send me the addresses of the Curators ofthe Regimental Museum .

Thanking you in advance for your kind attention to this matter and hoping that I have not caused you any inconvenience.

**Yours Sincerely**
**Charles M. Amarasekera**

## Reply to Mr. Charles Amarasekera's Letter

Regtl Headquarters
Sri Lanka Light Infantry
Army Cantonment
Panagoda-Homagama
20 Dec 1995

Mr. Charles Amarasekera
2560 Kingston Road #1004
Scarborough, Ontario
Canada MIMILB

Dear Sir,

I thank you for your letter and the cheque for 10 US Dollars. We are pleased to inform you that we have placed you on our mailing list. A copy of the White Hackle would be mailed to you every quarter.

We are making arrangements to mail you the CLI History books as requested in your letter. The other books are not available. Copies of old issues of the White Hackle have been mailed to you, already.

On behalf of the Regtl Commander and all ranks of the Regiment I wish you a Merry Christmas and a Very Happy New Year.

Your's Sincerely
D. G. S. Balthazaar
Lt. Col.

# OBITUARIES

3 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් සිටියදී කටුක වේදනාවක් අපහට උරුමකර දෙමින් ජීවිතයේ වසන්තයේ දී නිවහල් දේශයක් උදෙසා 1995 ක්වූ නොවැම්බර් මස 17 දින, රිවිරැස, මෙහෙයුමේ දී තම දිවි කුසුම ලක් දෙරණ මත පිදූ ලුතිනන් කර්නල් ජේපීඑස් ජයවීර, ශ්‍රීලපාහ රණවිරුවාණන්ගේ නාමයට කෙරෙන උපහාරයකි මෙය



## ලුතිනන් කර්නල් . ජේපීඑස් ජයවීර ශ්‍රීලපාහ

ශ්‍රී ලංකා ද්වීපයේ ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීමේ පරම අධිෂ්ඨානයෙන් යුතුව සේවය කළ මෙම තරුණ නිලධාරී යාපනය අර්ධද්වීපයේ ත්‍රස්තවාදීන්ට එරෙහිව ශ්‍රී ලංකා යුද හමුදාව විසින් මෙහෙයවන ලද 'රිවිරැස' ක්‍රියාන්විතයට සහභාගී වෙමින් සිටියදී 1995 නොවැම්බර් මස 17 දින ත්‍රස්තවාදීන්ගේ වෙඩි පහරින් මිය යන ලදී.

වර්ෂ 1963 ක් වූ මැයි මස 24 දින ත්‍රිකුණාමලය රජයේ රෝහලේ දී උපත ලද ජයවීර පටබැඳිගේ ශාන්ත ජයවීර ත්‍රිකුණාමලය සිංහල මධ්‍ය මහා විද්‍යාලය වෙතින් සිප්සතර හදරා අධ්‍යාපන කටයුතු වල දී මෙන්ම ක්‍රීඩාවන් කෙරෙහි ද විශේෂ ඇල්මක් දැක්වූ මෙම තරුණ නිලධාරී මලල ක්‍රීඩා සහ බැට්මින්ටන් ක්‍රීඩකයෙකු වූ ඔහු පිහිනීමේ අති දක්ෂයෙකු විය. තරුණ ජයවීර පටබැඳිගේ ශාන්ත ජයවීර 1985 ක් වූ ජනවාරි මස18 දින ශ්‍රී ලංකා යුද හමුද නිත්‍ය හමුදාවට කෙඩෙට් නිලධාරියෙකු ලෙස බැඳී ඇත. එතැන් පටන් මූලික යුද පුහුණුව ශ්‍රී ලංකා යුද හමුද විද්‍යාපීඨයේ දී පාඨමාලා අංක 20 ඒ වෙතින් හදරා ඇත.

කෙඩෙට් නිලධාරී පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව 1986 ක් වූ සැප්තැම්බර් මස 20 වන දින 2/ලුතිනන් වරයෙකු වශයෙන් අධිකාරියට පත් කර 3 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඇතුලත් කරන ලද අතර, යුද හමුදාවේ ව්‍යාප්තියත් අනුව නව ඒකක නගා සිටුවීමේ දී එම ඒකකය වෙත 4 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සේවය කළ අවධියේ දී මෙම නිලධාරී බාණ්ඩභාර නිලධාරියෙකු ඒකක බුද්ධි නිලධාරී, විධායක අධිකාරී, කණ්ඩායම් අණදෙනනිලධාරී සහ ක්‍රියා සහ පුහුණු භාර නිලධාරී ලෙස ඉතා උසස් සේවයක් ඉටුකළ හැකි බව මෙහිලා සඳහන් කරනුයේ ගෞරව බහුමානයෙනි ඉතා උසස් ලෙස දෙමළ භාෂාව කථාකල හැකි වූ මෙම වීරෝධාර නිලධාරී ශ්‍රී ලංකා යුද හමුද බුද්ධි බලකායට අනුයුක්ත කර සිටි කාලයේ දී ප්‍රශංසනීය සේවයක් ඉටු කළේ ය. මේ අවාසනාවන්ත මරණයට ගොදුරු වන අවස්ථාවේදී මෙම කීර්තිධර ජ්‍යෙෂ්ඨ නිලධාරී 3 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුද වේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් සේවය කරන ලදී.

සැම විටම ක්‍රියාශීලීව හා බුද්ධිමත්ව කටයුතු කල ලුතිනන් කර්නල් ශාන්ත ජයවීර ද්‍රවිඩ ත්‍රස්තවාදීන්ට එරෙහිව ශ්‍රී ලංකා යුද හමුදාව දියත් කළ සැම ක්‍රියාන්විතයකම පාහේ පුරෝගාමීකව කටයුතු කළ යුක්තිගරුක නිලධාරියෙකු විය. උතුරු/නැගෙනහිර තුළ අඛණ්ඩ සේවය සඳහා පූර්ණ භූමි පදක්කමත්, වඩමරච්චි ක්‍රියාන්විතයට සහභාගී වීම නිසා වඩමරච්චි ක්‍රියාන්විත පදක්කමත් මෙම ජ්‍යෙෂ්ඨ රණවිරුවා හට ප්‍රධානය කරන ලදී. තව ද මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් පහත සඳහන් දේශීය හා විදේශීය පාඨමාලාවන් සාර්ථකව හදරා ඇත.

දේශීය - කනිෂ්ඨ මාණ්ඩලික පාඨමාලාව, ඒකක බුද්ධි නිලධාරී පාඨමාලාව


විදේශීය - තරුණ නිලධාරී පාඨමාලාව අංක 59 - ඉන්දියාව

කණ්ඩායම් නිලධාරී අණදෙන්නන්ගේ ප්‍රතිවිප්ලවකාරී සටන් පාඨමාලා අංක 70 - ඉන්දියාව, කනිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලා අංක 71 ඉන්දියාව

යුද හමුද සේවා කාලය තුළ දී දක්වන ලද උසස් මට්ටමේ හැකියාවන් මත යුද හමුද නිලධාරියෙකු සතුව තිබිය යුතු හැකීම් ප්‍රශංසනීය ගුණාංග හා චරිතවත් බවින් හෙබි මෙම නිලධාරී බලඇණියේ සියලුම නිලයින් අතර, සිතැගිය දිනාගත් වීරෝධාර එඩිතර යුක්ති ගරුක නිහතමානී නිලධාරියෙක් විය.

මිය යන මොහොත දක්වා ස්වකීය දේශයේ ස්වාධිපත්‍ය හා ඒකීය භාවයෙන් මෙන්ම භෞමික අඛණ්ඩතාවය සුරැකිම සඳහා ආත්ම පරිත්‍යාගයෙන් තම සේවය ඉටු කළ මෙම තරුණ නිලධාරී බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ කුරිරු ග්‍රහනයෙන් ස්වකීය මව්බිම බේරාගැනීම සඳහා අරඹන ලද සටනේ දී 1995.නොවැම්බර් මස 17 දින යාපනය අච්චුවේලි ප්‍රදේශයේදී මියයන ලදී.

7 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සේවයේ යෙදී සිටිය දී 1995 ක් වූ ඔක්තෝබර් මස 21 දින 'රිවිරැස' හමුද මෙහෙයුමේ දී තම සුසුම් පොද නිදහස් දේශයක් උදෙසා ලක් වාතලයට මුසු කළ මේජර් එන්ඩීපී මාසකෝරාල රණවිරුවාණන්ගේ නාමයට කෙරෙන උපහාරයකි මෙම සටහන



## මේජර් . ඩීඑන් මාසකෝරාල ශ්‍රීලපාහ

ශ්‍රී ලංකා ද්වීපයෙහි ඒකීය භාවය සහ භෞමික අඛණ්ඩතාවය සුරැකීමේ පරම අධිෂ්ඨානයෙන් යුතුව සේවය කළ මෙම තරුණ නිලධාරී අච්චුවේලි ප්‍රදේශයේ ත්‍රස්තවාදීන්ට එරෙහිව ශ්‍රී ලංකා යුද හමුදාව විසින් මෙහෙයවන ලද 'රිවිරැස' ක්‍රියාන්විතයට සහභාගී වෙමින් සිටිය දී 1995, ඔක්තෝබර් මස 21 වන දින ත්‍රස්තවාදීන්ගේ වෙඩි පහරින් මිය යන ලදී.

වර්ෂ 1968 ක් වූ සැප්තැම්බර් මස 30 වනදින උඩුපුස්සැල්ලාව රජයේ රෝහලේ උපත ලද දොන් නලින් මාසකෝරාල වැලිමඩ මධ්‍ය මහාවිද්‍යාලය වෙතින් සිප් සතර හදරා අධ්‍යාපන කටයුතු වල දී මෙන්ම ක්‍රීඩාවන් කෙරෙහිද විශේෂ ඇල්මක් දැක්වූ මෙම තරුණ නිලධාරී මලල ක්‍රීඩා සහ පාපන්දු ක්‍රීඩාව කෙරෙහි ද විශේෂ උන්දුවක් දක්වා ඇත. තරුණ දොන් නලින් මාසකෝරාල 1988 ක් වූ ජූනි මස 26 වන දින ශ්‍රී ලංකා යුධ හමුද නිත්‍ය බළසේනාව වෙත බැඳි 1988 දෙසැම්බර් 31 වන දින දක්වා යුධ හමුද විද්‍යාපීඨයේදීත් 1989 ජනවාරි 01 වනදින සිට 1990 ජූනි මස 08 වන දින දක්වා ඉන්දියාවේදී ද මූලික යුධ හමුද පුහුණුව ලබා ඇත.

කෙඩෙට් නිලධාරී පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව 2/ ලුතිනන් වරයෙකු වශයෙන් අධිකාරියට පත් කරනු ලැබූ මෙම නිලධාරී 6 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඇතුලත් කරන ලද අතර, යුධ හමුදාවේ ව්‍යාප්තිය අනුව නව ඒකක නගා සිටුවීමේ දී එම ඒකකය වෙතින් 7 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඇතුලත් කරන ලදී. එදින සිට මිය යන මොහොත දක්වා එම ඒකකය මගින් උතුරු ප්‍රදේශයේ කරන ලද ක්‍රියාන්විත රාජකාරී ඉමහත් කැපවීමකින් යුතුව ඉටු කරන ලදී.

යුධ හමුද සේවා කාලය තුළ දී දක්වන ලද උසස් මට්ටමේ හැකියාවන් හා යුධ හමුද නිලධාරියෙකු සතුව තිබිය යුතු මා හැඟි ප්‍රශංසනීය ගුණාංග හා චරිතවත් බවින් හෙබි මෙම නිලධාරී බළඇණියේ සියලුම නිලයින් අතර සිතැගිය දිනා ගත් වීරෝධාර, එඩිතර යුක්තිගරුක නිහතමානී නිළධාරියෙක් විය.

මිය යන මොහොත දක්වා ස්වකීය දේශයේ ස්වාධිපත්‍යය හා ඒකීය භාවය මෙන්ම භෞමික අඛණ්ඩතාව සුරැකිම සඳහා ආත්ම පරිත්‍යාගයෙන් තම සේවය ඉටුකළ මෙම තරුණ නිලධාරී බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ කුරිරු ග්‍රහනයෙන් ස්වකීය මව්බිම බේරාගැනීම සඳහා අරඹන ලද සටනේ දී 1995 ඔක්තෝබර් මස 21 වන දින යාපනය අච්චුවේලි ප්‍රදේශයේ දී මිය යන ලදී.

By Lt. Col DGS Balthazaar

# MORALE

## GENERAL

Morale depends on spiritual, intellectual and material aspects. The easiest way to high morale is success. The glamour and taste of Victory ensures high morale. The Military success in Jaffna against the LTTE terrorists during Op Riviresa was the greatest victory so far. The "White hackle" congratulates all the Officers and Other Ranks of the Army in general and the Battalions of the Sri Lanka Light Infantry who took part in the Operation in particular on a job well done. In a special way we salute all those who perished in that Battle.

Morale is a state of mind. It's an 'inner force' which will move a whole group of men to give their best to achieve a result. The foundation to high Morale are the under mentioned aspects.

(a) Spiritual
(b) Intellectual
(c) Material

## SPIRITUAL ASPECT

The object must be great and noble the achievement of which is vital. Man must sincerely feel that what he is doing matters directly towards fulfilment of the result. The spiritual aspect will withstand real strain. One should be able to endure difficult situations and progress steadily.

## INTELLECTUAL ASPECT

One must believe and trust that the objective can be attained and that the organization he works for is an efficient one; and have confidence in his leaders and that his life won't be thrown away lightly.

## MATERIAL ASPECT

A Fair deal is the 'trump card'. Good training, food, sports, clothing and equipment, a good salary and special allowances on time, constant leadership councelling and leave must be provided. Morale then cannot sag. Leadership must be firm but fair. Sadists must be rooted out.

## SPIRITUAL FOUNDATION

Spiritual Foundation should be firm. It does not solely mean the religious aspect - what it implies is basically belief in a cause. However, Religion is the greatest foundation for excellent "disciplined morale". Some Saints were soldiers or some soldiers were later canonised as Saints. In Sri Lankan history, some of the famous Warrior Kings ultimately became the champions of the ancient Buddhist Eras. Other examples in the world are Prophet Mohamed, the Sikhs, the Gurkhas, the fighting Hindus, the Crusaders and the Portugese East Indian Empire of the 16th century. History has proved that the Nazis, the famous Suicide Squads of the Japanese, the Russian Commissars and presently the LTTE Suicide Squads belief in a cause can firmly establish high Morale. Yet the Nazis and Japs were defeated because of their false spiritual values because when one fights for a just cause its a victory eventually and the world is behind you. Ultimately the good will prevail.

In conclusion we wish all our readers A Happy and Prosperous 1996.

- Concluded -

# යුද්ධ හමුදපති ලුතිතන් ජෙනරාල් ජීඑච් ද සිල්වා ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී විසින් නිකුත් කරනු ලබන අවුරුදු පණිවුඩය



1995 වසර ගෙවී 1996 වසර උදාවන අවස්ථාවේ වෘත්තිමය නිපුනත්වයෙන් යුතු ජයග්‍රාහී හමුදාවක සියළුම නිලයින් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සිවිල් සේවක/සේවිකාවන් හා ඔවුනගේ පවුල්වල සාමාජිකයින් වෙත මෙම ආසිරි පණිවුඩය නිකුත් කිරීම මා ලත් විශේෂ වරප්‍රසාදයක් සේ සලකමි. ඵලදැරූ අපේක්ෂාවන් තුලින් මා ලද සොම්නස හා සතුට පෙරටු කොට ඔබ සැම වෙත මේ උණුසුම් සුභ පැතුම් පිරි නමමි. මෙසේ අප සිරිත් පරිදි යහපත් අනාගතයක් උදෙසා පෙරුම් පුරමින් සිටිය ද එහි ඉලක්කය විය යුත්තේ ජීවන ප්‍රගතියට අරමුණු වන නිරවද්‍ය අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනිමයි.

පුනරාලෝචනය කරන කල්හි 1995 වසර සත්‍ය වශයෙන්ම දැනුමෙන් හා සාර්ථකත්වයෙන් හෙබි විවිධ සිද්ධීන්ගෙන් පරිපූර්ණ විය. පසුගිය වසරේ මා විසින් ඔබ වෙත දැන්වූ පරිදි මාගේ ඉල්ලීමවූයේ රජය විසින් මෙහෙයවන ලද සාම ප්‍රයත්නය යම් හෙයකින් අසාර්ථක වූනි නම් ඒ වෙනුවට යුදමය පියවරක් ගෙන සතුරාව විනාශ කිරීමට ඔබගේ සහාය අවශ්‍ය බව ය. ඇත්ත වශයෙන්ම රජය විසින් ගත් අවංක වූ සාම ප්‍රයත්නය එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් පිළිකෙව් කොට ඔවුන් විසින් අමානුෂික ලෙස තෙවන ඊලාම් යුද්ධය ආරම්භ කෙරින. ඊට එරෙහිව අප නැගී සිටි රජයට පක්ෂපාතීත්ව නොබියව හා දක්ෂ ලෙස ජීවිත පරිත්‍යාගයෙන් සහ නොනස්නා ධෛර්යයෙන් යුතුව සතුරා විනාශ කිරීමට අපට හැකි වූයේ අප ලත් පුහුණුව හා නිසි නායකත්වය හේතු කොට ගෙන ය. අපගේ එඩිතරභාවය සියළු ජන කොටස් විසින් ගෞරව සම්ප්‍රයුක්තව සාඩම්බරයෙන් පිළිගෙන ඇත. මේ බව විවිධ ජන මාධ්‍ය තුලින් හා ගම්නියම්ගම් හා ප්‍රසිද්ධ ස්ථාන වල දැක්වෙන මහජන ප්‍රතිචාර වලින් කදිමට පිළිබිඹු වේ.

තදනන්තරව රජය විසින් ජාතින් අතර සමගිය හා සමාදානය සඳහා අර්ථවත් දේශපාලන විසඳුමක් මං පෙහෙලි කරන අතර, අර්ථවත් වූ යුද හමුද ක්‍රියාන්විතය වන "රිවිරැස ප්‍රථම අදියර" අප විසින් නිම කලේ මෙතුවක් කල එල්ටිටිඊ ත්‍රස්තවාදීන් විසින් තම ජීවනාලිය වශයෙන් ප්‍රකාශිත යාපනය නගරය අත්පත් කර ගැනීමෙනි. එම ක්‍රියාන්විතයේ දී ආරක්ෂක සේනාවන් දක්වන ලද ඇප කැපවීම, වීරත්වය, පරිත්‍යාගය හා දක්ෂතාවය සැම දෙනා විසින් බෙහෙවින් අගය කරන ලදී. 1995 දෙසැම්බර් මස 05 වන දින යාපාපටුන මධ්‍යයේ ජාතික කොඩිය ලෙලදුනි. එකී මෙහෙවරට වෙහෙසුනු සමූහ මෙහෙයුම් ආඥාපති ඇතුළු සියළු ආරක්ෂක සේනාවන්ට මගේ උණුසුම් ආශිංසනය හිමිවේ. පාලනමය සහ හටකාර්ය සම්පාදන අංශ වෙතින් සටන් වැදුනු සෙබලාට අවැසි ආධාර සැපයීමේ දී අනේක බාධක මෙන් විවිධ තර්ජන වලට මුහුණ පෑමට සිදුවිය. එහෙත් සාමූහික පැවැත්මේ අති උදරත්වය පිළිබිඹු කරමින් ඒ සියල්ල මැඩගෙන අදල මෙහෙවර ඉටු කිරීමට ඔවුහු සමත් වූහ. සටන් වැදි සෙබලාගේ විනය හා පැවැත්ම ද ඉතාමත් ආදර්ශමත් විය.

සාමයට හිතැති දමිල ජනතාව ද ඇතුළු සියළු පුරවැසින් අනලස්ව එල්ටිටීඊ ත්‍රස්තවාදීන්ගේ අදම්වූ යටි අරමුණු ඒත්තු ගැනීමෙන් පසු, රජයේ ආරක්ෂක සේනාවන් පිළිබඳව පැහැදීමක් ඇති කර ගන්නා ලදී. මෙයට විශේෂ හේතුව නම් සිය ගණන් ත්‍රස්තවාදීන් ද ඔවුන්ගේ කඳවුරු ද ආක්‍රමණික පහසුකම් ද විශාල වශයෙන් විනාශ කරමින් "ඉදිරි පිම්ම" හා "රිවිරැස" ක්‍රියාන්විතයන් සාර්ථකව අවසන් කිරීමට අප හමුදවට හැකිවීමයි.

එයින් බලන කල සැම සෙබලෙකුගේම යුතුකම වනුයේ තමන්වෙත මහජනතාව දැක්වූ විශ්වාසය සහ පැහැදීම පලුදු නොවී රැකගැනීමත් රජයේ ආරක්ෂක සේනාවන්ට ත්‍රස්තවාදීන් විනාශ කිරීමේ යුද්ධය ජය ගැනීමට හැකිය යන ඔවුන් තුල වූ විශ්වාසය අනුව කටයුතු කිරීමත් ය. එහෙත් මේ කර්තව්‍ය සිතැගිසේ පහසුවක් වේ යැයි නොසිතිය යුත්තේ එල්ටිටීඊ ත්‍රස්තවාදීන්ගේ ඊළඟ පියවර වන්නේ ද ඔවුන්ට මෙතෙක් අහිමි වූ සියල්ල ජය ගැනීම සඳහා කරනු ලබන ක්‍රියාදාමය ද ඉදිරියෙන් ඇති බැවින් එසේ හෙයින් මෙතෙක් වැඩි දියුණු කළ දක්ෂතාවය හා කාර්යශූරත්වය ඉදිරියට ද ගෙන යමින් තවදුරටත් අප වෙත පැවරි ඇති භාරදූර කර්තව්‍යයන්ට මුහුණ දීමට සූදනම් විය යුතු ය.

සංග්‍රාමික සෙබලාට සහයෝගය දැක්වීමට පොදු මහජනතාව ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වීම මහත් සැනසීමටත් සතුටටත් කරුණක් වේ. ඔවුන් ආබාධිත සෙබළුන් කෙරෙහි මෙන්ම සටනේ දී මියගිය අයවළුන්ගේ ලඟම ඥාතීන්ට නිරතුරුව ඇප උපකාර කිරීම ද, ශ්‍රී ලංකා යුද හමුදවේ නිත්‍ය සේවයට සෙබළුන් බඳවා ගැනීම සඳහා මෑතක දී පැවැත්වූ පරීක්ෂණයන්ට දහස් ගණනින් තරුණයන් ඉදිරිපත් වීම ද නිදසුන් කොට ගත හැකි ය.

මහජනතාවගේ සිත් දිනා ගැනීමට අපොහොසත්ව එල්ටිටීඊ ත්‍රස්තවාදීන් දෙමාපියන්ගේ අකමැත්තට එරෙහිව සිය ලාබාල දරුවන් ඔවුන්ගේ පිරිහෙමින් පවත්නා ත්‍රස්ත කණ්ඩායම් වලට බඳවා ගැනීමේ නිහින ව්‍යාපාරයක් දියත් කර ඇත. එමෙන්ම සාමයට ලැදි වැදගත් උතුරු නැගෙනහිර දෙමළ පුරවැසයන් එල්ටිටිඊ ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප කර ඇතත් ත්‍රස්තවාදීන් ඉදිරියේ ඔවුන් අසරනව ඇත. අපගේ යුතුකම වනුයේ මේ සැම පුරවැසියෙක්ම ආරක්ෂා කිරිමයි.

අබාධිත සෙබළුන් පුනරුත්ථාපනය කිරීමට සහ නිසි වෛද්‍ය පහසුකම් ලබාදීමට ආරම්භ කර ඇති වැඩපිළිවෙල අනුව සතුටුදයක ප්‍රතිඵල ලබා ඇති බව මම සතුටින් ප්‍රකාශ කරමි. එමෙන්ම, තුවාලලත් සෙබළුන්ට නිසි වේලාවට වෛද්‍ය පහසුකම් ලබා දීම සඳහා හැකි සැම පියවරක්ම නොපිරිහෙලා ගත යුතු ය. ආබාධිත සෙබළුන් විසින් සිය දක්ෂතාවයන් විදහා පෙන්වමින් මෑතක දී බණ්ඩාරනායක ගුණානුස්මරණ ශාලාවේ දී පවත්වන ලද අත්කම් ප්‍රදර්ශණය සියළු දෙනාගේම සිත් ඇද ගන්නා ලදී . එමෙන්ම එය ඔවුනගේ සැඟවුනු කලා කෞෂල්‍යයන් පිළිබිඹු කිරීම දට මහඟු අවස්ථාවක් විය. මෙම ආබාධිත සෙබළුන් ජයග්‍රාහී කණ්ඩායමක සාමාජිකත්වය මෙන්ම සමාජයේ දී නිසි තැන් ගෙන කටයුතු කරන් අයවළුන් ලෙස පිහිටුවීම සඳහා නිරතුරුව අප ඔවුනට අත දිය යුතු ය. මේ සඳහා මහඟු සේවයක් කරන යුද හමුද වෛද්‍ය අංශය සහ වෙනත් අයවළුන් වෙත අපගේ ඉමහත් කෘතඥතාවය පිරිනැමිය යුතු ය.

මේ අවස්ථාවේ දී මා විසින්, යුද හමුද සේවා වනිතා ඒකකය විසින් සටනේ දී දිවිපිදූ අප රණවිරුවන්ගේ ලඟම නෑ හිතවතුන් වෙත ද ආබාධිත වූ නිලධාරි හා සෙසු නිලයින් වෙත ද සුභ සාධනය සඳහා ඉටු කර ඇති අනුපමේය මෙහෙය අතිශයින් අගය කළ යුතුය. ඔවුන්ගේ එම උසස් කැපවීම තුලින් නිසැකවම සටනින් මිය ගිය රණවිරුවන්ගේ මෙන්ම ආබාධිත සෙබළුන්ගේ පවුල් වල සාමාජිකයින් පිහිටක් ලබා ජීවිතයේ සෞභාග්‍ය ලඟා කර ගැනීමට හැකිවේ ය යනු මාගේ විශ්වාසයයි. සේවා වනිතා ඒකකය දිනෙන් දින යෙහෙන් වැජඹේවායි මම ප්‍රාර්ථනය කරමි.

කෙතරම් බැරෑරුම් ක්‍රියාන්විතයන් වල යෙදී සිටිය ද යුද හමුදව ක්‍රීඩා ඇතුළු සැම ක්ෂේත්‍රයකම ඔවුන්ගේ විවිධ හැකියාවන් දියුණු කිරීම සඳහා නිසි පියවර ගැනීමට අමතක නොකරන ලදී. ඉතා දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවක් පෙරමුණ ගනිමින් ජාතික ක්‍රීඩා තරඟ වල දී මෙන්ම සාෆ් ක්‍රීඩා තරඟ වල දී ද උසස් සහභාගිත්වයක් පෙන්නුම් කර ඇත. ඒ අනුව ඔවුන් අප මව්බිමට කීර්තියක් අත්පත් කර දෙනු ලැබීය. එවැනිම දක්ෂ අයවළුන් බොහොමයකට ක්‍රියාන්විත රාජකාරීන් නිසා විවිධ තරඟ වලට සහභාගීවීමේ අවස්ථා ද අහිමි වී ඇත.

සටනේ දී ජීවිත පරිත්‍යාග කල අයවළුන්ටත් ඔවුන්ගේ ලඟම ඥාතීන්ටත් මා හිස නමා ආචාර කරන අතර වටිනා ජීවිත අහිමි වූ එම ඥාතින් සමග සෝතැවුල් බෙදගැනීමට කැමැත්තෙමි. ඔවුන් එම උතුම් පරිත්‍යාගය ඉටු කලේ අප මව්භූමිය ත්‍රස්තවාදීන්ගෙන් මුදවාගෙන එහි ඒකියභාවය ආරක්ෂා කිරීමට බව අප මැනවින් වටහා ගත යුතු ය. ඔවුන් සිරුරෙන් අප ලඟ නැතත් සද නොමැකෙන නාමයක් අප අතර තබා ගොස් ඇත. මෙලෙසින් ජීවිත කැපකල යුද හමුද සමානාන්තර සේවයේ යෙදී සිටි සිවිල් සේවක මහතුන් ද එලෙසින් උතුම් කොට සලකන අතර, ඔවුන්ටත් ඔවුන්ගේ නෑ හිතවතුන්ටත් මගේ ගෞරව ආචාරය පිරිනැමේ.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදවේ සියළුම නිලධාරීන්ටත් සෙසු නිලයින්ටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සිවිල් සේවාවේ කාර්ය මණ්ඩලයටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් ලැබුවා වූ මේ නව වසර ප්‍රීතියෙන් සාමයෙන් හා සෞභාග්‍යයෙන් පිරි නව වසරක් වේවායැයි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

1996 නව වසරේ දී ඔබ සිතන පතන උතුම් පැතුමන් සාක්ශාත් කර ගැනිම සඳහා අවශ්‍ය ධෛර්ය, ත්‍රිවිධ රත්නයේ හා සියළු දෙවියන්ගේ ආශිර්වාදයන් නොඅඩුව ලැබේවා.

**ජීඑච් ද සිල්වා ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී**
**ලුතිතන් ජෙනරාල් යුද්ධ හමුදපති**

1996 ජනවාරි මස 01 දින

# New year message from the Commander of the Army

With the passage of year 1995 and the dawn of 1996 it is indeed a privilege to greet All Ranks of a triumphant, combat effective, professional Army, their Families, Civilian employees and their Families. It is with a great sense of achievement and pride that I extend my warmest personal greetings to each one of you for the year 1996. A New Year is the time of Renewals, new Resolutions, Hope for a better future, great expectations for prosperity and greater achievements in all spheres of human activity.

In retrospect, the year 1995 has been eventful, educative and successful, As mentioned in my message for the year 1995, I appealed to each one of you, "If peace efforts fail, be prepared to execute the Government's directive when required, to enforce the military options needed to encounter and destroy the enemy" When the sincere peace efforts of the Government were crushed by the LTTE and they embarked on a barbaric Eelam War III, we did rise to the occasion. We did so, fearlessly, faithfully and decisively. This was possible with your dedication, loyalty and determination to succeed, with good training and the competent leadership afforded. The Nation loudly and proudly acknowledged our prowess. This is amply evident even today at every intersection, across roads and in the Mass Media.

Whilst the Government is in the process of searching for a meaningful political solution for Ethnic Peace and harmony, we have just completed a historical and Morale boosting Military Operation - "Riviresa Phase ONE" regaining the domination of the Jaffna city from the clutches of the separatist Terrorists. The valour and the dedication to duty shown by all Ranks who participated in Operation "Riviresa" will forever be greatly appreciated. Consequent to their attitude, their courage and determination, Jaffna was regained on 5th December 1995 by the Security Forces. The National Flag of our Country began to flutter in the heart of the city where the Tiger terrorists had dominated and proclaimed that it was their eternal nerve centre. I congratulate the Overall Operations Commander and all Troops on their brave and excellent efforts. The Combat skills displayed by the Troops were of a very high standard. With limitations on time for training, under difficult conditions, our Soldiers were able to achieve optimum results from the new equipment acquired. The Administrative and Logistics elements had to put up against great odds to support the combat Soldier in battle. Yet all this was possible through dedicated and unselfish team work. The discipline and conduct of the combat Soldier was exemplary.

The peace loving Citizens of this Country including the Tamils, realizing the treacherous ulterior motives of the LTTE, have begun to admire the Government Forces for their excellent achievements at the risk of their lives in crushing the Separatist Terrorists as seen during "Operation Leap Forward" and "Riviresa Phase ONE" where scores of terrorists were killed and wounded, and LTTE military installations and facilities destroyed.

It is the duty of each and every soldier to maintain the confidence and the admiration of the general Public who are convinced that this war can be won by the Military. We must now strive to maintain the lofty standards achieved. This is not an easy task as it is at this juncture that the LTTE too will try to regain what they lost in terms of prestige and credibility. We cannot be complacent. The good hard work must continue. There is more to achieve, Be ever alert to the machinations of the enemy forces, pre-empt their actions and outwit the LTTE by sound tactics and better strategies.

It is indeed a great consolation and heartening to see the general public now come forward voluntarily to assist the combat soldier, giving much thought help and co-operation in terms of welfare and rehabilitation of the disabled and the dependants of those killed in action. This was evident in particular during the current recruitment programme by the response of the youth who rallied round in their thousand to join the Regular Force of the Sri Lanka Army.

In contrast the LTTE failed to win the hearts and minds of the People. They yet again embarked on conscripting children against the will of their parents to strengthen the deteriorating and demoralized LTTE fighting cadre. The honourable and peace loving Tamil citizens in the North and East have already rejected the LTTE, yet these innocent people are helpless. Let me remind you that it is our bounden duty to ensure the security of each and every citizen of this Country.

I am pleased that efforts made to offer better medical facilities to the injured soldier and to rehabilitate him have achieved satisfactory results. We will tirelessly endeavour to offer these wounded soldiers the best possible care. The recently held exhibition by the disabled soldiers at the BMICH was indeed touching. It was the manifestation of different, latent talents possessed. We must act as a buttress to each and every disabled soldier to ensure that he does not feel left out or forgotten and accepted as an active member in a winning team and in Society. In this regard the yeoman services rendered by the Army Medical Services and the civilians involved in the Rehabilitation process must be commended.

I would like to a pay a glowing tribute to the Army Seva Vanitha Unit which has contributed in no small measure towards the welfare of the next of kin of the deceased and disabled Officers and Other Ranks. Through their dedicated services . I am assured that the deceased and disabled soldiers Families will benefit immensely and prosper in life. May they go on from strength to strength in all their endeavours.

Inspite of the heavy operational commitments the Army did make its mark in every sphere that we participated. Our talented sportsmen and Women continue to spearhead the Nations Sporting activities. Sri Lanka's performance in the SAF games will bear testimony to this. It is appreciated that many more are unable to participate in these activities due to operational commitments and deployment.

It is a matter of great sorrow that so many of our beloved sons of peace loving parents have paid the supreme sacrifice. These lives were not laid in vain, for, they have laid down their lives to fulfil the great expectation of Peace by all sections of the people of Sri Lanka. I bow my head in respect, as a special tribute to those gallant members of the Army who are no more with us to share in the sweet smell of success. We will, for ever, not forget them. We will also not forget those civilian employees in the Army who paid the supreme sacrifice in the North and East along with their comrades in Arms.

Finally, I take this opportunity to wish all Officers, Men and their Families and the Civilian Staff and their Families a very Happy, Peaceful and Prosperous New Year.

May the blessing of the Noble Triple Gem and all Devas protect, guide and inspire you to greater achievements in 1996.

**GH De Silva RWP VSV USP**
**Lieutenant General,**
**Commander of the Army**

**01st January 1996.**

# අලුත් අවුරුදු පණිවුඩය - 1996



වසරක් ගෙවී අසිරිමත් නව වසරක් උදාවත් සමගම ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු ආඥාපති වශයෙන් ඔබ සැම වෙත මෙම සුභාශිංසන පණිවුඩය නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

නිමාවන වසර තුළ ශ්‍රී ලංකා පාබල හමුදා නිත්‍ය / ස්වේච්ඡා බළඇණිවලට ශ්‍රී ලංකා ද්වීපයේ ඒකීය භාවය වෙනුවෙන් අතිමහත් දුෂ්කර ප්‍රදේශවල කටුක කාල පරිච්ඡේදයක් පසුකරමින් ක්‍රියාන්විත රාජකාරියේ නිරතවීමටසිදුවිය. එවැනි භාරධූර හා දුෂ්කර වූ ක්‍රියාවන් ඉටුකිරීමෙහිලා තම දෙමාපියන්, අඹු දරුවන්, සහෝදර සහෝදරියන් ඥාති මිත්‍රාදීන් ගේන් ඈත්ව තම මතු පරපුර වෙනුවෙන් ශ්‍රී ලංකාද්වීපය බේරා ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව මිල කළ නොහැකි තම ජීවිතය ද නොතකා කටයුතු කරමින් ස්වකීය රාජපාක්ෂික භාවය දැක්වීමේ හේතුවෙන් එකී සැම කටයුත්තක දීම බාධාවකින් තොරව රෙජිමේන්තුවේ මහේශාක්‍ය භාවය ද ආරක්ෂා කරමින් විජයග්‍රහණය කරා ලඟාවීමට හැකිවීම ඇත්ත වශයෙන්ම මටත්, රෙජිමේන්තුවේ සැම දෙනාටත් සතුටට කරුණකි.

ගෙවිගිය වසර තුළ විවිධ ක්‍රියාන්විත රාජකාරිවල යෙදී සිටියදී තීරණාත්මක සටන ජයග්‍රාහීව නිමා කිරීමේ පරම චේතනාවෙන් මෙම රෙජිමේන්තුවේ නිලධාරී සහ සෙසු නිලයින් කිප දෙනෙකු අප අතරින් වියෝ වුව ද ඔවුන් දේශයේ රණවිරුවන්ගේ නාමය සඳ කල්හිම අප අතර අනුස්මරණය වේ. ස්වකීය දේශයේ පොදු අරමුණක් උදෙසා මිල කල නොහැකි තම තරුණ ජීවිතය ගැන නොතකා අභීතව සතුරා ඉදිරියේ සටන් වැදී මිය ගිය, එවන් නිලධාරීන් සහ සෙසු නිලයින් අප අතරින් වෙන්වීම එම රණවිරුවන්ගේ දෙමාපියන් අඹු දරුවන් සහ සහෝදර, හිතෛෂීන්ට, මෙන්ම පාබල හමුදා රෙජිමේන්තුවටත්, යුධ හමුදාවටත්, පොදුවේ ශ්‍රී ලංකා ද්වීපයටත් දැරිය නොහැකි පාඩුවකි.

තමන් උපන් බිමේ ඒකීය භාවයට, ස්වාධිපත්‍යය, ස්වෛරීභාවය හා දේශයේ පරමාධිපත්‍ය උදෙසා මව් බිම වෙනුවෙන් ජීවිත පූජා කළ රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත ඔබ සැම වෙනුවෙන් මාගේ හෘදයාංගම භක්ත්‍යාදර ප්‍රණාමය පුද කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

"රිවිරැස" මෙහෙයුම දියත් කළ යාපන ප්‍රදේශය අත්පත් කර ගැනීමෙහිලා වූ ක්‍රියාන්විතයේ දී පාබල හමුදා රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසු නිලයින් එම ජයග්‍රහණය තහවුරු කිරීමේ දී උසස් විනයකින් හා මනා පුහුණුව තුළින් ලද ඇප කැපවීම නිසා ඉතා උසස් අනිද්මින් එමරාජකාරිය ඉටු කරන ලදී. මින් ඉදිරියටත් එවැනි උසස් මට්ටමකින් විනය ගරුක භාවය වර්ධනය කර ගැනීමටත් ලද සැම අවස්ථාවක දීම පුහුණුවීම් සිදු කිරීමටත් අධිෂ්ඨානය කර ගත යුතු ය.

අවසාන වශයෙන් උදාවන 1996 වසරේ ද පාබල හමුදා රෙජිමේන්තුව වෙතින් අපේක්ෂිත ජයග්‍රහණයන් කරා ලඟා වීමට සහ තමා වෙත පැවරෙන රාජකාරීන් ඉතා උසස් මට්ටමින් හා ආදර්ශමත් ලෙස ඉෂ්ඨ කිරීමට සියලු දෙනා හට අවශ්‍ය ශක්තිය හා ධෛර්ය ඇති බවට මා විශ්වාස කරන අතර, එම රාජකාරි නොපිරිහෙලා ඉටුකර එක්සත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ පරම අරමුණ සපල කිරීමට අදිටන් කර ගනිමු.ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සියලුමනිලධාරීන් සහ සෙසු නිලයින් හටත්, මියගිය අතුරුදහන් නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ පවුල්වල සියලුම සාමාජිකයින්ටත්, සිවිල් සේවක මහතුන් ඇතුළු එම පවුල්වල සියලුම සාමාජිකයින්ටත් ලැබුවා වූ 1996 වසර යස ඉසුරින් හා සාමයෙන් පිරි සෞභාග්‍යමත් අලුත් අවුරුද්දක් වේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, සැම භාරධූර කාර්යයක දීම ඔබ සැමට තෙරුවන් සරණ හා සියලු දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවායි මා එක සිතින් ප්‍රාර්ථනා කරමි.

එස්එච්එස් කොට්ටේගොඩ ආර්ඩබ්පී ආර්එස්පී
බ්‍රිගේඩියර් රෙජිමේන්තු ආඥාපති ශ්‍රීලපාහ

1995 දෙසැම්බර් මස 30 දින

# Focus on People

## පාබල දස්කම් විස්කම් හා කුසලතා


Compiled by
Lt Col. DGS Balthazaar

යුධ බිමේ මෙන්ම කෙලි මඩලේ ජය කොහෙලි නංවන පාබල සෙබල දස්කම්, විස්කම් හා සැඟවී ඇති කුසලතා එළි දැක්වීම හා ඔවුන්ගේ ජයග්‍රහණයන් ඉස්මතු කිරීමේ අරමුණින් **Focus on People** විශේෂාංගය ඔබ වෙත හඳුන්වා දී ඇත.

ඔබගේ බළඇණියේ, කණ්ඩායමේ එමෙන්ම බළකායේ විශිෂ්ට සෙබලයේ දස්කම් දක්වන්නන් පිළිබඳ විස්තර අප වෙත එවන්න. එය ඔහු යුධ පිටියේ සතුරා ඉදිරියේ විදහාපු විශ්මිත ක්‍රියාවලියක් විය හැකි අතර නැතහොත් ක්‍රීඩා පිටියේ ජය කොහෙලි නැංවීමක් විය හැක. එමෙන් ම විශිෂ්ට ලෙස හමුද දිවිය ද ජය ගැනීමක් ද විය හැක.

ඔබගේ සියලු ලිපි පහත සඳහන් ලිපිනයට ලැබීමට සලස්වන්න.

සහකාර සංස්කාරක, **Focus on People** වයිට් හැකල් සහරාව, රෙජි ශ්‍රීලපාහ, හමුද ජනපදය, පනාගොඩ



# යුද්ධයේදී පාදයක් අහිමි ආබාධිත රණවිරුවෙකුගේ ක්‍රීඩා විචිත්‍රාංග එළි දැක්වීම

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ යටතේ පාලනය වන 6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවට අයත් සෙ/15194 සැරයන් සිරිසෝම එම්පිආර් ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටියදී ඔහුගේ වම්පාදය බිම් වෙඩිල්ලක් පෑගීමෙන් දන හිසෙන් පහළ කොටස සම්පූර්ණයෙන්ම විසන්ධි කර ඇත.

එසේ එක් පාදයක් අහිමි වුවත් නොපසු හට උත්සාහයක්, දැඩි අධිෂ්ඨානයත් පෙර දැරිකරගත් මෙම ආබාධිත රණවිරුවා ඉන් නොනැවතී ඔහුගේ දක්ෂතාවයන් ඔප් නංවමින් 1991 සිට මේ දක්වා දේශිය හා විදේශීය ආබාධිත ක්‍රීඩා තරඟ ඉසව් සඳහා ඉදිරිපත් වී දක්ෂතම ක්‍රීඩකයා බවට පත් වී ඇත. 1994 එක්ස්පෝ ක්‍රීඩා සමාජය වෙතින් ශාන්තිකර සාගරික ඇත පෙරදිග කලාපීය ආසියාතු ආබාධිත ක්‍රීඩා උළෙලට ඉදිරිපත්වීමට සුදුසුකම් ලද අතර, එම තරඟාවලිය 1994 සැප්තැම්බර් මස 31 වන දින චීනයේ බීජිං නුවර රටවල් 48 කගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

එහිදී මෙම ආබාධිත රණවිරුවා සහභාගි වූ මීටර් 200 සහ මීටර් 400 තරඟ ඉසව් දෙක වෙනුවෙන් රිදී හා ලෝකඩ පදක්කම් දෙකක් ලබා ගැනීමෙන් ආබාධිත ධාවන ශූරයෙකු වශයෙන් මොහු විසින් ශ්‍රී ලංකාවටත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදවටත් අති මහත් කීර්තියක් ගෙන දෙන ලදී.

ඉන් ඔප් නංවාගත් මොහුගේ ක්‍රීඩා කෞශල්‍ය තව දුරටත් ඉදිරියට ගෙන යමින් ඉදිරියේ දී ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වීමට නියමිත ලෝක ආබාධිත ඔලිම්පික් ක්‍රීඩා උළෙලට ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා මොහු නම් කර ඇති බව ද, අභිමානයෙන් යුතුව සඳහන් කරමි. මේ අනුව දැනට දක්ෂිණ ආසියාවේ සිටින වේගවත්ම ආබාධිත ධාවන ශූරයාවීමේ භාග්‍යය ලබා ගැනීමට මොහුට දිරිය, ධෛර්යය, වීර්ය ලැබේවායි කියා ප්‍රාර්ථනය කරමි.

වාර්තා කරන්නේ රෙජිමේන්තු මධ්‍යස්ථානය - ශ්‍රීලපාහහි
**වරණ සැරයන් අනුර පීජීඑන් විසිනි**

# "ආබාධිත රණවිරුවන් උදෙසා පරිත්‍යාගයන් පිරිනැමුණු වගයි"



හොන්නන්තර, පිළියන්දල, විජයනන්දාරාම විහාරස්ථානයේ දී ආබාධිත රණවිරුවන් උදෙසා රෝද පුටු පරිත්‍යාග කිරීමේ උත්සවයේ දී මෙම ඒකකයේ සුභසාධක නිළධාරී කපිතාන් (උපා) අයිකේයු දයානන්ද ශ්‍රීලපාහ විසින් ස්තුති කථාව කරන අයුරු.

අපගේ මව් බිමේ ඒකීය භාවය හා රටේ භෞමික අඛණ්ඩතාවය රැකගැනීම වස්, දිවිහිමියෙන් කුරිරු ත්‍රස්තවාදීන් සමග සටන් වැද ආබාධිත තත්වයට පත් වූ අපගේ ශ්‍රී ලංකා පාබල හමුද රණවිරුවන් උදෙසා 95/11/25 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රීලපාහ හි සංගීත සංදර්ශණයක් පවත්වන ලදී. මෙම සංගීත. සංදර්ශණය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රවීන ගායක ගායිකාවන් වන රූකාන්ත ගුණතිලක හා චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය, වෝල්ටර් ප්‍රනාන්දු මහතාත් සහභාගී වූ අතර, ඔහුන් විසින් රණවිරුවන් සංගීත සයුරේ ගිල්විය.

එමෙන්ම මෙම සංගිත සංදර්ශණයේ සංගීතය මෙහෙයවනු ලැබුයේ වෝල්ටර් ප්‍රනාන්දු මහතාගේ "සිම්පල්" වාදක මඩුල්ලට සහ අනිකුත් ගායක ගායිකාවන් සංග්‍රහ වියදම් වශයෙන් තියෝ ප්‍රනාන්දු මහතා විසින් රු. 9100 ක මුදලක් පිරිනමන ලදී.

මෙමගින් බලාපොරොත්තු වනුයේ ආබාධිත තත්වයට පත් වූ අපගේ වීරෝධාර සෙබලුන්ගේ මානසික තත්වය තරමක් දුරට හෝ සනසාලීමට ය. එදින සේනාවිධායක තුමා ශ්‍රීලපාහගේ පූර්ණ අනුග්‍රහය ඇතිව මෙකී උත්සවය සංවිධානය කර ඇති අතර, එහිදී ජයන්තා කනත් මහත්මිය විසින් රෝද පුටුවක් ආබාධිත රණවිරුවන් සඳහා පරිත්‍යාග කරන ලදී. තව ද, ආබාධිත රණවිරුවන්ගේ සුභසාධනමය කටයුතු සඳහා රු. 5000.00 ක මුදලක් ඔන්රේ බල්තසාර් මහතා විසින් පරිත්‍යාග කරන ලද අතර, එම මහත්ම/මහත්මීන්ට අපගේ භක්ති ප්‍රනාමය මෙසේ පුදකරන්නෙමු.

යුගයේ මෙහෙවරක යෙදී සිටි ආබාධිත තත්වයට පත් වූ මෙවැනි වීරෝධාර රණවිරුවන් උදෙසා විවිධ පුද්ගලයින් හා සංවිධාන ආයතනවලින් සිදු වූ අනුපමේය ක්‍රියාදාමයන් පහත සඳහන්පරිදි සටහන් තබන්නෙමු.

රෙජිමේන්තු ආධාරක බළඇණිය, ශ්‍රීලපාහ හි ආබාධිත රණවිරුවන්ගේ ප්‍රයෝජනය පිණිස ලබාදී තිබූ රූපවාහිනී යන්ත්‍ර 02 ක්‍රියා විරහිතව තිබූ අතර, එකී රූපවාහිනී යන්ත්‍ර 02 කිසිම අයකිරීමක් නොකර හේලිස් සමාගම වෙතින් නොමිලේ අළුත්වැඩියා කරන ලදී. තව ද ආබාධිත රණවිරුවන් උදෙසා හේලිස් සමාගම වෙතින් අඟල් 14 "ඩේවරෝන්" වර්ගයේ



හොන්නන්තර, පිළියන්දල, විජයනන්දාරාම විහාරස්ථානයේ දී ආබාධිත රණවිරුවන් උදෙසා රෝද පුටු පරිත්‍යාග කිරීමේ උත්සවයට මුලිකත්වය දැරූ ක්වේවි රාජපයේ රාජකාරියන් හි නියැලී සිටින ධර්මසේන මහතාගේ බිරිද වන ධර්මසේන මහත්මිය විසින් මෙම ඒකකයේ ආබාධිත රණවිරුවෙකු වන ලාකෝ සරත් ඩබ්පී මහතා වෙත රෝද පටුවක් පරිත්‍යාග කරන අයුරු.

සංවිධානය කළ හොන්නන්තර පිළියන්දල විජයනන්දාරාමාධිපති හල්විටිගල යසස්සී හිමියන්ටත්, පැලැන්වත්ත සිංහ සමාජයේ සියළුම සාමාජිකයින්ටත් මෙම රෝද පුටු පරිත්‍යාග කිරීම සඳහා මූලිකව කටයුතු කර ඇති ක්වේට් රාජ්‍යයේ සේවයේ නියුතු එස්ආර්එම්ජ් ධර්මසේන මහතා ඇතුළු සියළුම ශ්‍රීලාංකිකයින්ටත් අපගේ භක්ති ප්‍රනාමය මෙසේ පුදකරන්නෙමු.

මහරාජා සංවිධානයේ එම් බහාර් මහතා සහ ජයන්ත මොන්නාකුලම මහතා ශ්‍රීලපාභ රණවිරුවන් වෙනුවෙන් රු. 20000/- ක මුදලක් රෙජිමූලයේ සේනාවිධායක වෙත පරිත්‍යාග කොට ඇති අතර, එම මුදල රෙජිමේන්තු මූලස්ථානයේ රෙජිමේන්තු ආයතන සභාපති ගිණුමේ තැන්පත් කර ඇත.



95/12/13 දින හොන්නන්තර, පිළියන්දල විජයනන්දාරාම විහාරස්ථානයේ දී ආබාධිත රණවිරුවන් උදෙසා රෝදපුටු පරිත්‍යාග කිරීමේ උත්සවයක් පැවැත්වුණි. එහි දී එම විහාරස්ථානයේ විහාරාධිපති හල්විටගල යසස්සි හිමියන් විසින් මෙම ඒකකයේ ආබාධිත රණවිරුවෙකු වන කෝප්‍රල් ජයන්ත ඩබ්පියු මහතා වෙත රෝද පුටුවක් පරිත්‍යාග කරන අයුරු.


රූපවාහිනී යන්ත්‍රයක් නොමිලේ ලබාදෙන ලද අතර, එකී පරිත්‍යාගයන් ලබාදීමට මූලිකව කටයුතු කළ හේලිස් සමාගමේ කළමණාකාරිනී ක්‍රිශාණි එදිරිවීර මහත්මියටත්, අළෙවිකරණ අංශයේ කළමණාකරු අනුදත්ත ඩයස් මහතාටත්, හේලිස් සමාගමේ විධායක නිලධාරී රුවන් සිංහබාහු මහතා ඇතුළු සේවක සේවිකා මහත්ම මහත්මීන්ට අපගේ ගෞරවය මෙසේ පුදකරන්නෙමු.

දැනට උතුරේ ත්‍රස්තවාදීන් සමග සටන් වදින විරෝධාර රණවිරුවෙකුගෙන් ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන් උදෙසා පරිත්‍යාග ලබාදීමට කටයුතු සංවිධානය කිරීම ඉතා විරලසිද්ධිමක් වනු ඇත. එවන් සිදුවීමක් පසුගිය ද වෙන්නප්පුව කටුනේරිය ප්‍රදේශයේ දී අති උත්සවාකාරයෙන් සිදුවිය. 1 ශ්‍රීලපාභ ඒකකයේ මේජර් ඩබ්ඩබ්එල්එස් ප්‍රනාන්දු, ආර්එස්පී ශ්‍රීලපාභගේ මග පෙන්වීම මත කටුනේරිය තරුණකැල හා ප්‍රදේශවාසීන් විසින් සංවිධානය කරන ලද ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවයක් 95.12.08 දින පැවැත්විය. එහි දී පීඩන බෝම්බයන්ට අසුව එක් පාදයක් අහිමි වූ පහත සඳහන් රණවිරුවන් දෙදෙනා හට කෘතිම පාද තනා ගැණීම වස් රු. 40000.00 ක චෙක්පත පතක් ප්‍රධානය කරන ලදී.

සෙ/303141 ලාකෝ මොහොට්ටි ජීඑස් 1 ශ්‍රීලපාභ, සෙ/ 302229 සාසෙ ජයදේව කේඑම්ජී 1 ශ්‍රීලපාභ

තව ද , මෙදිනම ආබාධිත රණවිරුවන් වෙනුවෙන් කොමඩ් වැසිකිලි 15 ක් ප්‍රධානය කරන ලද අතර, එම උත්සවය සංවිධානය කල මේජර් ඩබ්ඩබ් එල්එස් ප්‍රනාන්දු, ආර්එස්පී, ශ්‍රීලපාභ ටත්, වෙන්නප්පුව තරුණකැල හා ප්‍රදේශ වාසීන්ටත් අපගේ ප්‍රනාමය මෙසේ පුද කරන්නෙමු.

95.12.13 දින හොන්නන්තර - පිළියන්දල විජයා නන්දාරාම විහාර ස්ථානයේ දී ආබාධිත / මියගිය හා දැනට උතුරේ සටන් වදින රණවිරුවන්ට සෙත්පතා මහා බෝධිපූජා පිංකමක් රෝදපුටු පරිත්‍යාග කිරීමේ උත්සවයක් පැවැත්වුණි. එහිදී අපගේ ආබාධිත රණවිරුවන් 06 දෙනෙකු සඳහා රෝද පුටු 06 ක් ප්‍රධානය කෙරුණි. මෙම උත්සවය



රෙජිමේන්තු ආධාරක බළඇණිය ශ්‍රීලපාභ රණවිරුවන් උදෙසා හේලිස් සමාගම වෙතින් අඟල් 14 ඩේවූරෝන් වර්ගයේ රූවාහිනී යන්ත්‍රයක් පසුගියද හේලිස් සමාගමේ ප්‍රදර්ශනාගාරයේ දී එහි කළමනාකාරිනී ක්‍රිශාණි එදිරිවීර මහත්මිය සහ විධායක නිලධාරී රුවන් සිංහබාහු මහතාගේ සහභාගිත්වයෙන් පරිත්‍යාග කෙරුණු. මෙම ජායාරූපයෙන් දැක්වෙන්නේ එම පරිත්‍යාගය ආබාධිත රණවිරුවෙකු වන ලාකෝ කරුණාරත්න ඩබ්ඩී විසින් ලබාගන්නා අයුරුයි. මෙම ඒකකයේ සුභසාධක නිලධාරී කපිතාන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාභ පසෙකින් සිටී.

Compiled by Lt. Col DGS Balthazaar

## REMINISENCES OF AN OLD SOLDIER....

# "Dirty Marcus" Takes a Bath

By (late) Lieut. Col B J H Bahar. CLI

Whenever old soldiers get together on certain occasions, as for example on Remembrance Day, Annual General Meetings and so on, the old soldiers begin to reminisence. Sipping a drink after the day's business is over memories of yesteryear come flooding back. Listening to these old soldiers swapping yarns and the loud guffaws that greet some of these yarns, it dawns on me that the serious as well as the lighter side of army life during the war years and after would be of interest not only to the old soldiers but also to the new generation of soldiers and to persons yet unborn at the time the war ended.

I look back on my own years in the Army, and remember vividly the different characters I was associated with, colourful, breezy characters who did the most unusual and unconventional things and I feel the urge to let the present generation have glimpses of the sort of life we led in those old and far off days. Towering above all other characters in my memory is Sara, the most unconventional figure of them all.

In 1941 there were only two battalions of the Ceylon Light Infantry (CLI) the First Battalion of the CLI commanded by Lt. Col C. P. Jayawardena was stationed in Trincomalee, while the Second Battalion of the C.L.I. commanded by Lt. Col W G Mack was stationed in Colombo, with its Headquarters in Echelon Barracks.

After our training course as Young Officers was over we were posted to one of these two Battalions then billeted in a hutted camp at Ratmalana. My Company Commander was Major A Saravanamuttu, more popularly known as Sara, and to some as Thambirajah.

Sara was one of the most unforgettable characters I have ever met. Over six feet in height, and a wonderful cricketer, he is best remembered for his towering sixers. I remember one day he scored a hundred runs in about 35 minutes of hectic hitting at Havelock Park. I believe one of his sixers at Lords Cricket Ground was something of a record.

I used to hero-worship Sara, not for his prowess cricket alone, but also for the golden heart that lay within his rugged exterior, he reminded one of Victor Maclaglen, the rough, tough guy of the old Western films. Although a bachelor at the time I write about him he had a ready sympathy for the married man, and would often send them on leave at the expense of the bachelors.

One day I heard the most unusual sound coming from the Company Commander's office, it was the Company Commander who appeared to be seized by a paroxysm of laughter.

Haw, haw, haw! Ho, Ho, Ho! He, he hee! Bahar, come here! I want you to listen to this, Ho, Ho I wondered what this was all about, I had gone early to my table in the Company Office, and Sara who had come later was going through the mail.. I walked in to his office. Sara was holding a letter in his hand. As he saw me, he said, "Ho, ho, listen to this. This is a letter from Marcus;

'Dear, honoured father of the Company. As one of your sons in need of help, I appeal to you, honoured father. I have met a damsel who is the apple of my eye, and she and I have a wish to build a love nest together, and I have found a place in which to build our love nest, but there is only one hitch. The landlord wants an advance of rent..

You see what all this flowery language is leading up to, Bahar, Ho, Ho! He is angling for an advance of pay." Then he shouted 'Sergeant Major! Send Dirty Marcus here!"

Private Marcus, known as Dirty Marcus" was of middle age and had spend most of his life in Malaya as it then was, and had come to Ceylon just before the outbreak of the war had joined as a volunteer soldier in the Ceylon Light Infantry. Marcus himself was something of a character. He was a wonderful mimic. Apart from imitating the speech of his superior officers and the Sergeant - Major, he could make bird calls and animal noises with wonderful closeness to the sounds made by the birds and beasts themselves, he was also of fine wit, and would keep the company round him in fits of laughter. He got the name 'dirty Marcus" because he would never bathe, and also to distinguish him from Marcus, the despatch rider.

On one occasion when Marcus entered the Orderly Room, Sara sniffed and said, "Marcus, when did you last bathe?"

"Why sir, only the other day"" er I mean day before yesterday".

" I don't believe you" Sara interrupted.

"Quarter Master! he shouted in his stentorian voice. "Take this fellow and hold him under the shower with his clothes and all!" and the burly Company Quarter Master Sergeant, CQMS Batholomeuz, dragged the protesting Marcus to the showers in the camp and held him under the shower till he and his clothes were thoroughly soaked before releasing him. "Now apply some soap. You won't smell so badly then " The CQMS said in a mollifying.

Now to get back to Marcus and his appeal for help, I remembered asking Marcus not many weeks earlier why he had not married. His answer then had been : "Sir, why buy a cow when milk is cheap?" So I thought to myself that if this man had at least fallen in love and was fond to get married, I would plead on his behalf, But this was unnecessary. Sara had already made up his mind to give him an advance of pay. So when Marcus was marched in, Sara said "Adai! what is all this about?" Pointing to the letter, which Marcus had sent, Marcus remained silent and looked bashful.

"Okay, how much do you want?" And when Marcus named a figure Sara said: Quarter Master, see that Marcus gets this advance, but see that you recover it from his pay at the end of each month, or else I will deduct it from your pay!"

Sara was such a colourful character that life with him was always full of surprise. He was always doing the unexpected. The men held him in awe, but they loved him, too. Although he was blunt and forthright, and used strong army language, the men knew they would get a square deal from him. So, few of his men ever tried to hoodwink him.

L /Cpl (Temporary Unpaid) Lance Corporal) Dambadeniya was one of the few who tried to hoodwink him, and what happened to him is another story.

- CONCLUDED -

# The Difference

I got up early one morning
and rushed right into the day;
I had so much to accomplish
That I didn't have time to pray.

Problems just tumbled about me
and heavier came each task;
"Why doesn't Gof help me?" I wondered
He said, "But you didn't ask."

I wanted to see joy and beauty
but the day toiled on, grey and bleak;
I wondered why God didn't show me,
He said, "But you didn't seek."

I tried to come into God's presence'
I used all my keys at the lock.
God gently and lovingly chided
"My child, you didn't knock."

I woke up early this morning
and paused before entering the day.
I had so much to accomplish
That I had to take time to pray.

**SENT BY MRS. MENIK FERNANDO**
**(Wife of Major Kelum Fernando 4 SLLI)**


# "රිවිරැස" මෙහෙයුමත් සමග 4 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව

ශ්‍රී ලංකා ද්වීපයේ සාමයේ කිරුළුදම් පැළඳීම උදෙසා 1995.10.17 දින "රිවිරැස" මෙහෙයුම දියත් කෙරින. මෙය කුරිරු ත්‍රස්තවාදී සමූලඝාතනය කිරීමේ තීරණාත්මක අවස්ථාවකි. පාබල හමුදා රෙජමේන්තු පවුලේ හතරවැනි සාමාජිකයා වන අප ඒකකය ජනිත වූ අවධියේ එනම්, 1987 වකවානුවේ දී ඊළාම් යුද්ධය අති බිහිසුණු තත්වයක තිබුණු බැව් සඳහන් කිරීම අතිශයෝක්ති වර්ණනාවක් නොවනු ඇත. ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ ක්‍රියාකාරකම් වලට එරෙහිව එද - මෙදතුර ක්‍රියාත්මක වූ තීරණාත්මක මෙහෙයුම් වලින් 4 වෙනි ශ්‍රී ලංකා පාබල හමුදාව සහභාගී නොවූවක් ඇත්නම් එය ඉතා අල්ප ය. "වඩමාරච්චි මෙහෙයුම, මුහුදු සුළං 1, 2 බලවේගය 1, වාලම්පුරි ආදී ක්‍රියාන්විත ඊට සාක්ෂි දරයි. ඒ අනුව සෑම අතින්ම පරිපූර්ණ වූ හතර වෙනි බළ ඇණියේ රණවිරුවන්ට "රිවිරැස" මෙහෙයුමට ද සහභාගී වීමට ලද ඉඩ ප්‍රස්ථාව උදකරවීම භාග්‍යයක් සේ සැලකීම වඩාත් උචිත ය.

යුද හමුද මූලස්ථානයේ නිමේශයකින් ලද නියෝගය මත මුලතිව් ආරක්‍ෂක වලල්ලෙන් සමුගෙන 1995.10.28 වෙනි දින හෙලි ගුවන් යානා මගින් අප ඒකක හටපිරිස් යාපා පටුන තෙක් අවතීර්ණ වූහ. මෝසම් වර්ෂා සමය ආරම්භයත් සමගම ධාරානිපාත වර්ෂා මධ්‍යයේ මඩවගුරු තුලින් යාපා පටුනේ දකුණු දිසාවේ පොන්නාලෙයිකඩ්ඩුවාන් ප්‍රදේශයට 52 සේනාංකය යටතේ 523 බලසේනාවට අනුයුක්තව ස්ථානගතව "රිවිරැස" මෙහෙයුමේ මූලාරම්භ රාජකාරි කලේ ය.

හෝරා දින ගෙවී ගියේ ය. "රිවිරැස" යෝධ මෙහෙයුමට අප රණවිරුවන් සියල්ල දැන් සූදනම් ය. 1995.11.10 දින ආරම්භක පියසටහන් තබමින් අප ඒකක ඒ, බී, සී සහ ඩී කණ්ඩාම් ඇතුළු ආධාරක කණ්ඩාම උරුම්පිරායි ප්‍රදේශයේ සතුරු ඉලක්කවලට ප්‍රතිප්‍රහාර දෙමින් ක්‍රියාන්විතයේ පෙරමුණ ගන්නා ලදි. පලාලි - යාපනය ප්‍රධාන

DESIGN OF BATTLE




REF : MAP SHEET (1:50,000) JAFFNA


මාර්ගය කේන්ද්‍රකොට ගෙන ගත් මෙම ගමන්මාර්ගය වට තාප්ප, ගොඩනැගිලි වලින් ග්‍රහණ වූ අතර, ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාර ද ඉතා දරුණුව එල්ල වන්නට වූහ.


4 වෙනි බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඒකේඩීජේපී සිරිවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී, පීඑස්සී ශ්‍රීලපාහ ගේ මුහුකුරාගිය ක්‍රියාන්විත අත්දැකීම් හා ඥානාන්විත අධීක්ෂණය සහ මෙහෙයවීම යටතේ අප ඒකකය උරුම්පිරායි ප්‍රදේශය සතුකර ගැනීම එතරම් අපහසු කාර්යයක් නොවිය. 4 ශ්‍රීලපාහ විසින් අත්පත් කර ගත් මෙම ප්‍රදේශය ලෝකයේ පංච මහ බලවතුන් අතරින් හතර වෙනි හමුදාව වන ඉන්දීය හමුදාවට ද අත්පත් කර ගැනීමට දින 10 ක් ගත කර ඇත. ත්‍රස්තවාදීන්ගේ මෝටාර් වෙඩි ප්‍රහාර, අති නවීන ස්වයංක්‍රිය අවි වලින් ලත් ප්‍රහාරයන්ට අප ඒකක ආධාරක කණ්ඩායමේ නිවැරදි මෝටාර් වෙඩි ප්‍රහාර කාලතුවක්කු ප්‍රහාර සතුරු ඉලක්ක වලට පතිතවීමෙන් ත්‍රස්තවාදීන් පසු බැස යන ලදී. මෙම උදරතර මෙහෙය කරගෙන යෑමේ දී අප ඒකක රණවිරුවන් දෙදෙනකු දෑ අභිමානයෙන් යුතුව දිවි පිදූහ. උරුම්පිරායි ප්‍රදේශය අත්පත් කර ගැනීමේ සටනේ දී "බී" කණ්ඩායමේ එක් ඛණ්ඩයක් ත්‍රස්තවාදීන්ගේ දැඩි ප්‍රහාරයට හසුව තිබූ අතර, එම අවස්ථාවේ 2/ලුතිනන් ඩබ්පී ජයවීර ශ්‍රීලපාහගේ ඛණ්ඩයෙන් පැති ප්‍රහාරයක් ත්‍රස්තවාදීන්ට එල්ල කිරීමෙන් එම දරුණු ප්‍රහාරය මෙල්ල කොට මැදිවී සිටි ඛණ්ඩය බේරා ගැනීමට සමත් විය. මෙම සිද්ධියේ දී ඉහත නිලධාරී ඇතුළු තවත් සෙබලුන් 21 ක් තුවාල ලැබූ අතර, ඛණ්ඩයේ එල්එම්ජී අවියමනා ලෙස හැසිරවූ සෙ/13502 කෝප්‍රල් අබේසිරිවර්ධන වයිඑච් තම පුහුණුවීම් වලින් උපරිම ඵල නෙලා නොබියව දක්ෂ ලෙස තම කාර්යය ඉටු කරන ලදී. මොහු සමග එලෙස ක්‍රියා කල සෙනීන් අතරින් කැපී පෙනුන තවත් සෙනින් දෙදෙනෙකු ඊළඟ නිලයට ද උසස්වීම් ලබාදීම සඳහා අණදෙන නිලධාරීගේ අනුමැතිය ලබාදෙන ලදී. ඉහත සිතියමේ දක්වා ඇති පරිදි භටපිරිස් යොදවන ලදී.

1995.11.11 දිනසිට උරුම්පිරායි ප්‍රදේශය ආරක්ෂාව තහවුරු කිරීමේ කටයුතු සිදුකරන ලදී. රාත්‍රී කාලයේ දී ත්‍රස්තවාදීන්ගේ දැඩි ප්‍රහාර වලට නිදි නොමැතිව හදුරණ ලද පුහුණුවීම් ඉස්මතු කර මඩවගුරු තුළසිට අප ඒකකයට අයත් කලාපය ආරක්ෂා කරන ලද්දේ දැඩි චිත්ත ධෛර්යයකින් යුතු වය. මෙසේ ආරක්ෂක වලල්ල ආරක්ෂා කිරීමේ කටයුතු වල නියැලී සිටින අතර වාරයේ දීම ඊළඟ ක්‍රියාන්විත අධියරය සඳහා කණ්ඩායම් සූදනම් වන ලදී.

මෙම ප්‍රදේශය ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල බලකොටුවකි. අප බටයින් භට හමුවූ ත්‍රස්තවාදීන්ගේ ශක්තිමත් කොන්ක්‍රීට් හා රේල් පීලි උපයෝගී කරගෙන තනාගෙන තිබූ බංකර් පොලොව ගර්භයේ තනා තිබූ වායු සමීකරණ උපකරණවලින් සමන්විත සාකච්ඡා ශාලා සැලසුම් ආකෘති ඊට සාක්ෂි දරයි. මෙම ප්‍රදේශය යාපනය නගර සීමාවට ආසන්නව තිබූ අතර, සතුරු යුද අගල් සහ ප්‍රහාරවලට සහභාගී වන කොටි සාමාජිකයින් ගණන ද අති විශාල වුවත් ඊට සුදුසු පරිදි අප ඒකක සෙබලු ද ඊට ප්‍රතිප්‍රහාර එල්ල කරන ලද්දේ දැඩි ආත්මශක්තියක් තුලිනි.

එද - මෙද තුර නොවූ විරූ කාලතුවක්කු ප්‍රහාරයක් මෙම ක්‍රියාන්විතයේ දී උපයෝගී කරගත් අතර, ත්‍රස්තවාදී මෝටාර් ප්‍රහාරයන්






පීපී ප්‍රනාන්දු සහ අප බලසේනාධිපති වශයෙන් කර්නල් එල් රාජසිංහ ඩබ්ඩබ්වී ආර්එස්පී, පීඑස්සී ක්‍රියා කරන ලදී. පාබල බලසේනා වට 4 ශ්‍රීලපාහ, 6 ශ්‍රීලපාහ සහ 8 විපාරෙ ඇතුලත් විය. එහි දී ගුවන් ප්‍රහාරක (Air Mobile) බලසේනාව කෝපායි සිට නල්ලූර් දක්වාත් ස්වාධීන බලසේනාව නල්ලූර් සිට නුවර පාර දක්වාත්, පැමිණි අතර, ඉන් පසු නුවර පාරේ සිට කොලොම්පුතුරෙයි මුහුදු සීමාව දක්වා ගමන් ගැනීමට 532 බලසේනාවට පැවරුනි.

ද දැඩිව පැවතුනි. මෙම ප්‍රහාරය ඔස්සේ අප තුවාලලත් සෙබලුන් ආරක්ෂක ස්ථාන කරා උපක්‍රමිකශීලිව රැගෙන ඒමට සිදුවිය. මෙම ක්‍රියාන්විතයට අප ඒකක පාලන කණ්ඩාම ද රයිෆල් කණ්ඩාම් හා සමීප යුද පුහුණු අවධිකරමින් මෙම උදරතර මෙහෙවරෙහි යෙදුන හෙයින් "රිවිරැස" ක්‍රියාන්විතයට කැප වීමකින් "සේවය කරමි" යන ආදර්ශ පාඨය විදහා පෑමක් බැව් එමගින් පෙන්නුම් කරයි.

උරුම්පිරායි බලය තහවුරු කිරීම වලින් පසුව "රිවිරැස" ක්‍රියාන්විතයේ පළමු වන අධියරය 51 සේනාංකය හා 52 සේනාංකය විසින් සාර්ථකව අවසන් කරන ලදි. කෝපායි දකුණේ සිට යාපනය අල්ලා ගැනීම 53 සේනාංකයට භාරව තිබූ අතර, 1995.11.17 දින සිට අප ඒකකය 53 සේනාංකයට අතුලත් කරන ලදී. 53 සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේජේසී පෙරේරා ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,

යටතේ බලසේනාධිපතිවරුන් වන බ්‍රිගේඩියර් ආර්ඩබ්ඩබ්එම්එච්එන් හලංගොඩ, බ්‍රිගේඩියර්

යාපනය අල්ලා ගැනීමේ අවසාන අධියරය පැවරී තිබුණේ 4 ශ්‍රීලපාහ හා 8 විපාරෙ




රිවිරැස ක්‍රියාන්විතය සිදුවන අවස්ථාවේ යාපනය ප්‍රදේශයේ දමිළ වැසියන් සමග 4 ශ්‍රීලපාහ අ:නි: ලුති: කර්නල් ජ්කේඩීජේපී සිරිවර්ධන ආර්ඩබ්පී. ආර්එස්පී. පීඑස්සී. ප්‍රදේශයේ විස්තර විමසමින් සිටි අයුරු



රිවිරැස ක්‍රියාත්මකයේ දී තුවාල ලැබූ 4/ශ්‍රීලපාහ විරුවන් රෝහල වෙත රැගෙන යාමට සූදානම් කරන අවස්ථාවේ ගත් ඡායාරූපයකි. (1995.10.17 දින සිට 1985.12.07 දින දක්වා "රිවිරැස" ක්‍රියාත්මකය)

දිනය වන 1995 නොවැම්බර් 26 දින ක්‍රියාත්මකය 532 බලසේනාව විසින් දියත් කළ යුතුව තිබූ අතර, ඒ සඳහා 4 ශ්‍රීලපාහ සහ 6 ශ්‍රීලපාහ ඉදිරියෙනුත් 8 විජාරෙ හා 1 කරෙ පැති ආරක්ෂාව යොදවන ලදී. එහිදී 1995.11.26 දින උදෑසන 0600 පැයට කාලතුවක්කු හමුදාවේ ද සහයෝගය ඇතිව තත් ක්‍රියාත්මකය ආරම්භකරන ලදී. 4 ශ්‍රීලපාහ හා 6 ශ්‍රීලපාහ යන ඒකක දෙකම කණ්ඩාම් දෙක බැගින් ඉදිරියට කණ්ඩායම් දෙකක් ද අමතර කණ්ඩායම් දෙක බැගින් ද යොදවා උදෑසනින් ම ආරම්භ වූ මෙම ක්‍රියාත්මකය මීටර් 150 ක් පමණ ඉදිරියට ඇදීමෙන් පසු ත්‍රස්තයන්ගේ ඝනා ලෙස සකස් කරන ලද බංකර් පෙළකට අප බලඇණි දෙකම මුහුණ දෙන ලදී. එහිදී 1000 පැයේ සිට දිගටම ත්‍රස්තයන් හා අප සෙබලුන් එක දිගටම මුහුණට මුහුණ ලා දරුණු සටනක යෙදෙන ලදී. එහෙත් ඒකකයන්ට බැවින් මෙම ඒකක දෙක ඉදිරියෙනුත් 6 ශ්‍රීලපාහ, 6 ගජබා ඒකකයන් පැති ආරක්ෂාව සපයන ලදී. උදේ 1000 පැයට පමණ ක්‍රියාත්මකය ආරම්භ කළ අතර, ත්‍රස්තයන්ගේ වෙඩි වරුසා හා මර උගුල් මැද අප බලඇණිය සහ 8 විජාරෙ ක්‍රමක්‍රමයෙන් කොලොම්පුතුරෙයි බලා ඇදෙන ලදී. එදින 1530 පැයට පමණ වන විට අප බලඇණිය යාපනය කලපුවේ මුහුදු තීරය සිප ගන්නා ලදී. එහිදී අප ඒකක සෙබලුන් දෙදෙනෙක් මෙලොවින් සමුගත් අතර, සෙනින් 24 දෙනෙකු තුවාල ලැබිය. එදින සිට නැවතත් කොලොම්පුතුරෙයි ප්‍රදේශයේ බලය තහවුරු කර ගන්නා ලදී. මෙම ක්‍රියාත්මකයේ දී හටපිරිස් යෙදවූ අයුරු ඇතුළත් සිතියම් වාර්තාවක් 16 පිටුවේ සටහන්ව ඇත. ඒ සමගම ඊළඟ ක්‍රියාත්මක අධියරයට සූදානම් විය. එහිදී ප්‍රභාකරන්ගේ උපන් දිනය නොවැම්බර් 26 දිනත් වීර දිනය යනුවෙන් නොවැම්බර් 27 දිනටත් යෙදී තිබූ බැවින් ශ්‍රී ලංකා හමුද වලට යාපනයට ඇතුළු වීමට ඉඩ නොදෙමියි යනුවෙන් වහසි බස් කොටින්ගේ ගුවන් විදුලි යන්ත්‍ර වලින් ඇසෙන්නට විය. එහෙත් අප හමුදාවෝ මෙතෙක් ලද පන්නරය නිසා එම වහසි බස් ත්‍රස්තයන් මරු විකල්ලෙන් දොඩවන ඒවා බව හොඳාකාරව අවබෝධ කර ගෙන සිටින ලදහ. ඒ අනුව යුද හමුදාව ප්‍රභාකරන් ගේ උපන් දිනයේ දී නැවත යාපනයට ඇතුළුවීමට කරන ක්‍රියාත්මකයන් ආරම්භ කරන ලදී. ප්‍රභාකරන් ගේ උපන්



රිවිරැස ක්‍රියාත්මකයේ විරාමයක් ලද අවස්ථාවක දී සෙබළුන් සිටි අයුරු කැමරා ඇසට දිස් වූ අයුරු

# ක්‍රියාන්විත සටහන්

එම ප්‍රදේශය විශාල ගොඩනැගිලි පැවැති හෙයින් ඉතා කුඩා මාර්ග වලින් පමණක් ඉදිරියට ඇදීමට උත්සාහ ගැනීමේ දී ත්‍රස්තවාදීන් එම ස්ථානවලට ද දිගටම වෙඩි තබන්නට පටන් ගත්හ. මේ අතර වාරයේ ඒකකයේ තුවාල වූ අය හා මියගියවුන් පිටුපසට ගෙන එන ලදී. 1400 පැය පමණ වන විට සන්නාහ සන්නද්ධ රථ වලින් පවා ප්‍රහාර එල්ල කරන ලදී. එසේ එම ප්‍රදේශයේ තිබුනු ගොඩනැගිලි ත්‍රස්ථවාදීන් එම බංකර් මනා ලෙස තනා තිබූ බැවින් අප විසින් එල්ල කරන ලද ප්‍රහාර වලින් ඒවා බිඳ හෙලීමට නොහැකි විය. මෙම බලගතු ප්‍රදේශය නල්ලූර් වන අතර, එම ප්‍රදේශයේ දී ඇති වූ සටන් අතර අප ඒකකය මුහුණ දුන් බැරෑරුම් අවස්ථාවක් නම් "බී" කණ්ඩාමට විශාල වශයෙන් තර්ජනයක් එල්ල විය. මියගිය අයගේ මෘතදේශ පසුපසට ගැනීමේ දී ත්‍රස්තවාදීන් සැහවී කළ ප්‍රහාර නිසා ඊට බාධාවක් ඇති විය. මියගිය තිදෙනෙකුගේ මළ සිරුරු ආරක්ෂක ස්ථාන කරා රැගෙන ඒමට කිසිසේත් නොහැකි වූ නිසා සවස් වන තුරුම සටන් කිරීමට සිදුවිය. මෙහි දී පහත නම් සඳහන් රණවිරුවන් ඉදිරිපත් වෙමින් සිය කැමැත්තෙන් ජීවිත පරිත්‍යාගශීලීව ඉදිරියට ගොස් සතුරන් මුළා කරමින් තම සහෝදර සෙබලුන්ගේ මෘත දේහ ආරක්ෂක ස්ථාන කරා ගෙන එන ලදී.

සෙ/13090 සැරයන් රත්නායක පිකේඑන්, සෙ/14867 කෝප්‍රල් කුලතුංග කේඑම්, සෙ/301073 කෝප්‍රල් මූනසිංහ ආර්එම්එස්එල්කේ සෙ/301054 කෝප්‍රල් දයානන්ද ටීඑම්, සෙ/304279 ලාකෝ හේමතිලක ඩීඑම්, සෙ/303959 ලාකෝ හේරත් ටීඑම්එස් සෙ/305674 සාසේ චමින්ද ඩබ්පිපි

මෙම විරෝධාර සෙබලුන් හය දෙනා තම කාර්යභාරය මැනවින් ඉටු කරන ලද්දේ ඒකකයේ අනෙකුත් සෙබලුන්ගේ චිත්ත අභ්‍යන්තරයේ සුවිශේෂ ආදර්ශයක් සනිටුහන් කරමිනි. එම මළ සිරුරු ගිනි ගැනීම් වලට ලක්ව තිබීම නිසා පිළිස්සී අධික දුගඳ ද නොතකා උපක්‍රමශීලීව ඔවුන් කල කාර්යය පිළිබඳව අණදෙන නිලධාරි ගේ ද විශේෂ පැසසුමට ලක්ව පහත නම සඳහන් කොනොනි ඊළඟ නිලයට උසස් කිරීම සඳහා කටයුතු සිදු කරන ලදි.

සෙ/14867 කෝප්‍රල් කුලතුංග කේඑම්,

මේ වන විට ත්‍රස්තවාදීන්ට ද විශාල වශයෙන් හානි සිදුවිය. එහෙත් සවස් වන විට එම ස්ථානයෙන් ඉදිරියට යෑමේ අදහස අත්හරින ලදී. මෙම ක්‍රියාන්විතයේදී අප ඒකකයේ නිලධාරීන් දෙදෙනකු ඇතුළුව සෙනින් 09 දෙනෙකු මියගිය අතර, නිලධාරී 02 ක් සමග සෙනින් 31 දෙදෙනකුට තුවාල සිදුවිය. ත්‍රස්තවාදීන්ගේ දැඩි ප්‍රහාර හේතුවෙන් යාපනයට ඇතුළු වන ගමන් මාර්ගය වෙනස් කරමින් මහනුවර මාර්ගයට කි.මී. එකක් පමණ උතුරු දෙසින් උක්ත ක්‍රියාන්විතය නැවත ආරම්භ කරන ලදී. එහි දී 6 ශ්‍රීලපාහ හා 8 විපාරෙ ඉදිරියෙනුත් 1 කරෙ හා 7 ගැහේබ පැති ආරක්ෂාව සපයන ලදී. එහිදී උප ඒකකය පෙර සිටි ස්ථානයෙන්ම ඉදිරියට ඇදෙමින් ත්‍රස්තයන් නොමග යැවීමේ අරමුණින් දැඩි ප්‍රහාර එල්ල කරමින් මෙහෙයුමක් ආරම්භකරන ලදී. මෙම ක්‍රියාන්විතයේ දී හටපිරිස් යෙදවීම පිළිබඳ සිතියම් වාර්ථාව 28 වන පිටුවේ සටහන්ව ඇත.

එම හේතුවෙන් උතුරු දෙසින් ගමන් ගත් බලසේනාව ත්‍රස්තයන්ගේ තර්ජන නොමැතිව ඉදිරියට ගමන් ගන්නා ලදී. 1000 පැයට පමණ අප ඒකකය නොමග යැවීමේ ක්‍රියාන්විතය නවත්වන ලදී. එහිදී එක් සෙබලෙකු මියගිය අතර, සෙබලුන් හතර දෙනෙකු හට තුවාල සිදුවිය. නැවතත් අප ඒකකය උතුරු දෙසින් ගමන් කර 1 කරෙ ඒකකය මුදවා පැති ආරක්ෂාව අප ඒකකය විසින් සපයන ලදී. එදින 1600 පැය පමණ වනවිට අප ක්‍රියාන්විතය සම්පූර්ණයෙන් අවසන් කරන ලදී. පසුදින සිට එම ප්‍රදේශය බලය තහවුරු කර ගන්නා ලද අතර, නැවතත් ක්ෂණික විහිදුම් බලසේනාව කන්කනස්තුරේ මාර්ගයේ කොටුව දෙසටත් ස්වාධීන බලසේනාව කොලොම්පුතුරෙයි දෙසින් යාපනය ජැටිය දෙසටත් පැමිණීමෙන් අනතුරුව 1995.12.02 දින නැවත යාපනය නගරය දක්වා ප්‍රදේශය පරීක්ෂා කරමින් අප ඒකකය සහ 8 විපාරෙ ඒකකය ඉදිරියට ගමන් ගන්නා ලදී. එදින මුහුදු තීරය දිගේ ස්ථානගත වූන අතර දැනට අප ඒකකය යාපනය කොටුව ගුරුනගර් මණ්ඩතිව් සිට අරාලි දෙසට යන මාර්ගයේ කි.මී. එක හමාරක් පමණ අරාලි දෙසට ස්ථානගත කර රාජකාරියේ යොදවා ඇත.

මෙම ක්‍රියාන්විතය අති බිහිසුණු අත්දැකීම් තුලින් 1995 දෙසැම්බර් 05 දින වන විට අනභිබවනීය ඓතිහාසික ජයග්‍රහණයේ මල්ඵල ගන්වා ඕලන්ද බලකොටුව අභියස ගරු නියෝජ්‍ය ආරක්ෂක ඇමති කර්නල් අනුරුද්ධ රත්වත්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාන්විත මෙහෙයුම් අණදෙන නිලධාරීන් කැටුව ජාතික ධජය ඔසවද්දී 4 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ සියළුම රණවිරුවන් නියෝජනය කරමින් ඒකක අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඒකේඩීජේ පී සිරිවර්ධන ආර්ඩබ්පි, ආර්එස්පි, පීඑස්සී ශ්‍රීලපාහ ද නීල වර්ණ ඒකක ධජය එසවීමේ උදුරතර අවස්ථාවට සහභාගී වීමෙන් ඒකකයට තවත් අමරණීය අවස්ථාවක් උද කර ගන්නා ලදී.

මෙම ඓතිහාසික දිනය උදකර ගැනීම උදෙසා 4 වෙනි ශ්‍රී ලංකා පාබල හමුදවේ රණවිරුවන් 1995.10.28 දින සිට 1995.12.07 දින දක්වා කාලය තුළ දී "රිවිරැස" මෙහෙයුමේ යෙදී සිටියෙදී පහත නම් සඳහන් නිලධාරීන් හා සෙසුනිලයින් ජාතියේ උත්තරීතර ප්‍රණාමය හිමි කර ගනිමින් අප අතරින් සදහටම සමුගත් අතර, එක් සෙබලෙකු අතුරුදහන් විය. තවත් සෙබලුන් 95 දෙදෙනකු තුවාල ලැබූහ.

නි/62558 2/ලුති එන්එන්ජ්පි කුරේ ශ්‍රීලපාහ - 95.11.26, නි/62599 2/ලුති ජ්ජ් විතාන ශ්‍රීලපාහ -95.11.26, සෙ/302596 ලාකෝ බණ්ඩාර ආර්එම එස් - 95.11.10, සෙ/301843 සාසෙ ශාන්ත කුමාර ඩබ් - 95.11.10, සෙ/307190 සාසෙ කුමාර ආර්සී - 95.11.22, සෙ/305666 සාසෙ විරරත්න පීඑල් - 95.11.22, සෙ/102953 ආසෙ විජේසිං කේපි - 95.11.24, සෙ/301080 ලාකෝ සේනාරත්න එස්ජ්එස් - 95.11.26, සෙ/302739 ලාකෝ ප්‍රේමකුමාර ඩීඑම්ජ් - 95.11.26, සෙ/302369 ලාකෝ රත්නායක ආර්එම්ඩබ්එන් - 95,11.26, සෙ/303381 ලාකෝ පුෂ්පකුමාර ජ්ජ් - 95.11.26, සෙ/305618 සාසෙ ඒකනායක එස්පි - 95.11.26, සෙ/300614 කෝප්‍රල් ජයසිංහ එන්එච් - 95.11.26, සෙ/307203 සාසෙ ලාල්කුමාර පිඩීඑස් - 95.11.26, සෙ/304289 ලාකෝ ප්‍රේමචන්ද්‍ර ආර්එම්ජී - 95.11.26, සෙ/302494 ලාකෝ බණ්ඩාරනාක ජ්පිඑන්පිජී -95.11.27, සෙ/305740 සාසෙ සුසන්තලාල් එල්ජ් - 95.12.05, සෙ/15404 සාසෙ රණතුංග යූ - 95.12.07,

අතුරුදහන්:-

සෙ/307188 සාසෙ රුද්‍රිගෝ ආර්එම්සී - 95.11.26

"රිවිරැස ක්‍රියාන්විතය මුළු මහත් ජාතියටම සාමය උදකර දීමේ ක්‍රියාදාමයක් වූ අතර, 4 වෙනි ශ්‍රී ලංකා පාබල හමුද රණවිරුවන්ට අද්විතීය අත්දැකීම් සම්භාරයක් උරුමකර දුන් අමරණීය සිහිවටනයෙකි."


හමුදව


සකස් කලේ

**මේජර් එස්ජ්එන්බී ඇහැලමල්පේ**

ශ්‍රීලපාහ

2 වන අණදෙන නිලධාරි

4 වෙනි බලඇණිය ශ්‍රී ලංකා පාබල




සැකසුම:
**කපිතාන් ඩීඑම් විජේරත්න ශ්‍රීලපාහ**

හිතවත් පාඨකය !

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් "තල් අරඹේ සිට" වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, "තල් අරඹේ සිට", වයිට් හැකල් සහරාව, රෙම ශ්‍රීලපාහ, හමුද ජනපදය, පනාගොඩ

## ඊළම

රැකගනු පිණිස ලක් මැණිය සතුරාගෙන්
ජීවිතේ වුනත් පුදනෙමි අප අභිමානෙන්
උතුරේ කොටින් ගෙන යන බොරු රගපෑමෙන්
මිනිසත් කමත් ගිලිහී ඇත බලකාමෙන්

ලොවක් තතන්නට තුඹලාට වෙන් කෙරුණ
නිමක් නොමැති තොප ගෙනියන කොටි සටන
සපක් කරන්නට එක් අයෙකුගේ වචන
කුමක් සඳහාද ජීවිත බිලි රැගෙන

ජීවත් වන්නට නම් මිනිසුනි ලොව සාමෙන්
ඊළම අත් හරිනු මතු පරපුර නාමෙන්
අස්වනු නෙළිය හැකි වෙද වියලුනු හේනෙන්
යහපත් පුතුන් උපදිද යුද ඇති කාලෙන්

උතුරේ දමිළයින් දකුණට යමල්ලා
ඊළම අතැර යුධ අවි බිම තියල්ලා
භේදය කරන කොටි සේරම මරල්ලා
සාමයේ පරවියනි උතුරට වරෙල්ලා

**සෙ/ 302479 සා/සෙ ශාන්ත ජ්එස්**
**පසුමූලය. ශ්‍රීලපාහ බූස්ස**

## "ශාපලත් යුද්ධය"

දිවාකල දිනකර කිරණින්
ගිනිගෙන දැවෙන දේශය
පුරා.........
නිශාමයේ වුවත් සිසිලක්
නැ.....
දිවා රැ දෙකෙහිම
බුර බුරා දලුලන්නෙ
ශාපලත් යුද්ධයේ ගිනි දළුයි
කර්කශ වූ උතුරු කරේ
දකින්නට නැ දිය බිඳුතක්
ගලා බසින්නේ රුධිර ගංගා ය.....
ගිමන් නිවා ගන්නට
යුව් බිම තියන්නට
අපේ රණවිරුවන් හට
ලැබෙන්නෙ නැ විරාමයක්
කෙලවරක් දකින්නට නැත....
ශාපලත් කුරිරු යුද්ධයේ
නුඹ නිසා....

**2/ලුති එල්එච්සිආර් සිරිවර්ධන. ශ්‍රීලපාහ**
**7 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම කෝපායි - යාපනය**

## "අම්මාට !"

තුන්මසක් ගත උවුත් හෙට පායන හිරු
නොහෙලම් සුසුම් මං ගෙතේ කත්කළු පුවත..
ඔබ නොදුටුවට.. සංග්‍රාමයේ පැතුම...
මද්දහනෙ ගිනි අව්ව වසර ගණනාවක් සිතු
රැයේ පිණි සීතල,, සිංහ කොඩි ඔසවන්න..
දරමි තව ටික දිනක් මව් බිම බේරගෙන
මව් බිමේ සාමයට එහෙත් ඉවසන් අම්මෙ...
බිඳිමි සතුරන් බල... ළඟදී මා ගෙදර එමි..
සෙබළ සොයුරන් එක්ව.. සාමයේ පරවියන් සමග....

**සෙ/305211 සාසේ සමරකෝන් ටීකේබී**
**10 ශ්‍රීලපාහ - මාදගල් පලාලි**

## "රණ විරුවන්ට උපහාර"

ලක් මව් දෙරණ සතුරන්ගෙන් රැකගන්න
ඔබ කරන මෙහෙය අගයනු කෙලෙසින්නැතුරු
කරේ ජයගෝසා පතුරා ලන්න
හකිවුණු බව සිතන්නේ අභිමානයෙන

සිංහල ධජය ලෙලසෙයි දැන් උතුරෙ කරේ
ඉන් පෙන්වන්නේ සෙබලුන් ඔබෙ වීර බලේ
නැගෙනහිරත් ජයගන්නට සෙබලුන්නේ
පතමි ඔබ සැමට සැම දෙවි රැක වරනේ

නැගෙනහිරත් ජය ගන්නට හැකිවේවා
ලක් මව් දෙරණේ එක්සත් කම රැක දේවා
සෙබලුන් සැමට දීර්ගායුෂ හිමි වේවා
දිවි දුන් සෙබලුන්ට නිවනම අත්වේවා

**නිර්මාණය සෙ/305340.**
**සාසෙ ගුණරත්න ඩබ්ලිව්එම්.**
**1 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම පලාලි**

## ඔබට සවිය මම වෙමි අම්මේ

විය වියකුණු සැදැ දිවියේ ඔබව දන් අම්මේ
මගේ දැනම සැරයටිය වී සවිය දෙමි අම්මේ
මගේ දිවියේ පහන් සිල ඔබ තමයි අම්මේ
දිවිය ඇති තුරු ඔබ ළඟින් මම තිබද ඉමි අම්මේ

**සෙ/302447**
**ලාකෝ විරසිංහ එස්**
**10 ශ්‍රීලපාහ පාලන කණ්ඩායම මාදගල් - පලාලි**

# HOUSES
# DISAB


## A Welfare Project

ඉදිරිපත
කපිතන් අයිජ්ආර්ජ් 
කපිතන් (උපා)අයිකේ




## පිටිපත

මියගිය සෙ/11591 සැරයන් ප්‍රේමරත්න ඩබ්ජ් - 6 ශ්‍රීලපාහ වෙනුවෙන් ඔහුගේ බිරිඳ සහ දරුවන් වෙනුවෙන් ඉදිවෙන නිවස



## මාවතැල්ල

මියගිය සෙ/22562 ලාකෝ සරත් බාලසූරිය යූබීජ් - 2 (සෙවි) ශ්‍රීලපාහ වෙනුවෙන් ඔහුගේ දෙමව්පියන් වෙනුවෙන් ඉදිවෙන නිවස



## බලන

ආබාධිත සෙ/300205 සායෙ ගුණරත්න අයිජ්එල්පි - 6 ශ්‍රීලපාහ වෙනුවෙන් ඉදිවෙන නිවස

# FOR SLLI
# LED.....

## now in progress.

ත් කිරීම
බෝගොවත්ත ශ්‍රීලපාහ
ෂු දයානත් ද ශ්‍රීලපාහ



හෝකන්දර

ආබාධිත සෙ/15587 සායේ වල්පිටගමගේ ඩබ්පීජ් - 1 ශ්‍රීලපාහ වෙනුවෙන් ඉදිවෙන නිවස



වැලිවේරිය

මියගිය සෙ/22824 ලාකෝ ඩයස් එම්එස්එස් - 2 (සෙවි) ශ්‍රීලපාහ වෙනුවෙන් ඔහුගේ දෙමව්පියන් වෙනුවෙන් ඉදිවෙන නිවස

දෙහිවල

මියගිය සෙ/21144 ලාකෝ සුතිල් ඩබ්ජ් - 2 (සෙවි) ශ්‍රීලපාහ වෙනුවෙන් ඔහුගේ දෙමව්පියන් වෙනුවෙන් ඉදිවෙන නිවස



1 වෙනි බල ඇණිය ලංකා පාබල හමුදාවේ සියළුම නිලයින් වෙත.

# ශ්‍රී ලංකා පාබල හමුද - නිත්‍ය බලසේනා 1 වන බලඇණියේ ඉතිහාසය - 1949 සිට 1975 දක්වා

පසුගිය කලාපය හා බැඳේ

**මේජර් ජනරාල් එච්වී අතුකෝරල (විශ්‍රාමික) විසින් බලඇණි ඉතිහාස පොතට තොරතුරු සපයා ඇත.**

**ලුතිනන් කර්නල් ජේජ්පි රසල්. පේ එස්එස්සී. පිඑස්සී. එක්සත් රාජධානි මහ කොමසාරිස් කාර්යාලයේ හිටපු ආරක්ෂක උපදේශක**

ශ්‍රී ලංකාවේ ගත කල කෙටි කාලය තුල දී ගතකල ප්‍රීතිමත් අවස්ථාවන් හා දැනහැඳින ගත් මිතුරන් රාශියකගේ තොරතුරු එහි අඩංගු හෙයින් ඉතාමත් ආශාවෙන් යුතුව මම එය කියවමි. මෙම පොත ඉතාමත් දැකුම්කලු අන්දමින් පිලියෙළ වී ඇති අතර ඉන් පිටපතක් ලැබීම ගරුත්වයක් සේ සලකමි.

**කොමාන්ඩර් ආර්එල් සිගර් එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක**

මෙම මාහැඟි ග්‍රන්ථය කියවීමෙන් ඉමහත් සතුටට හා ප්‍රබෝධයට පත්වීමි. ඉදිරියේදීත්, ලංකා පාබල හමුදවේ කටයුතු, එහි ප්‍රථම විසිපස් වසර මෙන් සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි පතමි.

**ජ්එච් ද සිල්වා මහත්මිය. බලඇණියේ ප්‍රථම උපකරණ පාලකව සිටි නැසීගිය කපිතන් (උපා) ජ්එච් ද සිල්වාගේ භාර්යාව**

මෙම පොත කියවීමෙන් බලඇණිය නගාසිටුවීමේ පුරෝගාමියෙකු වූ මගේ නැසීගිය සැමියාත්, මමත් ඉතා කිට්ටුවෙන් ඇසුරු කල බලඇණියක අතීත සිදුවීම් මතකයට නැංවීම නිසා ඉමහත් ශෝකයට පත්වීමි. මගේ හදවතට ඉතාමත් සමීපව පවතින මෙම සිහිවටන මා සද සුරකිමි. ඔබේ රෙජිමේන්තුව, හැම සංග්‍රාමික කටයුත්තකම සම්ප්‍රදයන් හා ජයග්‍රහණයන් අතින් ඉතා උසස් තත්වයක් හිමි කරගන්නා බව නොකිවමනා ය.

**රාති රේමන්ඩ් මහත්මිය. නැසීගිය මේජර් ජ්ඩි රේමන්ඩ් ශ්‍රීලපාහ ගේ භාර්යාව**

ඔබ විසින් එවනු ලැබූ ලංකා පාබල හමුදවේ ඉතිහාසය පිළිබඳ පුස්තකය වෙනුවෙන් මගේ ස්තූතිය පිලිගන්න. මගේ නැසීගිය සැමියාට කරන ලද ගෞරවයක් වශයෙන් එය මා පිලිගන්නා අතර සද සුරැකිව තබා ගනිමි.

*** කර්නල් ඩී අළුවිහාරේ. ශ්‍රීලපාහ (උපසේවය). හිටපු ස්වේච්ඡා බලසේනා පරීක්ෂක**

තොරතුරු සෙවීමට සැළකිය යුතු කාලයක් හා පරිශ්‍රමයක් දරමින් මාහැඟි කෘත්‍යයක් බිහිකරලීම ගැන මම ඔබට ප්‍රශංසා කරමි.

*** කර්නල් එස්ඩී රත්වත්තතේ (විශ්‍රාමලත්) හිටපු ලංකා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක කෙනෙකු**

අතීත සිදුවීම් සිහියට නංවන මෙම ග්‍රන්ථය ඉතාමත් නිවැරදි තොරතුරු ඇතුළත් සේම ආශාවෙන් ද කියවිය හැකි එකකි.

*** කර්නල් බී එල් සෙනෙවිරත්න. එම්බීඊ ඊඩී (විශ්‍රාමලත්)**

ඕනෑම වටිනා පුස්තකාලයක තැන්පත් කළ හැකි මෙන්ම රෙජිමේන්තුවේ පරම්පරාගත චාරිත්‍රවිධි වලට අනුකූලව මෙම මාහැඟි කෘත්‍යය පිළියෙල කිරීම ගැන ඔබටත්, එයට සහාය වුනු හැමටත්, මගේ උණුසුම් සුභ පැතුම් පිරිනමනු කැමැත්තෙමි.

*** කර්නල් සී තුඟවෙල (විශ්‍රාමලත්). හිටපු අණදෙන නිලධාරී 2 (සෙව්) ශ්‍රීලපාහ හා පරීක්ෂක ලසෙවබ**

අතීත සිදුවීම් සිහියට නංවන ආශාවෙන් කියවිය හැකි මෙම ග්‍රන්ථය මා කෙරෙහි රෙජිමේන්තුවට ඇති ඇල්ම නොනැසී පැවතීමට බෙහෙවින් ඉවහල් වනු ඇත.

**දොස්තර ඩබ්ලිව්. එච්. ප්‍රනාන්දු. එම්බිබීඑස් (ලංකා). එෆ්ආර්සීඑස් (එංග). එෆ්ආර්සීඕජ්**

සවිස්තරව පිලියෙළ වූ මනහර ග්‍රන්ථයකි

**කර්නල් එල්එම් වික්‍රමසූරිය (විශ්‍රාමලත්). දියතලාවේ හිටපු ආරක්ෂක සේනා ආඥාපති හා යුහඅම සේනාවිධායක**

මෙවැනි උසස් කෘත්‍යයක් මා වෙත ප්‍රදනය කිරීම ගැන ඇත්ත වශයෙන්ම උද්දමයට පත්වීමි. එය කියවා අවසන් කරන තුරු මට ඉස්පාසුවක් නොමැත. කොතරම් අගනා ප්‍රබන්ධයක් ද?

**ලුතිනන් කර්නල් එම් මඩවල. ගැහේබ. අණදෙන නිලධාරී ශ්‍රීලයු පො හේ බ**

මෙවැනි මනහර කෘත්‍යයක් පළකිරීම ගැන ඔබටත්, ඊට සහාය වුනු හැමටත් ස්තූතිවන්ත විය යුතු වේ. පොත පළ කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ දී දරන්නට වූ වෙහෙස මහන්සිය ගැන මෙයින් කෙනෙකුට මැනවින් අවබෝධ වන අතර මෙවැනි භාරදූර කාර්‍යයක් ඉටුකරලීම ගැන ඔබට සාධාරණ අභිමානයක් උපදිනු ඇත.

**ලුතිනන් කර්නල් එම් ටී ගුණසේකර. ලකාභ. යුද්ධ හමුද ක්‍රීඩා භාර නිලධාරී**

එය ඉතාමත් සම්පූර්ණ ඓතිහාසික ග්‍රන්ථයකි

මේජර් ජෙනරාල් එච්වී අතුකෝරාල (විශ්‍රාමික) විසින් බලඇණි ඉතිහාස පොතට තොරතුරු සපයා ඇත.

අවුරුදු 25 ක් තුළ ඒකකයේ තොරතුරුත්, එහි ජයග්‍රහණයන් හා ප්‍රගතියත් එයින් මොනවට පැහැදිලි වේ. මෙය මා සැමද අගය කරමි. මගේ නිවසේ පුස්ථකාලයේ එයට හිමිව ඇත්තේ උසස් ස්ථානයකි.

*** ලුතිනන් කර්නල් ඩීජ් ද සිල්වා. ලයුසේබ. අණදෙන නිලධාරී ලයුපුබ**

ලංකා පාබල හමුදවේ 1949 සිට 1975 දක්වා ඉතිහාසය අඩංගු සර්ව සම්පූර්ණ විලසින්ම නිමවුනු පුස්ථකයක පිටපතක් මා වෙත පිරිනැමීම ගැන ඔබටත්, ලංකා පාබල හමුදවේ සියළු නිලයින්ටත් මගේ අවංක ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි.

**ලුතිනන් කර්නල් එස්ඩීඑන් හපුගල පිඑස්සී ලසසබ (විශ්‍රාමලත්)**

පොත ලැබුනු වහාම එය කියවීමට පටන් ගත් අතර, ඉතාමත් සවිස්තරව පිලියෙළ වී ඇති ස්වභාවය ගැන උද්දමයට පත්වීමි. මැනවින් පිලියෙළ වී ඇති ඓතිහාසික ග්‍රන්ථයක් බව කිවයුතු ය.

අද දක්වාම පවත්වාගෙන ආ උසස් තත්වයන්, සම්ප්‍රදයන් හා මාහැඟි සෙබල ලීලාව ගැන ඔබටත්, බලඇණියේ සියළු නිලයින්ටත් ප්‍රශංසා පිරිනමනු කැමැත්තෙමි.

*** ලුතිනන් කර්නල් (උපා) එල්ජ් පෙරේරා ලයුසේබ (විශ්‍රාමලත්)**

1949 කොළඹ එච්ලන් බැරැක්කයේ දී බලඇණිය මුලින්ම පිහිට වූද පටන් ම ඒ සමග ජීවත් වූ කෙනෙකු වශයෙන් මට කිවයුතුව ඇත්තේ වසර විසිපහක් තුළ බලඇණියේ සිදුවීම් කිසිවක් අත්හැර නැතිව සියල්ලම මෙහි අන්තර්ගත වී ඇති බවයි.

*** ලුතිනන් කර්නල් ජ්. ඩබ්ලිව් තම්බිරාජා. ශ්‍රීලපාහ. අණදෙන නිලධාරී 1 ගැහේබ**

මහනර කෘතියක් වෙනුවෙන් මගේ සුභපැතුම් පිලිගන්න සත්‍ය තොරතුරු අඩංගු මතභේදයන්ට තුඩු නොදෙන අයුරින් මැනවින් ගොනුව් ඇති මහඟු කෘතියකි.

**මේජර් සීඑල්ජ් ඩිරෙක්ස්. ශ්‍රීලපාහ (විශ්‍රාමලත්)**

මෙ පොත සම්බන්ධව මගේ අදහස් මට වචනයෙන් කිව නොහැක. එය එතරම්ම

හාරදූර, එතරම්ම නිවැරදි හා එතරම්ම සර්ව සම්පූර්ණ කෘතියකි. මට කිවහැක්කේ ඔබ සදකල් සිත්හි පවතින අන්දමේ අගනා මෙහෙයක් ඉටුකර ඇති බවයි.

*** මේජර් එච්බී විජේකෝන් 2(සෙව්) ශ්‍රීලපාහ**

ඔබේ පොත මා වෙත අද්දින ලැබුණු සැනකින්ම එය පෙරලා බැලූ අතර එය මාහැඟි කෘතියක් ලෙස මට එකවරම වැටහි ගියේ ය.

විනය බලකා ඇල්ම හා තත්වයන් සීඝ්‍රයෙන් පිරිහෙමින් පවතින මෙවන් යුගයක පිටව ඇති මෙම පොත අප ලංකා පාබල හමුද අයවළුන්ගේ පමණක් නොව මුළු මහත් යුද්ධ හමුද අයවළුන්ගේත් සිත් සතන් ප්‍රබෝධ කරලනවාට සැක නැත.

මෙය මා බෙහෙවින් අගය කරන වස්තුවක් බවට ද සැමද පවතින අතර ඔබේ ඒකකය කෙරෙහි මගේ ඇති උසස් භක්ති ප්‍රණාමයේ සිහිවටනයක් වශයෙන් ද එය පවතිනු ඇත.

**මේජර් පී පක්ෂවීර ගැහේබ**

කියවීමට සිත් උපදවන අන්දමේ කෘතියකි. මට පෙනෙන අන්දමට ඔබ ඉතා අගනා කර්තව්‍යයක් ඉටුකර ඇති අතර, අවුරුදු විසිපහක ලංකා පාබල හමුද ඉතිහාසය සම්බන්ධව ගැබ්විය යුතු සෑම තොරතුරක්ම එහි අඩංගු වී ඇත.

*** මේජර් (උපා) එච්. ජේ. වික්‍රමසිංහ (විශ්‍රාමලත්) 1ශ්‍රීලපාහ හි ප්‍රථම රෙ. උ.පා.සැ.**

ලංකා පාබල හමුදවේ 1 වෙනි බලඇණියේ ඉතිහාසය දැක්වෙන මාහැඟි ග්‍රන්ථයක් මා වෙත එවීම ගැන මම ඔබට ස්තුති වන්ත වෙමි.

බලඇණියේ සියළු කටයුතු දිනෙන් දින දියුණුවට පත්වේවායි ඉත සිතින් පතමි.

*** මේජර් (උපා) බී ද සිල්වා. ශ්‍රීලපාහ (විශ්‍රාමලත්) 1ශ්‍රීලපාහ හි ප්‍රථම රෙ.සැ:මේ.**

මෙම පොත පිලියෙල කිරීමට ගන්නා ලද මාහැඟි උත්සාහය වෙනුවෙන් ඔබටත් අදල හැමටත් මගේ අවංක ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

විශිෂ්ඨ අන්දමින් පිලියෙළ වී ඇති මෙම පොත කියවීමෙන් රෙජිමේන්තුවේ වසර 34 ක, විශේෂයෙන් 1ශ්‍රීලපාහ හි ප්‍රථම රෙ.සැමේ වශයෙන් කටයුතු කල වසර 3 කාලය සම්බන්ධ අතීත - සිදුවීම් මගේ මතකයට නැංවිය.

බලඇණියට මගෙන් ඉටුවුනු සුළු සේවයේ අපතේ නොගියා යයි මට දැන් සෑහිමට පත් විය හැකි අතර ඒ ගැන මම ආඩම්බර වෙමි.

**කපිතන් (උපා) එස්පී මසිලමනි. ශ්‍රීලපාහ (විශ්‍රාමලත්)**

මේ සඳහා මොනතරම් ශ්‍රමයක් වැය කරන්ට ඇත්ද?

මෙම ආශ්චර්යමත් කටයුත්තට හවුල් වූ ඔබ සියළු දෙනාට මගේ ප්‍රශංසාව හිමිවේ. මා ගැන කල්පනා කර බලන විට මෙම පොත මතක සම්භාරයක් බව කිව යුතු ය.

*** කපිතන් (උපා) එච්ඩබ්ලිව්ජේ වීරකෝන්. ලපාහ (විශ්‍රාමලත්). බලඇණියේ හිටපු රෙ.සැමේ.**

මවිසින් දිගු කලක් සේවය කල ලංකා පාබල හමුදවේ විසිපස් වැනි සංවත්සරිකය නිමිත්තෙන් පිට කරන ලද මෙම ඓතිහාසික ග්‍රන්ථයේ පිටපතක් මා වෙත ප්‍රදනය කිරීම ගැන ඔබටත්, සියළු නිලයින්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පුදකරනු කැමැත්තෙමි. මෙසේ කලගුණ සැලකීම ගැන අතිශයින්ම සතුටට පත්වීමි.

*** බති 11 පෙරුමාල් ආර්ඩබ්ලිව් (විශ්‍රාමලත්). බලඇණියේ ප්‍රථම වි.ශා.සැ.**

සිය රෙජිමේන්තුවට හා උසස් නිලධාරින්ට පක්ෂපාතීත්ව, ඇපකැපවී සේවය කල අතීත සෙබලකු සිහිපත් කරලීම ගැන ඔබටත්, ලංකා පාබල හමුදවේ සියළු නිලයින්ටත් මගේ අවංක ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

වයසට පත්වීමත් සමගම ජීවිතාවබෝධයක් ලබා ඇති මා මාගේ ජීවිතයේ අත්දැකීම් සිහිපත් කරමින් දැනට කල්ගත කරමි.

**බති11 රණසිංහ ඩී. ඩබ්ලිව් (විශ්‍රාමලත්). බලඇණියේ හිටපු වි.ශා..උ.පා.සැ**

ලංකා පාබල හමුදවේ 1වෙනි බලඇණියට විසිපස් වසරක් පිරීම නිමිත්තෙන් පළකරන්නට යෙදුනු ඉතිහාසය පොතෙහි විශේෂ මුද්‍රණ පිට පතක් තිළිණයක් වශයෙන් මා වෙත ප්‍රදනය කිරීම ගැන ඔබතුමා වෙත ස්තුතිවන්ත වෙමි.

තවද, මෙම පොත මුද්‍රණය කිරීමෙහිලා මූලික කටයුතු සම්පාදනයෙහි කොටස් කරුවෙකු වශයෙන් මගෙන් ඉටුවුනු සේවය ඔබතුමා අගය කිරීම ගැන ඔබට කෘතඥ වෙමි.

*** ලුතිනන් කර්නල් ඊජී තේවනායගම්. සීරෙ. අණදෙන නිලධාරී 3(සෙව්) ගැහේබ**

මෙය ආශ්චර්යමත් ජයග්‍රහණයක් බව අවංකව පවසමි.

මෙම කෘතිය පළකිරීමට ආධාරෝපකාරී වූ හැමට මගේ ප්‍රශංසාව හිමිවේ.

**කපිතන් ඩබ්ලිව් මොලගොඩ. ශ්‍රී ලංකා නාවික හමුද (උපසේවය). ගරු ජනාධිපතිතුමාගේ වැඩබලන අධිසහායක**

ඔබට ප්‍රශංසාව හිමිවිය යුතු මනහර කෘතියකි මගේ පුස්ථකාලය බැබලවීමට එය දැන් සමත්වී සිටී.

*** කපිතන් ඔස්කාර් එම්. අබයරත්න ශ්‍රීලපාහ (උපසේවය). ලංකා පාබල හමුදවේ ප්‍රථම ඉතිහාසඥ**

ඉතිහාස ග්‍රන්ථයේ පිටපතක් මා වෙත එවීමට තරම් කාරුණික වීම ගැන මගේ ස්තුතිය ඔබටත්, බලඇණියේ සියළු නිලයින්ටත් පුද කරන්නෙමි. 1928 පටන් ලංකා පාබල හමුදව මගේ මුල් ආදරය විය. කාලයත් සමග කීර්තියෙන් අභිමානවත් වූ මෙම ඒකකය පිළිබඳ මගේ ආදරය හා භක්තිය අල්ප කිරීමට කිසිවක් පොහොසත් නොවිය. ඒකකයේ යමක් සිදුවී නම් එය සැමවිටම මගේ කටයුත්තක් ලෙස මම සැළකුවෙමි. එමෙන්ම මෙවැනි වටිනා වස්තුවක් හිමිවීම මට විශාල ප්‍රීතියකි.

මෙම විශාල ග්‍රන්ථය වර්තා හා ලේඛන ආරක්ෂා කිරීමේ, පවත්වාගෙන යාමේ ඇලී, නියැලී සිටියවුනට මහත් ගෞරයක් වන අතර, වාර්තාගත කිරීමේ නිවැරදිභාවය, ක්‍රමවත්භාවය හා විධිමත් භාවය හුවාදක්වන්නක් වේ. විනාශකාරීන් ජීවත් වන ලෝකයක උසස් තත්වයක ලැදියාවක් හා ඇපකැපවීමක් එයින් ප්‍රතිබිම්භ වන හෙයින් ඔබ ඔබවම ප්‍රශංසාවට ලක් කරනහොත් එය යුක්තිසහගතය.

ග්‍රන්ථය හැඩගස්වා ඇති ආකාරය නිසා පාඨකයාට මූලික ගොඩනැංවෙමින් පැවැති යුගයන් සිට ක්‍රමයෙන් නිර්මාණය වී සංවත්සර වසරේ සංවර්ධනය වන වැඩීමක් දක්නට ලැබේ. බලඇණි ජීවිතයක සියළු අංශවලට ජන්මය දුන් සියළු වර්ගයේ සිද්ධීන් සමුදය අප ඉතා ආඩම්බරයෙන් සිහිකරන රණකාමී හැඟීම් හා බලකා ලැදියාව මතු කරමින් විසිතුරු කැටයමක් පරිද්දෙන් මෙහි නෙලා ඇත. තව ද, එය මාහැඟි කෘතියක් මෙන් ම එයට සහභාගි වූ නිලධාරීන්ගේ හා සෙසු නිලයින්ගේ අගය හා සමකල හැකි වටිනාකමක් සහිත එකක් වේ.


එහි ප්‍රධානියාගේ චරිතය හා ආඥාව මේ යයි විදහා දක්වන බලඇණිය, එහි විසිපස් වෙනි සංවත්සරයේ අණදීම භාග්‍යය හා ගෞරවය ලැබූ ඔබගෙන් සුරක්ෂිත වනබව සැකයක් නොමැත.

බලඇණිය එළඹෙන විසිපස් වෙනි වසර අවසානයේ දී ද අද මෙන් සම්භාවනීය ව ප්‍රබලව පැවැතිය යුතු අතර දුටුගැමුණු, පරාක්‍රමබාහු. වීදිය බණ්ඩාර, මායාදුන්නේ, සීතාවක රාජසිංහ 1 වන විමලධර්මසූරිය සහ මහනුවර රාජසිංහ වැනි ශුරවීර නායකයින්ගේ අනසක යටතේ පරාක්‍රමවත් ශුරභාවය විදහා දැක්වූ අපේ මුතුන් මිත්තනට උපහාරයක් වන සේද පැවතිය යුතු ය.

සෑම වර්ෂයක් අවසානයේ එම වසරේ බලඇණි ඉතිහාසය ලිවීමට නිලධාරියෙකු පත්කල හොත් ඔබගේ අනාගත ශ්‍රමය විශාල ප්‍රමාණයකින් ඉතිරි කර ගත හැක. මා මෙසේ පවසනුයේ මා විසින් ලියන ලද (අවුරුදු 30) ඉතිහාසයට වාර්තා හා ලේඛන සම්බන්ධව වගකිව යුත්තන් වචනයක්වත් එක්කිරීමට අපොහොසත් වීම නිසා ය.

අවසාන වශයෙන්, ඔබගේ වැඩදායී අණදීම අඛණ්ඩව කිරීමට ඔබට ඉඩලැබේවායි පතමි.

# "රිවිරැස" 3 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ දායකත්වය



පෙත්වා "රිවිරැස"ට පෙරමග ඇති ලකුණු

*ලුතිකර් එල්බී තල්ගහගොඩ ශ්‍රීලපාහ - 3 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි*

වසර ගණනාවක යාපනය ප්‍රදේශයේ බලය සියතට ගෙන තමන් මුළු මහත් දෙමළ ජනතාවගේම විමුක්ති දායකයන් ලෙස පෙනී සිටිමත් හමුද සේනාංක වෙත සැඟවී සිට ප්‍රහාර එල්ල කරමින් තමන් කිසිදිනෙක පරාජය කිරීමට අසීරු ගරිල්ලා සංවිධානයක් බව මුළු ලොවට කියා පාමින් එල්ටීටීඊ සංවිධානය ගොඩනගා තිබූ සංකල්ප පල රහිත ක්‍රියාවක් බැව් ඔප්පු කිරීම සඳහා ඔවුන්ගේ සක්‍රිය රාජධානිය වූ යාපනය ප්‍රදේශය වෙත හමුද සේනාංක පා එසවීමට ගත් තීරණය බොහෝ විට විශාල පිරිසකගේ මවිතයට කරුණක් විය. එල්ටීටී ත්‍රස්තවාදීන්ගේ හදවත බඳු වූ යාපනය ප්‍රදේශයේ ඔවුන්ගේ නායකයන්, ප්‍රධාන පෙලේ කාර්යාල සහ වෙනත් රහස්‍ය ස්ථාන පවත්වාගෙන යන හෙයින් ඔවුන්ගේ බල කොටු භූමිය වෙත හමුද සේනාංකයන්ට සමීප වීමට ඉඩක් නොතබනු ඇතැයි සමහරක්ගේ මතය විය. හමුද ඉතිහාසයේ මෙතෙක් ක්‍රියාත්මක නොකල විශාල පරිමාණයේ මෙහෙයුමක් සඳහා භට පිරිස් පෙළ ගැස්සවීමට හමුද නායකයන් ගත් තීරණය අනුව විශාල හමුද භට පිරිසක් පලාලි වෙත ප්‍රවාහනය කිරීමට තීරණය කරන ලදී. මේ අනුව වෙනත් ප්‍රදේශවල රාජකාරි කල බලඇණි පලාලි කඳවුර වෙත රැගෙන එන අතරතුර ක්‍රියාන්විතය සඳහා අවශ්‍ය වෙනත් දෑ සැලසුම් සහගතව එක්රැස් කරන ලදී. වැඩි කාලය ආරම්භවීමට නියමිතව තිබුණ ද පැමිණෙන සියළුම බාධක ජය ගනිමින් යාපා පටුන ජය ගැනීම සඳහා අධිෂ්ඨාන පූර්වකව සියළුම සැලසුම් ක්‍රියාත්මක කරන ලදී.

ක්‍රියන්විතය සඳහා අති විශාල භටපිරිසක් සහභාගී වන හෙයින් පාලන කටයුතු පහසු කිරීම සඳහාත් ක්‍රියාන්විතය අධියරෙන් අධියර ඉලක්කයන් වෙත ළඟා කිරීම සඳහාත් සේනාංක මූලයන් කීපයක් පිහිටුවා එම සේනාංක යටතේ බලසේනා මූල කීපයක් ස්ථාපිත කරන ලදී. මේ වන විට ක්‍රියාත්මක වූ "විදුලි පහර" ක්‍රියාන්විතයෙන් ත්‍රස්තවාදීන් සැලකිය යුතු පසුබෑමට ලක්ව සිටි හෙයින් යාපනය නගර ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීම සඳහා සැලසුම් ගත ක්‍රියාන්විතය ආරම්භ කිරීමට සුදුසු කාලය එළඹී ඇතිබැවි ක්‍රියාන්විත භාර නියමුවන් තීරණය කරන ලදී.

1995.10.17 වන දින හිරු උදවට හෝරා කීපයකට පෙර අඳුර අතරින් සන්නාසන්නද්ධ වූ බලසේනා ත්‍රස්තවාදීන්ගේ ස්වකීය රාජධානිය ආක්‍රමණය කිරීම සඳහා පෙළ



සෙබළුන් සොයයි ඉදිරියේ ඇති ජය ලකුණු



සියතට අරන් මග හමු වූ අවි දරුණු

සැදී සිටින ලදී. 52 වන සේනාංකය යටතේ පිහිටුවා ගත් 522 වන බලසේනා මූලය විසින් 1 ශ්‍රීලපාහ, 3 ශ්‍රීලපාහ සහ9 ගැහේබ යන ඒකක ප්‍රමුඛ සන්නද්ධ සේනා හටපිරිස් පෙළ ගස්වන ලදී. හිරු තල් අරඹ වෙත නෙත් යොමු කිරීමට ආසන්න පැයේ අප ආරක්ෂක වලල්ල බිඳ දමා ත්‍රස්වාදීන්ගේ නිජබිම තරණය කිරීමේ අති දුෂ්කර ගමන "රිවිරැස" ක්‍රියාන්විතය නමින් ආරම්භ කරන ලදී. පොන්නාලේයි - කඩ්ඩුවාන් ප්‍රදේශයේ සිට කුප්පිලාන් ප්‍රදේශය අත්පත් කර ගැනීම සඳහා මෙම ඒකක හට පිරිස් ගමන් ගත් අතර, 1 ශ්‍රීලපාහ හටපිරිස් පලාලි යාපනය ප්‍රධාන මාර්ගයට සමීපව දකුණු පසින් ඉදිරියට ඇදෙන ලදී. 9 ගැහේබ හටපිරිස් ඉහත මාර්ගයට දකුණු පසින් පැති ආරක්ෂාව සපයමින් ගමන් කරන ලදි. හමුද සේනාංක මෙතරම් කඩිනමින් යාපනය ප්‍රදේශයට පැමිණීම අදහගත නොහැකි වූ ත්‍රස්තවාදීන් තමන්ගේ ඉදිරියට ඇදෙන හමුද සේනාංක වෙත යුහුසුළුව ප්‍රහාර එල්ල කරන ලදී. සූදනමකින තොරව සටනට අවතීරණය වීමට සිදුවීම නිසා කලබල කාරී ස්වරූපයකින් ප්‍රහාර එල්ලකල ත්‍රස්තවාදීන් මධ්‍යාහනය වන විට තම නායකයන් අමතා අමතර හටපිරිස් වල සහාය ද ලබාගෙන සටනට අවතීරණ වන ලදි. විශාල තල්රුප්පාවලින් හා වගා බිම් වලින් සමන්විත ඉදිරි භූමිය තරණය කිරීම අප හටපිරිස් වලට පහසු ක්‍රියාවක් නොවූ අතර, භූමියේ වාසි සහගත තත්ත්වය නිරතුරුවම ත්‍රස්තවාදීන් සතුව පැවතුනි. මනාව සකසන ලද බංකර් හා යුධ අගල්වල සිට සුළු අවි මැෂින් තුවක්කු හා මෝටාර් උපයෝගී කරගනිමින් ත්‍රස්තවාදීන් දැඩි ප්‍රහාරයන් මෙදින අප හටපිරිස් වෙත එල්ල කරන ලදී. දැඩි අධිෂ්ඨානයකින් හා කැපවීමකින් යුතුව ඉලක්ක කරා ගමන් කල අප ඒකක නිලධාරීන් හා සෙසු නිළයන් 1700 පැය වන විට අපේක්ෂිත ප්‍රදේශය වෙත ගමන් කිරීමට සමත් විය. ස්ථාන කීපයක දී ත්‍රස්තවාදීන් සමග මුහුණට මුහුණ ලා සටනේ නියැලීමට සිදු වූ හෙයින් සෙබළුන් 07 ක් ජීවිතය පරිත්‍යාග කල අතර, තවත් නිලධාරීන් 03 ක් හා සෙබළුන් 48 දෙනකු තුවාල ලබා යුද පිටියෙන් ඉවත් වන ලදී.

ක්‍රියාන්විතයේ දෙවන දිනය වූ 1995.10.18 වන දින 1030 පැයට පමණ අප හට පිරිස් පොන්නාලෙයි - කඩ්ඩුවාන් උතුරු ප්‍රදේශයේ සිට කුප්පිලාන් උතුරු ප්‍රදේශය ඉලක්ක කරගෙන ගමන් අරඹන ලදි. මේ වන විට ඉදිරියේ ඇති තමන්ගේ වැදගත් ස්ථාන රැකගැනීම සඳහා තම ප්‍රහාර පෙර දිනටත් වඩා දරුණු ලෙස එල්ල කිරීමට ත්‍රස්තවාදීන් සැලසුම් කර තිබුණි. විශේෂයෙන්ම මෝටාර් උපයෝගී කරගනිමින් ත්‍රස්තවාදීන් ප්‍රහාර එල්ල කිරීම නිසා අප හට පිරිස් වල ගමන් වේගය සීමිත විය. තැන තැන අතුරන ලද බිම් වෙඩි හා මිනිස් නාශක බෝම්බ හේතුවෙන් කල්පනාකාරීව ඉදිරියට ගමන් කිරීමට අප හටපිරිස් වලට සිදුවිය. පොළොව අභ්‍යන්තරයේ සකසන ලද යුධ අගල්වල සැඟ වී සිටි ත්‍රස්තවාදීන් ප්‍රහාර එල්ල කිරීම හේතුවෙන්

***36 වැනි පිටුවට***




සුන්කල වගයි උන් නතු වූ බල කුළුණු

# What's New

තොරතුරු බිඳක්....

Compiled by
Major. Du De Lanerolle RWP,



The Chairman of the Sri Lanka Light Infantry Association Major General H V Attukorale VSV, psc, FBIM (Rtd), Capt. Richie Bandara (Rtd), Vice Chairman and Major BP Weerasuriya (Rtd), Hony Secy. and the Regtl Centre Comdt Lt. Col DGS Balthazaar SLLI entering the Regtl Lecture Hall for the Annual General meeting of the SLLI Association

## PROMOTIONS

T/Brigadior from 95.11/15
Col G. B M Jayasundara, RSP

T/Maj 95.03.31
Capt M M Kithsiri SLLI

T/Maj 95.08.04
Capt K W R Abroo SLLI
Capt L R Santhanam SLLI
Capt W W RD Wijerathna, ESP, SLLI

T/Capt (QM) 95.12.06
LT (QM) D D Muniratne SLLI
Lt (QM) M P S Perera SLLI
Lt (QM) K M Sumathipala SLLI
Lt (QM) P Wjiesinghe SLLI
Lt (QM) R Liyanage SLLI
Lt (QM) J A Chandradasa SLLI

## COURSES - OVERSEAS

Maj. Gen. A. K. Jayawardana RWP, RSP, psc, rcds, returned to the Island on 1st December 1995 after successfully completing The Royal College of Defence Studies Course in England.

Foreign Courses - Officers
MAFST - 96 Malaysia - from 95.12.02 to 96.11.06
Maj. J R. Kulatunga SLLI

DPTC - 02 India - From 95.12.04 to 96.01.27
Capt. P H V Warnakulasooriya SLLI

JC 75 India - From 95.11.27 to 96.02.04
Maj DTPDK Perera SLLI
Capt. N K Wadugodapitiya SLLI

YO - 77 India - From 95.08.01 to 95.12.23
Maj H D G Ranasinghe SLLI
Maj G W Wijesinghe SLLI

Young Officer Course India from 95.11.09 to 96.03.30
Capt. SP Wijesooriya SLLI
Capt. MP Gunasinghe SLLI

මේජර්. කේ. ජේ. ජයවීර ශ්‍රීලපාහ වෙතින්

## උසස් කිරීම්/පත්කිරීම්/ඇතුලත්කිරීම්

**තා/බති II තිලයට උසස් කිරීම - 3 ශ්‍රීලපාහ 1994.01.01 දින සිට**

සෙ/11612 ව/සැරයන් ගුණසේකර බංඩා ආර්ආර්ජ්
සෙ/11666 ව/සැරයන් ධර්මජයන්ති බී
සෙ/11785 ව/සැරයන් උදයකුමාර ඩීජී
සෙ/11783 ව/සැරයන් ෂෙල්ටන් සෝසෝ
සෙ/11941 ව/සැරයන් කොඩිතුවක්කු ඩී

**තා/බති 11 තිලයට උසස් කිරීම - 3 ශ්‍රීලපාහ 1995.03.15 දින සිට**

සෙ/11485 ව/සැරයන් කරුණාරත්න ජී
සෙ/11717 ව/සැරයන් පෙරේරා කේජී

**තා/බති 11 තිලයට උසස් කිරීම - 7 ශ්‍රීලපාහ 1994.01.01 දිනසිට**

සෙ/11857 ව/සැරයන් ජයරාජ් යූජීඩී
සෙ/11959 ව/සැරයන් රත්නපාල කේපීසී
සෙ/11845 ව/සැරයන් වීරසේන ඩබ්
සෙ/11883 ව/සැරයන් සතරසිංහ එස්ඩීආර්ටී
සෙ/11795 ව/සැරයන් රණසිරි ජේඑච්ඩබ්

**තා/ව/සැරයන් තිලයට 4 ශ්‍රීලපාහ - 1993.04.02 දින සිට**

සෙ/11949 සැරයන් සුනිල් ශාන්ත ඩබ්ජේජ්

**තා/ව/සැරයන් තිලයට - 10 ශ්‍රීලපාහ - 1994.09.01 දින සිට**

සෙ/12090 සැරයන් ගුණවර්ධන ජීජීඑස්කේ
සෙ/12159 සැරයන් නෝනිස් එච්එස්පී
සෙ/12017 සැරයන් නවරත්න එන්එම්එන්
සෙ/12436 සැරයන් දිසානායක ඩීඑම්යූ
සෙ/12573 සැරයන් මොණරවිල එච්ජ්ජ්

සෙ/11164 බනි 1 ඩබ්එල් ගුණසිරි - 1995.12.01 දින සිට රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ශ්‍රීලපාහ හි දරන ලද රෙසැමේ තනතුර අත්හැරීම (බනි 1 ඩීඑම්බී දසනායක රපෝර්තු කරන තෙක් තවදුරටත් රෙසැමේ තනතුරේ වැඩ බැලීම)

සෙ/11298 බනි 1 ඩීඑම්බී දසනායක - 1995.12.01 දින සිට 8 ශ්‍රීලපාහ හි දරන ලද රෙසැමේ තනතුර අත්හැරීම හා එදිනම සිට රෙජිමේන්තු ආධාරක බළඇණිය ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහි රෙසැමේ වශයෙන් පත් කිරීම

සෙ/11050 බනි 1 එස් මිල්ටන් - 1995.06.11 සිට 2 (සෙව්) ශ්‍රීලපාහ හි දරන ලද රෙසැමේ (උපදේශක) තනතුර අත්හැරීම

සෙ/11399 බනි 1 එම් පියරත්න - 1995.12.01 දින සිට 9(සෙව්) ශ්‍රීලපාහ හි දරන ලද රෙසැමේ (උපදේශක) තනතුර අත්හැරීම

සෙ/11178 බනි 1 ප්‍රේමදාස කේපිආර්. - 1995.12.01 දින සිට රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි දරන ලද රෙදපාසැමේ තනතුර අත්හැරීම

## PROMOTIONS

2/Lt fo Lt
1/Lt W P W P Baudara SLLI
2/Lt H D s K Herath SLLI
2/Lt H N A Somaweera SLLI
2/Lt J P D C P Dias SLLI
2/Lt V G W Hewawissa SLLI
2/Lt S M R Prasanna SLLI
2/Lt J K P Jayasinghe SLLI
2/Lt R A K S Ranathunga SLLI
2/Lt L C U Abeykoon SLLI
2?Lt P A N Sananayake SLLI

## විවාහවීම් සෙසුතිල- මංගල සීනු

4 ශ්‍රීලපාහ

සෙ/12974 සැරයන් රංජිත් කුමාර කේව්ඩීඑස් 1994.03.17 දින පුෂ්පා රාජපක්ෂ මෙනවිය සමග මනාලියගේ නිවසේ දී විවාහ වන ලදී.

සෙ/12806 සැරයන් අජිත් ජීඑම් 1994.01.17 දින නිරෝෂාකුමාරි ප්‍රියදර්ශණී මෙනවිය සමග ජයන්තිපුර විවාහ ලේකම් කාර්යාලයේදි විවාහ වන ලදී.

සෙ/12074 සැරයන් සිල්වා යූඩීජීජ් 1994.03.09 දින ආර්ජ් කරුණාවති මෙනවිය සමග අලුත්වැව විවාහ ලේකම් කාර්යාලයේ දී විවාහ වන ලදී.

සෙ/13068 සැරයන් සුනිල් ශාන්ත බිපී 1994.05.27 දින නිශාන්ති ප්‍රියදර්ශනී එගොඩවත්ත මෙනවිය සමග අලපාවල විවාහ ලේකම් කාර්යාලයේ දී විවාහ වන ලදී.

සෙ/13021 සැරයන් අතපත්තු ඒකේඩීඑස්කේ 1994.04.05 දින දමයන්ති කුරුප්පු මෙනවිය සමග මනාලියගේ නිවසේ දී විවාහ වන ලදී.

සෙ/13347 සැරයන් හේරත් එච්එම්එල්ජ් 1994.05.27 දින අමිතා කුමාරි ගුණතිලක මෙනවිය සමග උලපනේහිදි විවාහ වන ලදි

සෙ/12554 සැරයන් පොඩිතිලමේ ජේජීඑල් 1994.07.25 දින එච්එම් මානෙල් මැණිකේ මෙනවිය සමග මනාලියගේ නිවසේ දී විවාහ වන ලදී.

සෙ/12455 සැරයන් වීරසිංහ ජීජී 1994.05.28 දින එම් ශර්ලි චූලකාන්ති මෙනවිය සමග මාතලේ දී විවාහ වන ලදී.

සෙ/15293 කෝප්‍රල් සේනානායක එස්ජීඑන් 1994.01.06 දින එච්එම් ගීතානි හේරත් මෙනවිය සමග කුලියාපිටියේ දී විවාහ වන ලදි.

සෙ/13575 කෝප්‍රල් පියසේන ඒඩබ් 1994.01.05 දින ඒආර් රේණුකා ප්‍රියන්ගා වසන්තා කුමාරි මෙනවිය සමග ගල්ගමුවේ දී විවාහ වන ලදී.

සෙ/14870 කෝප්‍රල් ඒකනායක ඊජීඑම්ජීසී 1994.02.20 දින නිරෝෂි චන්ද්‍රිකා රත්නකුමාර මෙනවිය සමග කුරුණෑගල දි විවාහ වන ලදී.

සෙ/15567 කෝප්‍රල් චන්ද්‍රරත්න යූජී 1994.03.28 දින ජානකී ද සිල්වා මෙනවිය සමග කමන්කඩු වදී විවාහ වන ලදී.

සෙ/14893 කෝප්‍රල් ප්‍රියන්ත කේජීපී 1994.03.16 දින සමරසිංහ මෙනවිය සමග අලත්ගමදී විවාහ වන ලදී

සෙ/14599 කෝප්‍රල් සෝමරත්න එච්එම් 1994.03.10 දින චාන්දනී දිසානායක මෙනවිය සමග හිරියාලහිදී විවාහ වන ලදී.

## උසස් කිරීම්/පත්කිරීම්/ඇතුළත්කිරීම

සෙ/11499 බනි 11 ගුණරත්න එම්ජ් - 1995.12.07 දින සිට 7 ශ්‍රීලපාහ හි දරන ලද රෙදපාසැමේ තනතුර අත්හැරීම හා එදිනම සිට 7 ශ්‍රීලපාහ වෙතින් 8 ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර 8 ශ්‍රීලපාහ හි රෙසැමේ තනතුර සඳහා පත්කිරීම

සෙ/11387 බනි 11 ජයවර්ධන අයිජ් - 1995.08.20 දින සිට 10 ශ්‍රීලපාහ හි දරන ලද රෙඅපාසැමේ තනතුර අත්හැරීම හා එදිනම සිට 10 ශ්‍රීලපාහ වෙතින් රෙජි ආබ ශ්‍රීලපාහ වෙත ඇතුලත් කිරීම.

සෙ/11379 බනි 11 රත්නායක එන්එම් - 1995.12.01 දිනසිට 1 ශ්‍රීලපාහ හි දරණ ලද රෙදපාසැමේ තනතුර අත්හැරීම හා රෙසැමේ (උපදේශක) තනතුර සඳහා පත් කිරීම.

සෙ/11407 බනි 11 පොඩිබංඩා බිආර් - 1995.06.11 දින සිට 2 (සෙව්) ශ්‍රීලපාහ හි දරණ ලද රෙදපාසැමේ තනතුර අත්හැරීම හා එදිනම සිට 2 (සෙව්) ශ්‍රීලපාහ හි රෙසැමේ (උපදේශක) තනතුර සඳහා පත් කිරීම.

සෙ/11533 බනි 11 වික්‍රමසිංහ ඩබ් - 1995.12.01 දින සිට අරෙසේ මත 4 ජාගිබ හි දරණ ලද බනි 11 උපදේශක තනතුර අත්හැරීම හා එදිනම සිට රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි රෙදපාසැමේ තනතුර සහා පත් කිරීම, (අරෙසේ රාජකාරි නිමා වී පැමිණි පසු)

සෙ/11618 බනි 11 ජයලත් කේපි - 1995.12.01 දින සිට රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි බනි 11 සරඹ උපදේශක තනතුර සඳහා පත් කිරීම

සෙ/11685 බනි 11 ගාමිණී කුමාර බි - 1995.06.11 දින සිට 4 ශ්‍රීලපාහ හි දරණ ලද රෙදපාසැමේ තනතුර අත්හැරීම හා එදිනම සිට 4 ශ්‍රීලපාහ වෙතින් රෙජිආබ ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර 2(සෙව්) ශ්‍රීලපාහ හි රෙදපාසැමේ තනතුර සඳහා පත් කිරීම.

සෙ/11587 බනි 11 හේමරත්න ඩබ්ජ් - 1995.08.20 දිනසිට 10 ශ්‍රීලපාහ හි රෙදපාසැමේ තනතුර සඳහා පත්කිරීම.

සෙ/11597 බනි 11 පද්මසිරි එම්එස් - 1995.06.11 දින සිට 4 ශ්‍රීලපාහ හි රෙදපාසැමේ තනතුර සහා පත් කිරීම

සෙ/11787 බනි 11 විජේරත්න ඩීජීඑස් - 1995.12.01දින සිට අරෙසේ මත කොආව්පි හි දරණ ලද බනි 11 ප්‍රධාන ශාරීරික අභ්‍යාස උපදේශක තනතුර අත්හැරීම හා එදිනම සිට රෙජිආබ ශ්‍රීලපාහ වෙතින් 4 ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර නැවත 4 ශ්‍රීලපාහ 1 ශ්‍රීලපාහ වෙත ඇතුළත් කර 1 ශ්‍රීලපාහ හි රෙදපාසැමේ තනතුර සඳහා පත් කිරීම (අරෙසේ රාජකාරි නිමාවෙන් පැමිණි පසු)

සෙ/11776 බනි 11 වර්ෂකෝන් එම්පි - 1995.12.01 දින 4 ශ්‍රීලපාහ වෙතින් 7 ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර, එදිනම සිට 7 ශ්‍රීලපාහ හි රෙදපාසැමේ තනතුර සඳහා පත් කිරීම.

සෙ/11554 බනි 11 වීරසිංහ පිපි - 1995.12.01 දින සිට 6 ශ්‍රීලපාහ වෙතින් රෙජිආබ ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර එදිනම සිට 2 (සෙව්) ශ්‍රීලපාහ හි බනි 11 සරඹ උපදේශක තනතුර සඳහා පත් කිරීම.

සෙ/11646 බනි 11 කැන්දරාගම කේඑම්එල් - 1995.12.01 දින සිට 10 ශ්‍රීලපාහ වෙතින් රෙජිආබ ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර එදිනම සිට 5 (සෙව්) ශ්‍රීලපාහ හි බනි 11 සරඹ උපදේශක තනතුර සඳහා පත් කිරීම.

සෙ/11411 බනි 11 සිල්වා ආර්සිපි - 1995.12.01දින සිට ක්‍රියාත්මක වන පරිදි 8 ශ්‍රීලපාහ වෙතින් රෙජිආබ ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර එදිනම සිට 9(සෙව්) ශ්‍රීලපාහ බනි 11 සරඹ උපදේශක තනතුර සඳහා පත් කිරීම.

## විවාහ වීම් - මංගල සීනු

සෙ/15252 කෝප්‍රල් නලින් බංඩා ආර්ජේ 1994.04.20 දින මානෙල් උදයකුමාර මෙනවිය සමග අනුරාධපුර නවනගරයේ දි විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලයේදි විවාහ වන ලදි.

සෙ/15310 කෝප්‍රල් ජයසුන්දර බංඩාර වයිඑම් 1994.03.23 දින වයලට් මෙනවිය සමග මනාලියගේ නිවසේ දී විවාහ වන ලදි.

සෙ/14490 කෝප්‍රල් ගුණසේන ඩබ්එම්එන් 1994.05.17 දින රේණුකා හේරත් මෙනවිය සමග මයලන් පේරු වැව වි. ලේ. කා විවාහ වන ලදි.

සෙ/15400 කෝප්‍රල් දිසානායක කේ 1994.05.25 දින දමයන්ති කරුණානායක මෙනවිය සමග මිහින්තලේ විවාහ ලේකම් කාර්යාලයේ දි විවාහ වන ලදි.

15149 කෝප්‍රල් නයනප්‍රිය ආර්පිජේ 1994.07.25 දින ශ්‍රියාණි මෙනවිය සමග ජාඇල දෙවි මැදුරේදි විවාහ වන ලදි.

සෙ/13901 කෝප්‍රල් ප්‍රියන්කර එස්ජ් 1993.03.15 දින වාමිනී ප්‍රියදර්ශණී මෙනවිය සමග ගාල්ල වි. ලේ. කා දී විවාහ වන ලදි.

සෙ/15992 කෝප්‍රල් රාජකරුණා ආර්එව්එම්ජ් 1994.08.11 දින රිඑම් පත්මා කුමාරි මෙනවිය සමග නිකවැරටිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදි විවාහ වන ලදි.

සෙ/14892 කෝප්‍රල් ජානක ඊජ්එස් 1994.06.26 දින ස්වර්ණලතා කුමාරි මෙනවිය සමග උඩුරුව වි. ලේ. කා. දි විවාහවන ලදි.

සෙ/300126 කෝප්‍රල් අබේරත්න ඩබ්බි 1994.07.21 දින මාලනි කුමාරි මෙනවිය සමග වෙදමුල්ල ප්‍රාදේශීය විවාහ ලේකම් කාර්යාලයේ දි විවාහ වන ලදි.

සෙ/15985 කෝප්‍රල් කරුණාරත්න වයිජීඑම 1994.01.07 දින දිල්රුක්ෂි විතානගේ මෙනවිය සමග ගල්මැටියාව වි. ලේ. කා. දී විවාහ වන ලදි.

සෙ/13126 ලාකෝ බංඩාර එම්ජී 1994.01.15 දින සුනිලා ප්‍රියදර්ශනී මෙනවිය සමග මහනුවර දිස්ත්‍රික්ක වි. ලේ. කා දී විවාහ වන ලදි.

සෙ/15391 ලාකෝ පත්මසිරි ඩබ් ඒ 1994.03.16 දින ශාන්ති කුමාරි මෙනවිය සමග පොළොන්නරුව වි. ලේ. කා දී විවාහ වන ලදි.

සෙ/15889 ලාකෝ පුෂ්පකුමාර එස්ඩිඩි 1994.03.03 දින ශිලටි කල්‍යානි මෙනවිය සමග කෑගල්ල දිස්ත්‍රික් වි. ලේ. කා. දි විවාහ වන ලදි.

සෙ/14764 ලාකෝ ගාමිණී එච්එම් 1994.04.24 දින බීජී කුසුමාවති මෙනවිය සමග කෝන්ගමුව මනාලියගේ නිවසේ දී විවාහ වන ලදි.

සෙ/14661 ලාකෝ සිරිසේන ආර්එම් 1994.03.27 දින චන්ද්‍රිකා දර්ශණී මෙනවිය සමග රාගම දකුණ වි. ලේ. කා දි විවාහ වන ලදි

සෙ/15389 ලාකෝ අනුරකුමාර ආර්එම් 1994.04.21 දින අයිරංගනී ලියනගේ මෙනවිය සමග ගලහා වි. ලේ. කා දී විවාහ වන ලදි.

## විවාහ වීම්

සෙ/15950 ලාකෝ ගුණරත්න බංඩා ආර්එම් 1994.05.26 දින කුමුදු සුජීවා මෙනවිය සමග මොණරාගල දී වි. ලේ. කා. දී විවාහ වන ලදී.
සෙ/15942 ලාකෝ රත්නායක ආර්එම් 1994.08.08 දින තුෂාරි ප්‍රින්කා අබේගුණවර්ධන මෙනවිය සමග බුත්තල වි. ලේ. කා දී විවාහ වන ලදී.
සෙ/30275 ලාකෝ ප්‍රියශාන්ත ඒපී 1994.09.25 දින ප්‍රියන්ති මෙනවිය සමග බටපොළ වි. ලේ. කා දී විවාහ වන ලදී.
සෙ/15428 සාසෙ නවරත්න බංඩා එස්ජ් 1994.01.23 දින රූපිකා ගුණවර්ධන මෙනවිය සමග යටියන්තොට වි. ලේ. කා දී විවාහ වන ලදී.
සෙ/15202 සාසෙ ජයසේන ආර් 1994.03.15 දින සන්ධ්‍යා කුමාරි මෙනවිය සමග රාජාංගනය අතිරේක දි. වි. ලේ. කා දි විවාහ වන ලදී.
සෙ/14777 සාසෙ දිසානායක කේ. 1994.01.17 දින ප්‍රියගංනි හෙට්ටිආරච්චි මෙනවිය සමග බියගම අතිරේක දි. වි. ලේ. කා දි විවාහ වන ලදි.
සෙ/300613 සාසෙ දීප්ති කුමාර යූජ්පී 1994.08.18 දින ධම්මිකා ප්‍රියදර්ශණී නනායක්කාර මෙනවිය සමග මිහින්තලේ වි. ලේ. කා. දි විවාහ වන ලදී.
සෙ/300147 සාසේ වැවේගෙදර ඩබ්එන්ඩබ් 1994.08.10 දින සුනේත්‍රා මල්කාන්ති මෙනවිය සමග මීගම මනාලියගේ නිවසේ දී විවාහ වන ලදී.

## දරු උපත්

1 ශ්‍රීලපාහ

සෙ/300002 ලාකෝ විජේසේනබංඩා ඊපීඑස් ගේ බිරිඳට 1995.12.14 දින මහනුවර රජයේ රෝහලේ දී පුතෙකු උපනි සිහිත්තා තමේෂ් දුමින්ද කුමාර විජේබංඩාර

3 ශ්‍රීලපාහ

සෙ/13539 සැරයන් ධනසිරි ජේ ගේ බිරිඳට 1995.01.02 දින තලාව රෝහලේ දී දියණියක් උපනි සිහිත්තිය ජයනි ඉරේෂා ධනසිරි

10 ශ්‍රීලපාහ

සෙ/301557 ලාකෝ ප්‍රභාත් චමින්ද ජීඑච්පී 1995 අගෝස්තු 28 දින ගාල්ල මහ මෝදර රජයේ රෝහලේ දී දියණියක් උපනි සිහිත්තිය පමුදි තිලක්ෂිහේවා වසම්

## ප්‍රාදේශීය පාඨමාලා

1996.01.22 දින සිට 1996.04.01 දින දක්වා ශ්‍රීලයුසේබ අනුරාධපුරය රියදුරු පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.
සෙ/305525 සාසෙ තිලක්කුමාර ඊජ්එස් (1 ශ්‍රීලපාහ)
සෙ/303923 ලාකෝ කුමාරතුංග ඩීජේආර් (3 ශ්‍රීලපාහ)
සෙ/ සාසෙ ප්‍රේමතිලක ටී (6 ශ්‍රීලපාහ)
සෙ/300848 සාසෙ සිල්වා ඒජ්කේ (8 ශ්‍රීලපාහ)
සෙ/306826 සාසෙ නන්දසිරි ඒඑන්ජ් (8 ශ්‍රීලපාහ)
සෙ/301211 සාසෙ තිලකරත්න ටීඩබ් (10 ශ්‍රීලපාහ)

## මියයෑම් නිලධාරී/සෙසු නිල

"රිවිරැස" ක්‍රියාත්විතයෙ'දී මියගිය නිලධාරී /සෙසු නිල (95.10.17 සිට 95.12.06)

1 ශ්‍රීලපාහ

සෙ/303473 කෝප්‍රල් වන්න ජීකේ, සෙ/300090 කෝප්‍රල් ඉන්ද්‍රසිරි ඩබ්එල්, සෙ/301664 කෝප්‍රල් කුරුප්පුආරච්චි කේපීඑස්, සෙ/300945 කෝප්‍රල් පෙරේරා බීඑස්, සෙ/30026 ලාකෝ රත්නායක ආර්පියූපී, සෙ/301224 ලාකෝ රත්නායක ආර්එම්සී, සෙ/300450 සාසෙ ජයසිංහ ජේජ්, සෙ/98807 සාසෙ බණ්ඩාරනායක වයි, සෙ/303043 සාසෙ කරුණාරත්න එස්එස්ඩබ්, සෙ/305268 සාසෙ චන්ද්‍රසිරි ඩීඑම්, සෙ/305414 සාසේ ආනන්දරාජා ඒ, සෙ/98521 සාසෙ පතිරණ එම්ජීඑස්, සෙ/ 304123 සාසෙ දිසානායක ඩීඑම්ජේ, සෙ/80385 සාසෙ සෙනවිරත්න එච්, සෙ/302667 සාසෙ දසනායක ඩීඑම්, සෙ/305435 සාසෙ ෂෙල්ටන් ඊජී, සෙ/305447 සාසෙ ජයසිංහ ඒජීඑස්, සෙ/305442 සාසෙ පුෂ්පකුමාර ඒයූජී, සෙ/303044 සාසෙ පුෂ්පකුමාර ජීවී.

3 ශ්‍රීලපාහ

නි/60540 මේජර් ජේපීඑස් ජයවීර, ශ්‍රීලපාහ, සෙ/12172 සැරයන් කිවුල්දෙණිය එච්එම්ජ්බී, සෙ/12937 කෝප්‍රල් සමරසේකර ආර්එම්, සෙ/13926 කෝප්‍රල් අබේකෝන් කේඑම්එස්, සෙ/300873 කෝප්‍රල් බොතේජු ටීවී, සෙ/303278 ලාකෝ නිශාන්ත එන්ඩබ්එන්, සෙ/303743 ලාකෝ ගුණසේන ඩීඑම්, සෙ/303920 ලාකෝ අමරසිරි කේඩී, සෙ/301005 ලාකෝ ද සිල්වා ඩීජේඩී, සෙ/301325 ලාකෝ සුමතිපාල එස්ආර්, සෙ/301773 ලාකෝ ඉඳුනිල් ඩබ්ජ්ඩබ්, සෙ/305078 සාසෙ දයානන්ද ඩබ්පි, සෙ/305094 සාසෙ ප්‍රියන්ත ප්‍රේමලාල් ආර්පී, සෙ/305103 සාසෙ බන්දුලකුමාර ටීඩී, සෙ/304152 සාසෙ පුෂ්පකුමාර කේපීඑස්, සෙ/303778 සාසෙ කුමාරසිරි අයිපීජී, සෙ/303729 සාසෙ සුනිල්ශාන්ත ඒජ්, සෙ/304419 සාසෙ වීරසේකර කේජ්,

4 ශ්‍රීලපාහ

නි/62558 ලුතිනන් එම්එන්ජ්පි කුරේ, ශ්‍රීලපාහ, නි/62999 ලුතිනන් ඒජ් විතානගේ, ශ්‍රීලපාහ සෙ/300614 කෝප්‍රල් ජයසිංහ එන්ජ්, සෙ/302596 ලකෝ බංඩාර ආර්එන්එම්, සෙ/204289 ලාකෝ ප්‍රේමචන්ද්‍ර ආර්එම්ආර්, සෙ/301080 ලාකෝ සේනාරත්න එස්ජ්එස්, සෙ/302739 ලාකෝ ප්‍රේමකුමාර ඩීඑන්ජ්, සෙ/302369 ලාකෝ රත්නායක ආර්එම්ඩබ්එම්, සෙ/303381 ලාකෝ පුෂ්පකුමාර ඒජ්ජ්, සෙ/302494 ලාකෝ බණ්ඩාරනායක ඒපීඑම්පීජී, සෙ/15404 සාසෙ රණතුංග යූ, සෙ/307188 සාසෙ රුද්‍රිගු ආර්සීඑන්, සෙ/305740 සාසෙ සුසින්තලාල් එල්එච්, සෙ/305666 සාසේ වීරරත්න ටීකේ, සෙ/307190 සාසෙ කුමාර ආර්ජී, සෙ/305617 සාසෙ ඒකනායක එස්පී, සෙ/307203 සාසෙ ලාල්කුමාර පීඩීඑස්, සෙ/301843 සාසෙ ශාන්තකුමාර ඩබ්, සෙ/102953 ආසෙ විජේසිං කේඩී.

6 ශ්‍රීලපාහ

නි/61706 ලුතිනන් ආර් විජේසිරිවර්ධන, ශ්‍රීලපාහ, සෙ/13586 සරයන් සුනිල්රත්න කේඑම්, සෙ/14421 කෝප්‍රල් ප්‍රියතිලක ජේපී, සෙ/13964 කෝප්‍රල් කපිලසේන ආර්පී, සෙ/302379 ලාකෝ සරත්කුමාර පීඑම්, සෙ/300652 ලාකෝ සිල්වා එස්එල්, සෙ/304683 සාසෙ හේමන්ත එච්එම්එස්, සෙ/304256 සාසෙ සිල්වා ආර්එස්, සෙ/304332 සාසෙ ජයසිංහ ඒපීඑස්, සෙ/305939 සාසෙ වීරවර්ධන යූඑස්, සෙ/304064 සාසෙ හෙන්නායක එච්එම්එස්, සෙ/304753 සාසෙ කීර්තිසිංහ එල්එම්ඩබ්, සෙ/303520 සාසෙ නිලන්ත එච්සී, සෙ/13540 සාසෙ සෙනෙවිරත්න කේ, සෙ/98501 ආසෙ ගමආරච්චි ජීකේපි, සෙ/91968 ආසෙ බංඩාර ආර්ආර්ජීඑස්, සෙ/104615 ආසෙ තිලකරත්න යූ, සෙ/140121 ආසෙ වීරකෝන් ඩබ්එන්ටීඩබ්.

7 ශ්‍රීලපාහ

නි/61356 කපිතන් ඩීඑන්පී මාසකෝරාල, ශ්‍රීලපාහ, නි/62308 2 / ලුතිනන් ජේජ්

ස්පිරියන්ස්, ශ්‍රීලපාහ, සෙ/11468 සැරයන් සොයිසා ටීඒ, සෙ/300071 කෝප්‍රල් තල්වත්ත ඊජීඩබ්, සෙ/302393 ලාකෝ නවරත්න එච්එම්, සෙ/302754 ලාකෝ රම්බංඩා කේජීඩබ්, සෙ/302522 ලාකෝ පුෂ්පකුමාර ඒපීඩබ්, සෙ/306738 සාසෙ දිසානායක ඩීඑම්කේ, සෙ/305167 සාසෙ ඩයස් කේඑන්ඩීඑල්, සෙ/305154 සාසෙ සුජිත් එච්බී, සෙ/306661 සාසෙ වීරකෝන් ඩබ්එම්එච්, සෙ/306734 සාසෙ සිරිසෝම ජේඑම්, සෙ/302844 සාසෙ සිරිවර්ධන එස්කේ, සෙ/305145 සසෙ චන්ද්‍රකුමාර යූබී, සෙ/307113 සාසෙ දිසානායක ඩීඑම්පී, සෙ/303831 සාසෙ ජයසිරි ඊඑච්, සෙ/107037 ආසෙ රාජපක්ෂ කේජ්එස්සී, සෙ/104505 ආසෙ පෙරේරා ඊඑල්සීජේ. සෙ/305160 සාසෙ විජේසිරි වීජීඑස්, සෙ/306432 සාසෙ විජිත කුමාර එස්පී, සෙ/306425 සාසෙ චමින්ද බී, සෙ/304843 සාසෙ ගුණවර්ධන ඊඑම්, සෙ/303688 සාසෙ සිතිල් අශෝක ජේඑම්, සෙ/307266 සාසෙ විජේසිංහ ඩබ්එම්බීකේ, සෙ/302591 සාසෙ රත්නායක කේආර්එම්, සෙ/303703 සාසෙ ජයවීර එම්ජේ, සෙ/304485 සාසෙ කුමාරසිංහ පීජීඑල්, සෙ/302827 සාසෙ රත්නායක ආර්ඒඑම්එස්, සෙ/304485 සාසෙ රත්නායක කේපී, සෙ/303698 සාසෙ ප්‍රියන්ත ඩීජීඑස්, සෙ/304683 සාසෙ සුමිත් අශෝක ඩීඑම්,

8 ශ්‍රීලපාහ
නි/62346 කපිතන් ඩබ්පීඑම්බීබී වීරසේකර, ශ්‍රීලපාහ, නි/53654 2/ලුති පීඒඩීටීඑස්සී ඩයස්, ශ්‍රීලපාහ, සෙ/300504 කෝප්‍රල් සෙනවිරත්න එස්ඒඑස්, සෙ/302163 කෝප්‍රල් හෙන්ශ්‍රී ඩීඩබ්ජේ, සෙ/300916 ලාකෝ සේනාරත්න ඩීඑම්එස්, සෙ/304556 ලාකෝ විජේසිංහ ඒඑස්, සෙ/303196 ලාකෝ ලක්දූවහෙට්ටි ටීඑස්එන්, සෙ/103098 ආසෙ ප්‍රේමරත්න ටීජේපී, සෙ/304598 සාසෙ මුතුබංඩා කේඑච්ඒ, සෙ/9537 සාසෙ අමරසිංහ ඩබ්එච්, සෙ/306835 සාසෙ කරුණාසේන ඩීඩී, සෙ/304890 සාසෙ සෙනවිරත්න ඒඒඑස්ඒ, සෙ/304887 සාසෙ ගුණසිරි එච්එම්ඩී, සෙ/99432 සාසෙ රත්නසිරි ජීඒ, සෙ/303667 සාසේ කරුණාතිලක පීඑම්කේ, සෙ/98666 ආසෙ සෙනවිරත්න කේපීඑස්, සෙ/13188 සාසෙ ඉන්ද්‍රසේන ඊකේ, සෙ/30640 සාසෙ කරුණාරත්න කේපීආර්, සෙ/303319 සාසෙ නන්දසිරි ඒඑම්, සෙ/100370 ආසෙ අනුරසේන, සෙ/98851 ආසෙ ආරියතිලක කේවී, සෙ/305062 සාසෙ දිසානායක ඩීඑම්ඩබ්, සෙ/91681 ආසෙ බන්දුලසේන ආර්කේඑම්, සෙ/304657 සාසෙ ප්‍රියශාන්ත ඩබ්පීඑන්, සෙ/306813 සසෙ දිසානායක ඩීඩබ්, සෙ/95512 ආසෙ බන්ඩාර එම්පීඑල්සී

9 (සෙව්) ශ්‍රීලපාහ
සෙ/9 ඩී 00039 සැරයන් නිමල්සිරි එන්, සෙ/13400 ආසෙ චන්ද්‍රසේන එච්එන්, සෙ/95 වීඑෆ් 5124 ආසෙ නිමල් රංජිත් කේපී,

10 ශ්‍රීලපාහ
සෙ/12866 සැරයන් අබේවික්‍රම අයිඑන්, සෙ/301577 ලාකෝ ද සිල්වා ආර්පී, සෙ/300685 සාසෙ ශාන්ත කුමාර එස්.
(මියයෑමෙන් පසු සියලුම නිලයින් ඊළඟ නිලයට උසස් කර ඇත)

## රෙම ශ්‍රීලපාහ

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ අංක 20 ආධුනික පාඨමාලාව විසිර යාමත් සමගම අලුතෙන් බඳවා ගන්නා ලද ආධුනික පාටමාලා අංක 21 ආධුනික සෙබලුන් 216 දෙනෙකු පුහුණුවීම් කටයුතු නිරතව සිටින අතර, 1995.11.27 දින පුහුණුවීම් ආරම්භ කර 1996.01.23 දින විසිර යන ලදී.

## 1 ශ්‍රීලපාහ

මෙම ඒකකය අලිමංකඩ ආරක්ෂක වලල්ලේ රාජකාරි වලින් මිදී 1995.11.17 වන දින ඇරඹූ "රිවිරැස" මෙහෙයුමට සහභාගී වූ අතර, එම ක්‍රියාන්විතයේ දී සෙසු නිලයින් 19 දෙනෙකු ජීවිතක්ෂයට පත් විය. දැනට ඒකකය යපනය ඉදිරි ආරක්ෂක වලල්ලේ රාජකාරියේ නිරතව සිටි.

## 3 ශ්‍රීලපාහ

ඒකක 10 වන සංවත්සරය 1995.12.16 දිනට යෙදී තිබූ අතර, රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ විරෝධාර රණවිරුවන්ට පිං පැමිණවීම සහ දැනට යුධ බිමේ රාජකාරියේ යෙදී සිටින රණවිරුවන්ට සෙත්පතා බෝධි පූජා පිංකමක් සහ පසු දින සංඝයා වහන්සේලා උදෙසා දානයක් පිළිගන්වන ලදී. දැනට මෙම ඒකකය යාපනය හරාලි ප්‍රදේශයේ රාජකාරියේ නිරතව සිටී.

## 4 ශ්‍රීලපාහ

මෙම ඒකකය 2 වන කාර්ය සේනාංකයේ 25 වන බළසේනාව යටතේ මූලතිව් කඳවුරේ රාජකාරියේ නිරතව සිටි අතර, 1995.10.17 දින පැවැති "රිවිරැස" මෙහෙයුමට සහභාගී වූ අතර, මෙහි දි නිලධාරි දෙදෙනකු සහ සෙසුනිලයින් 17 දෙනෙකු ජීවිතක්ෂයට පත් විය. දැනට යාපනය කොටුව ප්‍රදේශයේ රාජකාරියේ නිරතව සිටී.

## 6 ශ්‍රීලපාහ

මෙම ඒකකය "රිවිරැස" මෙහෙයුමට සහභාගී වූ අතර, එක් නිලධාරියෙකු ඇතුලු සෙසු නිලයින් 17 දෙනෙකු ජීවිතක්ෂයට පත් විය. දැනට මෙම බළඇණිය උතුරු කෝපායි ප්‍රදේශයේ රාජකාරියේ නිරතව සිටී

## 7 ශ්‍රීලපාහ

මෙම ඒකකය ඉදිරි පිම්ම ක්‍රියාන්විතයෙන් පසු 1995.10.17 දින පැවැති "රිවිරැස" ක්‍රියාන්විතයට සහභාගී වූ අතර, නිලධාරී දෙදෙනකු ඇතුලු සෙසු නිලයින් 29 දෙනෙකු ජීවිතක්ෂයට පත් විය. මෙම ඒකකය දැනට කෝපායි දකුණු ප්‍රදේශයේ ස්ථානගත ව සිටී.

## 8 ශ්‍රීලපාහ

මෙම ඒකකය රිවිරැස මෙහෙයුමට සහභාගී වූ අතර, නිලධාරී දෙදෙනකු ඇතුලුව සෙසු නිලයින් 24 දෙනෙකු ජීවිතක්ෂයට පත් විය. දැනට මෙම ඒකකය තිර්වේලි ප්‍රදේශයේ රාජකාරියේ නිරතව සිටී.

## 10 ශ්‍රීලපාහ

මෙම ඒකකය "රිවිරැස" මෙහෙයුමට සහභාගී වූ අතර, දැනට මාදගල් ආරක්ෂක වලල්ලේ රාජකාරියේ නිරතව සිටී.

## 2 (සෙව්) ශ්‍රීලපාහ

මෙම ඒකකය දැනට 3 වන සේනාංකය වාලච්චේන ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටී.

## 5 (සෙව්) ශ්‍රීලපාහ

මෙම ඒකකය දැනට පුල්මුඩේ ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටී.

## 9 (සෙව්) ශ්‍රීලපාහ

දැනට මෙම ඒකකය ක්‍රියාන්විත රාජකාරි සඳහා ඉලෙයිකාඩු ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටී.

# 1 ශ්‍රීලපාහ පූනරීන් ප්‍රදේශයෙහි පිහිටීම හා වැදගත්කම

ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් විසින් අත්පත්කරගෙන සිටින උතුරු නැගෙනහිර ප්‍රදේශයන් අතර, වැදගත්කම අතින් පූනරීන් ප්‍රදේශයට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. ත්‍රස්තවාදී පාලන කටයුතු, ප්‍රවාහන කටයුතු හා තුන් පැත්තකින් ජලයෙන් වටවී එක් පැත්තකින් පමණක් රටේ ප්‍රධාන ගොඩබිම හා සම්බන්ධ වී තිබීම නිසා කඳවුරක් පිහිටුවා ගෙන ස්වාධීනව සිටීම සඳහා ඇති සාධකයන් ද පිළිබඳව සලකා බැලීමේ දී, ත්‍රස්තවාදීන්ටත්, ඉහත සියළුම අවස්ථාවන් ත්‍රස්තවාදීන්ගෙන් පැහැර ගැනීම පිළිබඳව සලකා බැලීමේ දී ආරක්ෂක හමුදාවන්ටත් පූනරීන් ප්‍රදේශය සිය පාලනය යටතට ගැනීමේ වැදගත්කම සුවිශාල ය.

ලංකාවේ උතුරු පළාත් සීමාවේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පූනරීන් ප්‍රදේශය ප්‍රධානභූමියේ සිට වයඹ දෙසට විහිදී ගොස් තුන් පැත්තකින් කරදියෙන් වටවී "පූනාකරි" ප්‍රදේශයට මුහුණලා ගොඩබිම හා සම්බන්ධ වී ඇත. පූනරීන් ප්‍රදේශයේ සිට කිලෝ මීටර 8 ක් පමණ මුහුදු ගමණකින් පසුව යාපනය ප්‍රධාන නගරයටත් කිලෝ මීටර් 6 ක් පමණ එවන් ගමනකින් පසුව මන්ඩතිව් ප්‍රදේශයටත් ලඟාවිය හැක. වර්ග කිලෝ මීටර් 80 කට අධික භූමි ප්‍රදේශයකින් සමන්විත පූනරීන් ප්‍රදේශය එවකට අඩු ජනගහනයකින් යුක්ත වූ අතර, වැඩිපුර බිම් ප්‍රදේශයක් හීන් වැල්ලෙන් වැසී ගොස් පොල් වගාවෙන් හා සරුවට වැඩුණු කටු සහිත පඳුරින් ගහනව ඇත.

වත්මන් යුද්ධයේ දී භෞතික වශයෙන් හා උපක්‍රමික වශයෙන් පූනරීන් ප්‍රදේශයෙන් ත්‍රස්තවාදීන් හට ලද හැකි පූළුල් සේවය යාපනය කලපුව හා නොබිඳිය හැකි අයුරින් බැඳී ඇත. ආරක්ෂක හමුද ඇඟිලි ගැසීමකින් තොරව යාපනය හා සම්බන්ධතාවය පවත්වා ගැනීමටත්, යුධ පුහුණු කඳවුරක් හෝ ප්‍රධාන යුධ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමටත් විශේෂයෙන්ම ස්වාධීන රාජ්‍යයක ප්‍රතිරූපයක් යාපනය ජනතාව හා එල්ටීටීඊයේම සාමාජිකයන් වෙත හුවා දැක්වීමටත් ත්‍රස්තවාදීන්ට "පූනරීන්" වෙතින් කදිම අත කොලුවක් සපයා ගත හැක.

ත්‍රස්තවාදීන්ට පූනරීන් ප්‍රදේශයේ ඇති මෙම වැදගත් කම පිළිබඳව සලකා එයට බාධකයක් සැපයීමේ දී ඒ හා තරමට ම රජයේ හමුදාවන්ටත් මෙම ප්‍රදේශය වැදගත් වන අතර, ඒ හේතුව නිසාම දෙවන ඊලාම් යුද්ධය පටන් ගන්නා විට අත්හැර දමා තිබූ මෙම ප්‍රදේශය නැවත ආරක්ෂක හමුද පාලනය යටතට ගන්නා ලදී.

ආරක්ෂක හමුද පාලනය යටතට පූනරීන් ප්‍රදේශය නතුවීම නිසා මුලතිව්, මන්නාරම්, වන්නි හා නැගෙනහිර ප්‍රදේශයන්හි ත්‍රස්ථවාදී කණ්ඩායම් යාපනය ප්‍රදේශයේ සිය සාමාජිකයන් සමග පවත්වාගෙන ආ සම්බන්ධතාවයට නොදැරිය හැකි පහරක් එල්ල විය. මෙයට පිළියම් යෙදීම වස්, ඔවුන් කිලාලි කලපුව හරහා පූනරීන් ප්‍රදේශය මඟහරවමින් ප්‍රවාහන කටයුතු අරඹන ලදී. මෙම ප්‍රවාහන කටයුතු, අවසානයේ දී - ප්‍රවාහන සේවයක් දක්වා වර්ධනය වී ත්‍රස්තවාදීන්ට ධන උල්පතක් සැදූ අතර, පූනරීන් ප්‍රදේශය නතුකර ගත් ආරක්ෂක හමුද නාගතිවන්තුරේ නාවුක කඳවුරක් පවත්වා ගනිමින් ත්‍රස්තවාදී යාත්‍රා වෙත දැඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. මෙම ප්‍රහාරයන් නිසා ඔවුන් හට සිදු වූ අලාභහානිය අතිමහත් වූ අතර,ප්‍රවාහන කටයුතු විධිමත්ව කරගෙන යාමට නොහැකි විය.

නැති වූ පූනරීන් ඒකාධිකාරිය නැවත ගොඩ නගා ගැනීමත්, යාපනය හා සෙසු පළාත් අතර තිබූ සම්බන්ධතාවය නැවත ගොඩ නගා ගැනීමත් ප්‍රවාහන කටයුතු බාධාවකින් තොරව සිදු කිරීමත් උදෙසා ප්‍රහාරයක් දියත් කොට පූනරීන් ප්‍රදේශය අල්ලා ගැනීමට ත්‍රස්තවාදීන් තීරණය කරණ ලදී. ආරක්ෂක හමුද දියත් කරන ලද ක්‍රියාන්විත හේතුවෙන් ප්‍රහාරය දිනෙන් දින කල්ගිය අතර, දත්තයන් රැස් කිරීමට පූනරීන් කඳවුර තුලට වරින් වර රිංගා ඇතුලු වූ ත්‍රස්තවාදීන් 25 කට අධික පිරිසක් අරක්ෂක හමුදාව විසින් වරින් වර කඳවුර තුල දීම මරා දමන ලදී. කෙසේ වෙතත් දීර්ඝ කාලයක් තිස්සේ කල්යල් බැලූ ත්‍රස්තවාදීන් විසින් ලක් ඉතිහාසයේ මෙතෙක් කෙරුණු දරුණුම සංග්‍රාමයට මං පෙත් හෙළි කරමින් 1993.11.11 දින පූනරීන් කඳවුරට ඒ මහා දැවැන්ත ප්‍රහාරය එල්ල විය.

ප්‍රහාරය එල්ල වන අවස්ථාවේ පූනරීන් කඳවුරේ 1 ශ්‍රීලපාහ සහ 3 ගරේ ඒකකයන් ද 200 ක් පමණ වන නාවුක භට පිරිසක් ද ස්ථානගත ව සිටි අතර, ප්‍රහාරය පිළිබඳව ඊට පෙර සිටම සැක කටයුතු සිදුවීම් බොහෝමයක්ම නිරීක්ෂණය වූණි. කඳවුර තුලට වරින් වර ත්‍රස්තවාදීන් රිංගා ඇතුලුවීම, ත්‍රස්තවාදී බෝට්ටු ගමනා ගමනය වර්ධනය වීම, බර වාහන අධිකව ගමන් කිරීම, බඩුබාහිරාදිය ගොඩබෑම නිරීක්ෂණය වීම, ප්‍රහාරයට පෙර දින රාත්‍රියේ ගස් කැපීම් ඇතුලූ නොයෙකුත් ශබ්ද අධිකව ඇසිය හැකිවීම හා ත්‍රස්තවාදී නායකයන් හා කණ්ඩායම් පූනරීන් ප්‍රදේශයට එක්රැස් වීම පිළිබඳව බුද්ධි තොරතුරු ලැබීම ආදිය නිසා ත්‍රස්ථවාදී ප්‍රහාරයක් පිළිබඳව භට පිරිස් විමසිලිමත් වූණි. ප්‍රහාරයට දින කිහිපයකට පෙර ශ්‍රීලපාහ විශේෂ ක්‍රියාන්විත කණ්ඩායමක් (එස්ඕපී) කඳවුරට පැමිණි අතර, ඔවුන් 1 ශ්‍රීලපාහ හා 3 ගරේ ඒකකයන් සමග ස්ථානගත කරවන ලදී.

## ප්‍රහාරය

1 ශ්‍රීලපාහ ඒකකයේ උපක්‍රමික සීරුව දිනපතා 2400 පැයේ සිට 0300 පැය දක්වා වූ අතර, ප්‍රහාරය එල්ල කරන මොහොතේ භට පිරිස් සියල්ලක්ම උපක්‍රමික සීරුවේ යෙදී සිටි අතර, 1993.11.11 දින 0110 පැයේ සිට 1 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම ස්ථානගතව සිටි මුහුදු තීරයේ බෝට්ටු ශබ්ද බහුලව නිරීක්ෂණය වූණි. 0110 පැයට පමණ එම කණ්ඩායම බල ප්‍රදේශයේ මුර පලකට පිටුපසින් පැමිණි ත්‍රස්තවාදීන් (පූනරීන් කඳවුර තුලට ඒ වනවිට රිංගා සිටි) ප්‍රහාරයක් එල්ල කරන ලදී 1 ශ්‍රීලපාහ "සී" කණඩායම සමග ස්ථානගතව සිටි විශේෂ ක්‍රියාන්විත කණ්ඩ භට පිරිස් ශබ්දය ආ දෙසට ගමන් ගැනීමේ දී ත්‍රස්ථවාදී රැක සිටි පහරදීමකට ගොදුරු වන ලදී. මේ මොහොතේ ම ත්‍රස්තවාදීන් 300 -400 ක් පමණ පිරිසක් ප්‍රහාර එල්ල කරමින් මුහුදින් පැමිණ ගොඩ බැස තව තවත් ත්‍රස්තවාදීන් මුහුදින් ගෙන්වා ගනිමින් මුහුදු තීරයේ සිට දෙපසට පැතිරෙන ලදී. මුහුදින් ගොඩ බසින ලද ත්‍රස්තවාදීන් එවකට පූනරීන් කඳවුරේ පිහිටා තිබූ සිවිල් අනාථ කඳවුරු හරහා පැමිණ 1 ශ්‍රී ලපාහ ඒ හා බී කණ්ඩාම් පිටුපසින් දැඩි ප්‍රහාර එල්ල කරන ලදි. මේ මෙහොතේම 1 ශ්‍රීලපාහ ඒ, සී සහ 3 ගරේ ඒ කණ්ඩායම් ඉදිරියෙන් ද දැඩි ප්‍රහාර එල්ල කරන ලද අතර, සංගුපිටිය හා නාගතිවන්තුරේ නාවික කඳවුරු වෙතටත් දැඩි ප්‍රහාර එල්ල කරන ලදී. ආධාරක වෙඩි සහාය (81 මිමි මෝටාර්) හැකි සෑම ස්ථානයකටම ලබා දෙන ලද අතර, 10 වන බලසේනා මූලයට හා 21 වන බලසේනා



සැම තැනම මැරී වැටී තිබූ ත්‍රස්තවාදීන්ගේ මළ සිරුරු කිහිපයක්

මූලයට ප්‍රහාරය පිළිබඳව ගුවන් විදුලි යන්ත්‍ර මගින් දැනුම් දෙන ලදී. 0140 පැය පමණ වන විට සන්නද්ධ රථ, කාලතුවක්කු මෝටාර් (120 මිමි මෝටාර්) කණ්ඩ හා බළඇණි මූලස්ථාන වෙත ද ප්‍රහාර එල්ල කරන ලද අතර, මේ වනවිට අලිමංකඩ හමුද කඳවුරේ සිට 130 මිමි කාතු සහාය වෙරළ තීරයට ලැබුණි.

සන්නද්ධ රථ ගාල වෙත අධික පිරිසක් යොද ගනිමින් දැඩි ප්‍රහාරයන් එල්ල කල ත්‍රස්තවාදීන් එම ප්‍රදේශය අත්පත් කර ගනිමින් කාලතුවක්කු අණුකණ්ඩය වෙත ද ආර්පීජී අවි 20 ක් පමණ එකවර යොද ගනිමින් ප්‍රහාරයක් එල්ල කරන ලදී. 0200 පැය වන විට කාලතුවක්කු අණුබන්ධ ප්‍රදේශය සියතට ගත් ත්‍රස්තවාදීන් 120 මිමි මෝටාර් අවි යොද ගනිමින් ආරක්ෂක වලල්ලට ප්‍රහාර එල්ල කරන ලදී.

ඉහත ප්‍රහාරයන් එල්ල කරන අවස්ථාවේම ක්‍රියාන්විතයට සහභාගී වූ අධික සංඛ්‍යාව උපයෝගී කර ගනිමින් 3 ගරේ අනි නිවස්නය, බනි/සැරයන් නිවස්නය හා 1 ශ්‍රීලපාහ බනි/සැරයන් නිවස්නය වෙත ද ප්‍රහාර එල්ල කොට 0300 පැය වන විට එම ස්ථාන ද අත්පත් කර ගැනීමට ත්‍රස්තවාදීන් සමත්විය.

81 මිමි මෝටාර් සහාය මේ වන විටකණ්ඩායම් නිලධාරී අණදෙන්නන් ඉල්ලා සිටිය ද ආධාරක කණ්ඩායම් බල ප්‍රදේශය වෙත එල්ල වෙමින් තිබූ දැඩි ප්‍රහාර හේතුවෙන් ආධාරක වෙඩි සහාය අවශ්‍ය ඉලක්කයන් කරා ලබාදීමට නොහැකි වුණි.

1 ශ්‍රීලපාහ සංඥා මැදිරියේ සිට මීටර් 25 ක් පමණ දුරින් තිබූ 1 ශ්‍රීලපාහ නිලධාරී නිවස්නය අසලට ද මේ වන විට ත්‍රස්තවාදීන් පැමිණ සිටිඅතර, 1 ශ්‍රීලපාහ බළඇණි මූලස්ථානය බී සහ සී කණ්ඩායම් අතර,පමණක් ගුවන් විදුලි සම්බන්ධතාවය පැවතුණි. බී සහ සී කණ්ඩායම් විසින් බළඇණි මූලස්ථානය වෙත එල්ල වී ඇති තර්ජනය පිළිබඳව නොදැන ආධාර ඉල්ලා සිටින ලද අතර, කාලතුවක්කු අණුකණ්ඩ පතුරොම් ගබඩාව මහා පිපිරුම් හඬක් සමගින් මේ මොහොතේ ත්‍රස්තවාදීන් විසින් පුපුරුවා හරින ලදී.

0500 පැය වන විට 1 ශ්‍රීලපාහ සී කණ්ඩායම වෙත එල්ල වූ ප්‍රහාරය මැඩ පවත්වා ගැනීමට එම කණ්ඩායම් බලප්‍රදේශයට රැස්ව සිටි පිරිස සමත් වූ අතර, ත්‍රස්තවාදී මල සිරුරු හා අවි ආයුධ ද එක් රැස් කර ගන්නා ලදී. කාලතුවක්කු අණුබණ්ඩයේ තිබූ අවි සහ පතුරොම් එක්රැස් කර ගැනීමට ත්‍රස්තවාදීන් යුහුසුළු වූ අතර,ඒ දෙසට 81 මිමි මෝටාර් හා ආර්සීඑල් ප්‍රහාරයක් එල්ල කිරීමට 1 ශ්‍රීලපාහ බළඇණි මූලස්ථානයට එක්වී සිටි භට පිරිස් සමත් විය. දැඩි ප්‍රහාර හමුවේ කාලතුවක්කු අණුබන්ධ ප්‍රදේශයේ සිටි ත්‍රස්ථවාදීන් මදක් පසු පසින ලදී. මේ අවස්ථාවේ දී 1 ශ්‍රීලපාහ සංඥා මැදිරිය දෙසට හැකි උපරිම අයුරින් ලඟා වූ ත්‍රස්තවාදීන් ඒ දෙසට සුළු අවි හා සුයාතු අවි මගින් ප්‍රහාරයක් එල්ල කරන ලදි. පවතින තත්වය අනුව 1 ශ්‍රීලපාහ සංඥා මැදිරියේ තව දුරටත් රැඳි සිටීම අපහසු වූ හෙයින් 3 ගරේ සංඥා මැදිරියට යාමට 1 ශ්‍රීලපාහ අනි තීරණය කරන ලදී. 3 ගරේ 2 අනි භට ද වෙඩි වැදී ඇති බවට මෙ අවස්ථාවේ දී තොරතුරු ලැබුණු අතර, තව දුරටත් සංඥා සම්බන්ධතාවය පවත්වාගෙන සිටි භට පිරිස් වෙත ස්ථාන මාරුව පිළිබඳව දැනුම් දී රැගෙන යා නොහැකි ගුවන් විදුලි යන්ත්‍ර විනාශ කොට ඒ ප්‍රදේශයට බෝම්බ දමන ලෙස ප්‍රහාරක ගුවන් යානා වෙත උපදෙස් ලබාදී 1 ශ්‍රීලපාහ අනි ඇතුළු පිරිස 3 ගරේ සංඥා මැදිරිය වෙත ගොස් එහි ස්ථානගත වන ලදී.

ගුවන් යානා ප්‍රහාරයන් ඉතාමත් සාර්ථකව සතුරු ඉලක්කයන් දෙසට යොමුවීම නිසා ත්‍රස්තවාදීන් 1 ශ්‍රීලපාහ මූලස්ථානය අවට අත්පත් කරගෙන සිටි යම් යම් ප්‍රදේශයන් අත්හැර පසු බසින ලදි. එම ප්‍රදේශයන් වෙත භට පිරිස් යවා නැවතත් බලය තහවුරු කර ගැනීමට ආරක්ෂක හමුදවන් සමත්විය. 0830 පැයට පමණ ත්‍රස්තවාදීන් ඔවුන් විසින් අත්පත් කර ගන්නා ලද යුධ ටැංකි පණ ගන්වා රැ ගෙන යනු නිරීක්ෂණය විය.

දරුණු ප්‍රහාර හේතුවෙන් ආරක්ෂක වලල්ල තවදුරටත් රැකගෙන සිටීමට නොහැකි වූ 3 ගරේ භට පිරිස් බළඇණි මූලස්ථානය කරා පැමිණෙමින් සිටි අතර, මග රැකසිටි ත්‍රස්තවාදීන් එම භට පිරිස් වෙත උපරිම බලය යොදමින් ප්‍රහාර එල්ල කරන ලදි. 3 ගරේ අවි ගබඩාවේ තිබූ අවි සහ වෙඩි ද්‍රව්‍ය පටවාගෙන යන ත්‍රස්තවාදී ට්‍රැක්ටරයකට ප්‍රහාර එල්ල කර විනාශ කිරීමට භට පිරිස් සමත් වූ අතර, 3 ගරේ ඒ,බී සහ සී කණ්ඩායම් වලට අයත් නිලධාරී / සෙනින් පිරිසක් 1000 පැයට පමණ 1 ශ්‍රීලපාහ බී සී සහ ඩී කණ්ඩායම් වලට අයත් නිලධාරී / සෙනීන් පිරිසක් 1100 පැයට පමණ ද මූලස්ථාන ප්‍රදේශයට පැමිණි අතර, ඔවුන් සුදුසු පරිදි ස්ථාන ගතකරවන ලදී. එම භට

පිරිස් අතර, තුවාල කරුවන් විශාල පිරිසක් සිටි අතර, හැකි උපරිම අයුරින් ඔවුන් හට ප්‍රතිකාර ලබාදෙන ලදී.

මූලස්ථාන ප්‍රදේශයට පැමිණි එම හට පිරිස් යොද ගනිමින් ඒ වන විට ත්‍රස්ථවාදීන් අත්පත් කරගෙන සිටි කාලතුවක්කු අණුබණ්ඩ ප්‍රදේශයට ප්‍රහාරයක් එල්ල කොට 120 මිමි මෝටාර් අවි 03 ක් සහ එම මෝටාර් බෝම්බ 200 ක් සමග එම ප්‍රදේශය නැවතත් 1500 පැයට පමණ අත්පත් කර ගන්නා ලදී. 120 මිමි මෝටාර් අවියක් එම ටියුබයක් සහ එම මෝටාර් බෝම්බ සුළු ප්‍රමාණයක් ත්‍රස්තවාදීන් විසින් පැහැරගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වූ අතර, 1530 පැයට පමණ අත්පත් කර ගන්නා ලද 120 මිමි මෝටාර් අවි 3 ගරේ සංඥා මැදිරිය අසලට ගෙනවිත් ස්ථානගත කර ඉතිරි වී සිටි කාලතුවක්කු සෙනින් රාජකාරියේ යොදවන ලදී.

ඉතා ආසන්නයේ සිට එල්ලවන ලද ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් හෙලි යානා ගොඩ බැස්සවීමට නොහැකිවීම නිසා හට පිරිස් යොදවා හෙලි යානා අංගනයේ සිට උතරු හා වයඹ දෙසට මීටර් 500 ක පමණ ප්‍රදේශයක් අත්පත් කර ගන්නා ලදී. නමුත් තව දුරටත් හෙලි යානා බැස්සවීමට තරම් ආරක්ෂාව නොමැති වූ හෙයින් ගුවනේ සිට පතුරොම් සහ ආහාර පෙට්ටි බිම හෙලන ලදී. පතුරොම් පෙට්ටි ආරක්ෂක හමුද ඒ වන විට අත්පත් කරගෙන සිටි සීමාවෙන් පිටතට වැටුණු අතර, එක ආහාර පෙට්ටියක් පමණක් නියමිත ඉලක්කයට එල්ල වුණි.

අලිමංකඩ කඳවුරේ සිට ලබාදෙන 130 මිමි කාලතුවක්කු සහාය අවශ්‍ය ස්ථානයන් කරා එල්ල කරවා ගන්නා ලද අතර, "කොමා" නමින් හඳුන්වන ලබන ප්‍රදේශයේ මුහුදු වෙරලට ආසන්නව එක්රැස් වන ලද හට පිරිසක් විසින් වට ආරක්ෂාව යොද ගනිමින් ස්ථානගතව සිටින බව මූලස්ථානය වෙත දැන ගන්නට ලැබිණි.

2000 පැයේ සිට පසුද අලුයම වන තෙක්ම නැවත වරක් ත්‍රස්තවාදීන් විසින් සිව් දිශාවෙන්ම දිගින් දිගටම ප්‍රහාර එල්ල කරන ලදී. 2030 පැයට පමණ 3 ගරේ 2 අනි සිදු වූ තුවාලයෙන් අධික ලෙස රුධිරය වහනය වීම නිසා මියයන ලදි. 1993.11.12 දින 0600 පැයට පමණ ගුවනින් ආහාර හා පතුරොම් හෙලන ලද අතර, පෙර අවස්ථාවන්ට වඩා ඉලක්කයන් සාර්ථ විය. ත්‍රස්ථවාදීන් සැඟවුණු වෙඩිකරුවන් විසින් වරින් වර ප්‍රහාර එල්ල කිරීම නිසා සෙනින් කීප දෙනෙකු මිය ගිය අතර, තවත් සෙනින් කීප දෙනෙකුට තුවාල සිදුවිය.

කඳවුර තුළ තිබූ 3 ගරේ 2 අනිගේ මෘත දේහය ඇතුළු ආරක්ෂක හමුද නිලධාරී / සෙසු නිලයින්ගේ මෘතදේහ 49 ක් එදින 1700 පැයට පමණ 3 ගරේ මූලස්ථානය අසල සුදුසු භූමියක් තෝරාගෙන ආචාර වෙඩි මුර පවත්වා හැකි උපරිම ගෞරවාන්විත ආකාරයට භූමදානය සිදු කරන ලදී. ත්‍රස්තවාදීන් විශාල සංඛ්‍යාවක් යාපනය, මන්නාරම සහ කිලිනොච්චිය ආදී ප්‍රදේශයන්හි සිට පුනරින් ප්‍රදේශයට පැමිණ ඇති බවත්, දිගාන් තුනකින් ආරක්ෂක හමුද අත්පත් කරගෙන සිටි කුඩා භූමි භාගය වෙත ප්‍රහාර එල්ල කිරීමට සැරසෙන බවත් ත්‍රස්ථවාදී ගුවන් විදුලි සංවාද ශ්‍රවණය කිරීම සඳහා ප්‍රයෝජනයට ගත් ගුවන් විදුලි යන්ත්‍ර මාර්ගයෙන් දැනගැනීමට හැකිවිය.

1800 පැයට පමණ සතුරු මෝටාර් ප්‍රහාර දරුණු ලෙසින් කඳවුරු තුළට එල්ල වූ අතර, ආර්පිජී, ආරුල්, 50 මිමි, ජීපීඑම්ජී අවි සහ අත් බෝම්බ ප්‍රහාරයන් සිව් දෙසින්ම කඳවුරට එල්ල විය. දැඩි ප්‍රහාර එල්ල කරමින් කෙසේ හෝ ආරක්ෂක හමුද අත්පත් කරගෙන සිටි භූමි ප්‍රදේශයට ඇතුළුවීමට ත්‍රස්තවාදීන් ප්‍රබල උත්සාහයක යෙදුන ද එය ව්‍යවර්ථ විය. මේ අවස්ථාවේ ඉතා විශිෂ්ඨ ලෙස ගුවන් හමුද ප්‍රහාරක යානා මගින් කඳවුර අවට ඉලක්කයන් වෙත ප්‍රහාර එල්ල කරන ලදි. අලිමංකඩ හමුද කඳවුරේ සිට 130 මිමි කාලතුවක්කු ආධාර ද මැනවින් ලබාදෙන ලදී. කඳවුර තුළ තිබූ පතුරොම්, බෝම්බ හා මෝටාර් ප්‍රමාණය ඉතා සීග්‍රයෙන් පහල බැස තිබූ අතර, ඉතිරිව තිබූ සුළු ප්‍රමාණයෙන් හැකි උපරිම ඵල නෙලා ගැනීමට හට පිරිස් සමත් විය. මෙදින රාත්‍රිය අවසන් වන විට කඳවුරේ සිටි හට පිරිසෙන් 40 දෙනකු පමණ තුවාල ලැබූ අතර,ඉන් කීප දෙනෙකු මිය යන ලදි.

1993.11.13 දින ද අවිනිශ්චිත ලෙස උදාවුණ අතර, ත්‍රස්තවාදී මල සිරුරු විශාල ප්‍රමාණයක් කඳවුර අවට තැනින් තැන වැටී තිබෙනු දක්නට ලැබිණි. පෙර දින රාත්‍රියේ ආරක්ෂක හමුද ප්‍රහාරයන්ට ලක්වීමෙන් ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් මිය ගොස් ඇති බවත් ඔවුන්ගේ කණ්ඩායම් සීසීකඩ වී ඇති බවත්, වෛද්‍යාධාර හා ආහාර නොලැබී ඇති බවත් ත්‍රස්තවාදී පණිවුඩ හුවමාරු මගින් දැනගන්නට ලැබුණ අතර, තැන තැන විසිරී ගොස් සිටි ත්‍රස්තවාදී කණ්ඩායම් විසින්



120 මිමි මෝටාර් සහ අනෙකුත් අවි වලින් සතුරු ප්‍රහාරය මර්ධනය කළ ආකාරය මේජර් ජෙනරාල් රොහාන් දළුවත්ත හට විස්තර කරන අයුරු



1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී, දෙවන අණදෙන නිලධාරී සහ 3 ගජබා කපිතන් ජ්‍යම්යු සිල්වා ජය මොහොතක ඉදිරියේ

කඩිනම් ආධාර සපයන ලෙසට ඔවුන්ගේ ප්‍රධාන මධ්‍යස්ථාන වෙතට කරන ලද ඇමතුම් ද ශ්‍රවණය කිරීමට හැකි විය. අවශ්‍ය තරම් පතරොම්, වෙඩි ද්‍රව්‍ය ආහාර පාන නොමැතිව අවිනිශ්චිත වාතාවරණයක් මැද සිටිය ද ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තු බිඳි නොගිය ආරක්ෂක හමුද හට පිරිස් ඉතාමත් විමසිල්ලෙන් ඊළඟ ත්‍රස්ථවාදී ප්‍රහාරයට සූදනම් වන්නට විය.

මෙදින 1030 පැයට පමණ සහයක බලඇණි මුහුදින් පැමිණ "කොමාර්" ප්‍රදේශයට නුදුරින් ගොඩ බසින බවට තොරතුරු ලැබුණි. වරින් වර ත්‍රස්ථවාදීන් එල්ල කරන ලද සුළු අවි සහ මෝටාර් ප්‍රහාරයන් මැද විශේෂ සිදුවීමක් නොමැතිව 13 දින රාත්‍රිය ද ගෙවිනි.

1993.11.14 දින 0900 පැයට පමණ තැනින් තැන වැටී බොහෝ සේ නරක් වී තිබූ ආරක්ෂක හමුද මළ සිරුරු තැනකින් තැනකට රැගෙන යා නොහැකි වූ හෙයින් එම ස්ථානයන්හිම භූමිදනය කරන ලදී.

1400 පැයට පමණ දෙවන සේනාංකාධිපති සහ 3 ශ්‍රීලපාහ, 6 ගැහේබ හට පිරිස් සහායට පැමිණෙන ලදී. පැමිණි හට පිරිස් යොදවා හෙලි යානා අංගණයේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු යොදන ලදී. 1600 පැයට පමණ 212 හෙලි යානයක් පතුරෙම්/වෙඩි ද්‍රව්‍ය රැගෙන හෙලි අංගණයට ගොඩ බසින ලද අතර, තුවාල කරුවන් කීප දෙනකු එමගින් රැගෙන යන ලදී. මෙම අවස්ථාවේදී ද හෙලි යානා අංගන ප්‍රදේශයට ත්‍රස්වාදීන් මෝටාර් ප්‍රහාරයක් එල්ල කරන ලදි. වරින් වර පැමිණි හෙලි යානා මගින් තුවාල කරුවන් 30 දෙනකු පමණ ප්‍රතිකාර සඳහා යැවිය හැකිවිය. 1630 පැය වනවිට ආධාර සඳහා පැමිණි 4 ශ්‍රීලපාහ හට කණ්ඩායම් කඳවුරේ දකුණු දිශා ප්‍රදේශයෙන් ස්ථාන ගත වන ලදී. එතැන් සිට කිසිදු ත්‍රස්ථවාදී ප්‍රහාරයක් මූලස්ථාන කඳවුර හා "කොමාර්" කඳවුර වෙත එල්ල නොවූ අතර, ත්‍රස්තවාදීන් පසුබැස ඇති බවට තොරතුරු අනාවරය විය. මෙහි දී සිදු වූ විශේෂ සිදුවීමක් නම් ආධාරක හට පිරිස් පැමිණෙන මොහොතේ හෝ පැමිණි පසු ත්‍රස්ථවාදී ප්‍රහාර එල්ල නොවීමය

## ත්‍රස්ථවාදී සැලැස්ම හා උපක්‍රම:-

ප්‍රහාරයට මාස 6 කට පමණ පෙර සිට විමර්ශණ කටයුතු ආරම්භ කර ඇති අතර, 35 දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් විමර්ශණය සිදු කර ඇත. 10 දෙනෙකු බැගින් කණ්ඩායම් 3 ක් ලෙස ආරියාලේ, තන්ත්තිලප්පු හා නාගතිවන්තුරේ යන තුන් පැත්තකින් මොවුන් විමර්ශණය කර ඇති අතර, 5 දෙනෙකු කෑම බීම හා වෙනත් අවශ්‍යතාවයන් සැපයීමට නම් කර ඇත.

මොවුන්ගේ කාර්‍යය වී ඇත්තේ කඳවුරේ පිහිටීම, කඳවුරට රිංගා ඇතුළු විය හැකි ස්ථාන, ඇතුල් වීමෙන් පසු සැඟවී සිටිය හැකි ස්ථාන, කඳවුරේ දෛනික සිදුවීම, චර්යාවන් හා පහසුවෙන් ප්‍රහාර එල්ල කළ හැකි ස්ථාන පිළිබඳව විමර්ශනය කර "ශශී කුමාර් මාස්ටර්" හට දැනුම් දීමය. ඔහු විසින් අදල විස්තර "පොට්ටු අම්මාන්" හට ලබා දී ඇත. විමර්ශණ කණ්ඩායම් දහවල් කාලය තුළ කැලෑබදව සැඟවී සිට රාත්‍රි කාලයේ විමර්ශණය සිදු කර ඇත.

## ප්‍රහාරයට සහභාගී වූ කණ්ඩායම් --

පොට්ටු අම්මාන්, ස්වර්නන්, සහ සූසෙ විසින් ප්‍රහාරය සැලසුම් කර ඊට නායකත්වය ලබා දී ඇත. තමිල් වෙල්වම් සහ ජේයම් පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

පහත දක්වා ඇති අනුනායකයින් 15 දෙනකු යටතේ ප්‍රහාරය එල්ල කිරීමට සැලසුම් කර ඇත.

| අනු අංක | කණ්ඩායම් නායකයාගේ නම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජාන් (මන්නාරම) | 250 |
| 02 | කෙන්ගා | 100 |
| 03 | අන්බු | 400 |
| 04 | මහාත් | 150 |
| 05 | තීපන් | 600 |
| 06 | මල්ලී | 40 |
| 07 | ඩේවිඩ් (මුහුදු කොටි) | 250 |
| 08 | කුනම් අන්නා (මඩකලපුව) | 150 |
| 09 | බාතු | 200 |
| 10 | ජේනා අක්කා (කාන්තා) | 500 |
| 11 | මාවි | 30 |
| 12 | නිශාම් | 250 |
| 13 | සෙන්මලම් | 250 |
| 14 | කුනා | 250 |
| 15 | කමිලෝ | 45 |

කඳවුරට පළමු ප්‍රහාරය එල්ල කිරීම සඳහා ඉහත සඳහන් කර ඇති කණ්ඩායම් කෙලින්ම යොදවා ගෙන ඇති අතර, තුවාල

කරුවන් රැගෙන යාම, අත්අඩංගුවට ගත් අවි/ආයුධ රැගෙන යාම සහ කෑම බීම ලබා දීම සඳහා දල වශයෙන් 250 කින් යුත් ආධාරක කණ්ඩායමක් ද පැමිණ ඇත. මොවුන් අතරට කාන්තාවන් 50 ක් පමණ ද ත්‍රස්තවාදී ග්‍රාම ආරක්ෂක භටයින් 150 ක් පමණ ද සිවිල් පුද්ගලයින් හා පාසැල් ළමුන් ද ඇතුළත් වී ඇත.

## නියෝග ලබාදීම:-

ප්‍රහාරයට පෙර පොට්ටුඅම්මාන්, ස්වර්ණන් සහ සූසේ විසින් ප්‍රහාරක හා ආධාරක කණ්ඩායම් වෙත වෙන වෙනම උපදෙස් හා නියෝග ලබා දී ඇත. පසුව සියළුම කණ්ඩායම් නායකයින් එක්රැස් කර අනු අංක 1 සිට 06 දක්වා නායකයින් හට තනන්තිලප්පු විමර්ශණ කඳවුරේ දී අණු අංක 07 සිට 15 දක්වා නායකයින් හට පූනරීන් ප්‍රදේශයේ දී ප්‍රහාරයට දින 02 කට පෙර පොදුවේ ඔවුන් කළ යුතු කාර්යයන් හඳුන්වා දී ඇත. සෑම කණ්ඩායමක්ම 15 දෙනා බැගින් අණුකණ්ඩායම් වලට බෙද තිබූ අතර, එම අණු කණ්ඩායම් ද 07 ක් සහ 08 ක් (හෝ ඊට වැඩි/අඩු ගණන්) වන පරිදි කොටස් දෙකකට බෙද ඇත.

## ප්‍රහාරය සඳහා පැමිණීම:-

කෙන්ගා, ජාන්, අන්බු යන කණ්ඩායම් ආරියාලේ සිට බෝට්ටු මගින් ද මගාන්, තිපන්, මල්ලි යන කණ්ඩායම් තනන්තිලප්පු සිට ද අනෙක් සියලුම කණ්ඩායම් පල්ලිකුලම් හා පූනරීන් දෙසින් ද පා ගමනින් පැමිණ ඇත.

ප්‍රහාරයට පැමිණි සියලුම කන්ඩායම් අතරින් එක් විමර්ශ ණ සාමාජිකයා බැගින් ප්‍රහාරයට පෙර දින කඳවුරට ඇතුලු වී ආරක්ෂා සහිතව ස්ථාන වලින් තම කණ්ඩායම් කඳවුර තුලට ගෙන ඒම තහවුරු කරගෙන ඇත. මීට අමතරව ජාන්, කෙන්ගා, අන්බු යන කණ්ඩායම්, ප්‍රහාරයට පැයකට පමණ පෙර කඳවුරට ඇතුල් වී ඇති අතර අනෙක් සියලුම කණ්ඩායම් ආරක්ෂක වලල්ලට නුදුරින් ප්‍රහාරයට සූදනම්ව ස්ථානගත වී ඇත.

## ප්‍රහාරය ආරම්භ කිරීම:-

ප්‍රහාරය ආරම්භ කිරීමට යොදගත් වේලාව 0120 පැය වුවත් පල්ලිකුලම් දෙසින් ඇතුල් වීමට උත්සාහගත් පිරිස වෙත ආරක්ෂක හමුදව විසින් ප්‍රහාර එල්ල කිරීම නිසා ප්‍රධාන නායක පොට්ටුඅම්මාන්ගේ උපදෙස් පරිදි අනෙක් කණ්ඩායම් ද ප්‍රහාරය ආරම්භ කර ඇත.

## හඳුනා ගැනීම, පණිවුඩ හුවමාරුව හා ආහාර සැපයීම:-


රාත්‍රි කාලයේ ඔවුනොවුන් හඳුනා ගැනීම සඳහා කොල පාට එලි සහිත කුඩා විදුලි පන්දම් භාවිතා කර ඇති අතර, දිවා කාලයේ දී ඒ සඳහා කොළ පාට කොඩියක් භාවිතා කර ඇත. සෑම 07/08 දෙනෙකුගේ කණ්ඩායමක් 15 දෙනෙකුගේ නායකයා සමග ද සෑම 15 දෙනෙකුගේ කණ්ඩායම් නායකයකුට තම සමූහ නායකයා සමග ද, සමූහ නායකයින් පොට්ටු අම්මාන්, ස්වර්නන් සහ සූසෙ සමග ද පණිවුඩ හුවමාරු සම්බන්ධතාවය පවත්වාගෙන ඇත. "කේකලර් යන අයගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් විසින් කෑම පාර්සල් ගෙනවිත් ලබාදී ඇති අතර, තනන්තිලප්පු දෙසින් බනිස් හා චොකලට් ලැබී ඇත. පූනරීන් කඳවුර තුලම අල්ලා ගන්නා ලද ප්‍රදේශයන් හි ඇති ළිං මගින් ජලය ලබාගෙන ඇත.

## පසු බැසීම:-

බලාපොරොත්තු නොවූ සාමාජික සංඛ්‍යාවක් මරණයට පත්වීම, තුවාල ලැබීම හා සැපයීම් නිසි පරිදි ඉටු නොවීමේ හේතුවෙන් ප්‍රධාන නායක පොට්ටුඅම්මාන්ගේ උපදෙස් පරිදි පසුබැසීමට තීරණය කර ඇත. ස්වර්නන් හා වෙල්වම් තුවාල ලැබීම පසු බැසීම සඳහා තවදුරටත් රුකුලක් වී ඇති අතර, මේ අනුව බෝට්ටු හා වාහන මගින් ද පා ගමනින් ද "මන්නාරම කිලිනොච්චි හා නල්ලූර් ප්‍රදේශයන් කරා ක්‍රම ක්‍රමයෙන් ත්‍රස්තවාදීන් පසු බැස ඇත.

මෙම ප්‍රහාරයේ දී අනුබු, නවනීදන්, සූම් හා කුනා යන නායකයින් ඇතුළුව ත්‍රස්තවාදීන් 525 දෙනෙකු මිය ගොස් ඇති අතර, 1000 කට අධික සංඛ්‍යාවක් තුවාල ලබා ඇති බව "ඉදිරිපිම්ම" මෙහෙයුමේ දී සොයා ගන්නා ලද ත්‍රස්තවාදී සමරු පොතක ඡායාරූප සහිතව සඳහන් වී තිබුණි. එහෙත් එම ප්‍රහාරයෙන් දහසකට අධික ත්‍රස්තයින් පිරිසකට මරු කැඳවූ බව ඉද්ධි තොරතුරු මගින් දැනට අනාවරණය වී තිබේ. ආරක්ෂක හමුද භට පිරිස් මියයෑම්/අතුරුදහන් වීම් සංඛ්‍යාව (Censored) ක් වන අතර, තුවාල ලැබූවන්ගේ සංඛ්‍යාව (Censored) කි.

ආරක්ෂක හමුද වෙතින් පැහැර ගන්නා ලද යුධ ටැංකි දෙකෙන් එකක් පූනරීන් නගරය දෙසට ගෙනයෑමේ දී ක්‍රියා විරහිත වීමේ හේතුවෙන් ත්‍රස්තවාදීන් විසින් විනාශකර ඇති අතර, අනෙක් යුධ ටැංකිය කිලිනොච්චිය දෙසට රැගෙන ගොස් ඇත. 120 මිමි මෝටාර් අවියත් සහ විශූබයක් ද, අනෙකුත් අවි ආයුධ විශාල ප්‍රමාණයක් ත්‍රස්තවාදීන් විසින් අත්පත් කරගෙන ඇත.



ලද විරාමයක ප්‍රතිසංවිධානය වන අයුරු

# ක්‍රියාන්විත සටහන්

පුනරීන් කඳවුර සිය පාලනය යටතට ගෙන සංගුපිටි - පුනරීන් මාර්ගය නැවතත් ගමනාගමනය සඳහා 1993.11.14 දින විවෘත කරන බවට එල්ටීටීඊ සාමාජිකයින් විසින් යාපනයේ පොදු ජනතාව වෙත ප්‍රතිඥාදී ත්‍රස්තවාදීන් විසින් දියත් කරන ලද "ලීප් ෆ්‍රොග්" නම් වූ මේ දැවැන්ත ක්‍රියාන්විතය සිය සාමාජිකයින් ජීවිතක්ෂයට පත් කරමින් තවත් එවැනිම පිරිසක් සදාකාලික අබ්බගාතයන් බවට පත් කරමින් සැබෑ නොවූ සිහිනයක් ලෙස ඉතිහාසයට එක්විය.

ත්‍රස්තවාදීන්ගේ මෙම අසාර්ථක මෙහෙයුම අවාසනාවකට මෙන් බොහෝ දෙනෙකුගේ සිත්හි මුසපත් වූයේ යුධ හමුදාව ලත් පරාජයක සටහන් ය. මේ ලිපිය කියවූ ඔබ එහි සත්‍ය අසත්‍යතාවය වටහා ගනු ඇතැයි සිතමි. මෙම සංග්‍රාමයේ දී ජාතික මෙහෙවරකට දායකව පුනරීන් තල්අරණේ නිහඬව සැතපුනු ලක් පුතුන් හා ආරක්ෂක හමුද ජයග්‍රහණය උදෙසා පැතුමකින් හෝ දායක වූ සියළු ලක් වැසියන් ද, නොවන්නට ත්‍රස්තවාදීන්ගේ "පූනරීන් සිහිනය" සැබැවන්නට ඉඩ තිබුණි. ලේ පිපාසිතයින්ගේ සිහිනය බොඳවූවා පමණක් නොව දූසිතයින්ට සිදුවූ හානි කොපමණ ද යන්න අවුරුදු එක හමාරක පමණ කාලයක් ගතවන තුරුත්, කිසිදු දැවැන්ත ප්‍රහාරයක් ආරක්ෂක හමුදාව වෙත එල්ල කිරීමට ඔවුන්ට ශක්තිය නොවූයේ පූනරීන් ලද පරාජයෙන් දඩි ලෙස හෙම්බත් ව සිටි නිසා ය. එහෙත් ජනමාධ්‍ය තුලින් හා සමහරක් පටුවාසී උදෙසා පූනරීන් සටන ත්‍රස්ථයන්ගේ ජයග්‍රහණයක් බව හොවා දැක්වීමට උත්සුක විය. නමුත් ලේ ගංගා මතින් අධිකලෙස හඹාගියේ නොසිතූ පරාජයක පතුල් තලයට බව සැහවුණු රහසක් වී ඇත.

සකස් කලේ
මේජර් ඩියූ ද ලැනරෝල් ආර්ඩබ්පී
ශ්‍රීලපාහ

## රිවිරැස 3 වන බළ ඇණිය

25 වැනි පිටුවෙන්

අප හටපිරිස් උපක්‍රමශීලිව ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයන්ට ප්‍රතිප්‍රහාර එල්ල කරන ලදී. කාල තුවක්කු හා සන්නාසන්නද්ධ රථ වල සහාය ද මනාව ලද හෙයින් අපේක්ෂිත භූමි ප්‍රදේශය වෙත අප හටපිරිස් ළඟාවන විට ත්‍රස්තවාදීන්ගේ මළ සිරුරු හා අවි ආයුධ විශාල ප්‍රමාණයක් තැන තැන විසිරී තිබෙනු දක්නට ලැබුණි. මෙදින ගැටුම් වලදී සෙනින් 05 දෙනෙකු මියගිය අතර, තවත් සෙබළුන් 33 දෙනෙකු තුවාල ලබන ලදී.

"රිවිරැස" ක්‍රියාන්විතයේ 3 වන දිනය වූ 95.10.19 වන දින හිරු උදවත් සමගම ඉදිරියට ගමන් ඇරඹූ හටපිරිස් ඉලක්කය වූ කුප්පිලාන් ප්‍රදේශය වෙත ළඟාවීම සඳහා උත්සාහ දරණ ලදී. ත්‍රස්තවාදීන් උපායශීලීව සැඟවී සිට පහර දුන්න ද, ඔවුන්ගේ බාධක බිඳ දමා ඉදිරියට ගමන් කිරීමට අප හටපිරිස් වලට හැකිවිය. මෙදින ත්‍රස්තවාදීන් මුහුණට මුහුණලා සටනේ නියැලීමට උත්සාහ නොකල අතර, මේ වන විට තුවාල ලබා සිටි ඔවුන්ගේ සගයන් ප්‍රමාණය විශාල වූ නිසා ඔවුන් යුධ පිටියෙන් ඉවත් කිරීමට ප්‍රමුඛ ස්ථානයක් දී ක්‍රියා කරන ලදී. සැලසුම් සහගතව අප බලසේනාවලට මුහුණ දීමට තරම් තම සංවිධානය සමත් නොවන බව සටනේ නියැලී සිටි ත්‍රස්තවාදීන්ට මේ වන විට අවබෝධ වී තිබුණි. මෙදින අපේක්ෂිත ඉලක්කය වන කුප්පිලාන් ප්‍රදේශයට එදින 1030 පැය පමණ වන විට ළඟා වීමට හැකිවිය. පස්වරු 0200 පැය වනතෙක් ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීම සඳහා හටපිරිස් උත්සාහ කරන ලද අතර මෙදින ගැටුම් වල දී නිලධාරීන් 01 ක් හා සෙනින් දෙදෙනකු තුවාල ලබන ලදී. මේ වන විට මුළු කුප්පිලාන් ප්‍රදේශයේම බලය 522 බලසේනාවෝ සියතට ගන්නා ලදී.

කුප්පිලාන් ප්‍රදේශයේ දින කීපයක් රැඳී සිටි අප හට පිරිස් නැවත 1995.10.29 වන දින උරේලු ප්‍රදේශයේ බලය තහවුරු කර ගැනීම සඳහා ගමන් අරඹන ලදී. මෙදින අප හටපිරිස්වලට ගමන් කිරීමට තිබූ භූමිය ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට එතරම් දුරට නතු වී නොතිබුණු අතර, අප හටපිරිස් පහසුවෙන්ම උරේලු දකුණු ප්‍රදේශය තරණය කරන ලදී. ත්‍රස්තවාදීන් විසින් විටෙන් විට සැඟවී ප්‍රහාර එල්ල කල නමුත් ඔවුන් මැඩලීම අප හටපිරිස් වලට පහසු ක්‍රියාවක් විය.

1995.10.30 වන දින උරේලු උතුරු ප්‍රදේශය වෙත ගමන් ගැනීමට නියමිතව තිබූ අතර, උදෑසන 0830 පැයට පමණ අප හටපිරිස් ඉදිරියට ගමන් ගැනීම අරඹන ලදී. මෙදින ත්‍රස්තවාදීන්ගේ දැඩි ප්‍රහාරයකට මුහුණ දීමට අප හටපිරිස් වලට සිදුවූ අතර, ත්‍රස්තවාදීන් විසින් බෝම්බ නිපදවීම සඳහා භාවිතා කරන ලද ඇලුමිනියම් කර්මාන්ත ශාලාවක් අත්පත් කර ගැනීමට අප හටපිරිස් සමත් විය. මේ වනවිට ත්‍රස්තවාදීන්ගේ ඉහල පෙලේ නායකයන් ද සටනට අවතීරණය වී සිටි අතර, මෙම ප්‍රදේශයේ අණදීම භාරව ක්‍රියාකල ත්‍රස්තවාදී නායකයන් කීප දෙනෙකු ඇතුළු ත්‍රස්තවාදීන් විශාල පිරිසක් මෙදින සටනේදී මියයන ලදී. ත්‍රස්තවාදින් සමග මුහුණට මුහුණ ලා සටනේ දී සෙසු නිලයින් දෙදෙනකු මියයන ලදී.

පුරා දින ගණනාවක් අනේක දුක් ගැහැට විඳමින් අප හටපිරිස් ත්‍රස්තවාදීන් සතුව තිබූ කුප්පිලාන් උරේලු ප්‍රදේශයන් හමුද අණසක යටතට ගැනීමට සමත් විය. සටන් පෙරමුණේ සිට නිවැරදි නායකත්වයක් ලබාදෙමින් අප ඒකක නිලධාරීන් හා සෙනින් සටනට පෙළගැස්ම අරබයා අණදෙන නිලධාරී විසින් මහත් කාර්යභාරයක් ඉටු කරන ලදී. නොපසුහට උත්සාහය හා ධෛර්ය පෙරදැරි කරගෙන ත්‍රස්තවාදීන් සමග මුහුණට මුහුණලා සටනේ නියැලුනු මෙම ඒකක නිලධාරීන් හා සෙනින් දැක්වූ රණකාමීත්වය අගය කළ යුතු ය. ත්‍රස්තවාදීන්ගේ පවුරු බිඳ දමා ඉදිරියට ගමන් කරමින් ක්‍රියාන්විතය සඳහා අප හටපිරිස් ලබාදුන් උද්යෝගිමත් මුලාරම්භය හේතු කොට ගෙන මුළු මහත් ලක්වැසි ජනතාවගේ සාමයේ ප්‍රාර්ථනාවන් මල්පල ගන්වමින් යාපනය නගරය මධ්‍යයේ අප ජාතික ධජයට එසවීමට හැකි වූ බැව් මෙහිලා සටහන් කරමි.

මෙම ක්‍රියාන්විතයේදී මහත් කාර්යභාරයක් ඉටුකරමින් සිටියදී රට ජාතිය වෙනුවෙන් තම ජීවිතය කැපකල මෙම ඒකක දෙවන අණදෙන නිලධාරී ලුතිඃකර්ඃ ජේපීඑස් ජයවීර ශ්‍රීලපාහ ඇතුළු සෙසුනිළයින් 15 දෙනා ගෞරවයෙන් සිහිපත් කරන අතරම සටෙන් දී තුවාල ලැබූ නිලධාරීන් 05 දෙනා හා සෙසු නිළයින් 132ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමු. යුද හමුද ඉතිහාසයේ සිදුකල දැවැන්ත ක්‍රියාන්විතයක මුලාරම්භයට දායකවීමට ලැබීම 3 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුද ලද තවත් විශිෂ්ඨ වරයක් ලෙස සාඩම්බරයෙන් සිහිපත් කරමු.

සකස්කලේ
කෝප්‍රල් නීරෝෂන් එස්ජ්එස්
3 ශ්‍රීලපාහ

# බංකරයෙන් ඇසෙන කුරුටු ගී

මාරක කොටි කටේ සිටින සෙබළුනට ජීවිතයට වඩා හැමතින් මරණය සමීපය. මරණය පිළිබඳව වන බිහිසුණු කුරිරු මතක සටහන් මැද ජීවත් වන ඔවුහු හමුද සොල්දදුවන් ය. උපන් බිමේ උරුමය රැක ගන්නට සතුරා හමුවට නොබියව පිය මනින මුත් මේ සොල්දදුවන්ට නොයකුත් දේ පිළිබඳව හැඟීම් උපදී. එහෙත් ඔවුන්ගේ සිත්හි උපදින අනන්ත හැඟීම් කියාගත නොහැකිව ලත වෙයි. මෙම අවස්ථාවට මොවුන්ට බංකරය රජ දහනක් සේ වන අතර, කැටපත් පවුරකි. යෞවනය ජීවිතයේ වසන්තය වැනි ය. මල් පිපෙන වසන්තයේ මල් සොයා යන බඹරුන් මෙන් යෞවනයෝ ද ජීවිතයේ සුන්දරත්වය සොයා යති. ඇතැමෙක් සංගීතය නාට්‍ය සිනමාවවැනි කලාංගයන්හි ඇති රස සොයද්දී තවෙකෙක් ප්‍රේමයේ රැඳගත් ආත්ම වින්දනය සොයා යති. සුරූපී යුවතියකගේ අතින් අල්ලාගෙන සොඳුරු මල් ගොමුවක හෝ මුහුදු තීරයක ඇවිද යන තරුණයන් තවත් විටෙක සිනමා ශාලාවක අඳුරු කොනෙක තනි වෙති. තාරුණ්‍ය මොන තරම් චමත්කාර ජනක දැයි සිතන ඔවුහු නවීනතම පන්නයේ යතුරු පැදියක නැගී, මන් මාවත්වල පියඹන්නට ආශා දක්වති. සැබැවින්ම යෞවනය චමත්කාරයි යන්න නොරහසකි. එහෙත් එකී යෞවනයට උරුම වූ චමතකාරය ගැන නොසිතා රට වෙනුවෙන් ජාතිය වෙනුවෙන් කැප වූ තරුණ පිරිසක් ද අප අතර වෙති. ඒ අවිවාදයෙන් සොල්දදුවෝ පමණක් බැව් සැමගේ මතය වේ. "එන්න අප හා එක්වන්න" යන සිරස් තලය යටතේ පුවත්පත් දැන්වීමක් දුටු පමණකින් දහස් ගණන් වන දිගු පෝලිමට ගොස් පෙල ගැසෙන මේ අභීත තරුණයන්ගේ එකම පැතුම තම දේශය රැක ගැනීමයි. ඇතැම් විට තම පෙම්වතියන් හුදෙකලා කොට තම දෙමාපියන් සහෝදර සහෝදරින්ගේ නෙත් අග කඳුලු බිඳු මතු කොට ඔවුන්ගෙන් සමුගෙන ඈත එපිට යුධ පිටියට යන මේ තරුණයින් අන් කිසිවෙකු නොව හමුද සොල්දදුවන් ය.

බිම් බෝම්බ ජොනී බට්ටන් වැනි විවිධ මාරක ආයුධ දස දෙසින් ඔවුන් වෙත එල්ලවී තිබේ. ඇතැම් විට ඔසවා බිම තබන ඊළඟ පියවර ඔවුන් තබන්නේ ජොනී බට්ටෙකුගේ මතු පිට විය හැක. එබඳු මරණීය සද කාලීක අබ්බාගාත කරණ අනතුරු සැම දෙසින්ම ඔවුන් වටකර ගෙන සිටිද්දීත් මේ වීර සොල්දදුවන් අභීත ජීවිත ඉරණමකට මුහුණ දෙති. එසේ වුවත් ඔවුන්ගේ හදවත් නිරතුරුවම බිය පාළුව ආදරය හා ශෝකය මැද හුදෙකලාව පවතී. තම ගෙදරට ලියුමක් ලියාගත නොහැකිව ගෙදරින් පණිවුඩයක් නොලැබ නිරතුරුවම හද සංතාපයතුළ ශෝකය ගැබ්කරගෙන සිටින ඔවුහු සිය පාළු සහගත හැඟීම් කියාගත නොහැකිව ලතැවෙයි. එවැනි විටෙක නොදැනුවත්වම මෙන් ඔවුන්ගේ දෙනෙත් කඳුලින් බරිත වෙද්දී නිරායාසයෙන් අතැඟිලි අතරට සිර වනුයේ සුපිරි පන් හිඳක් නොව. විටෙක ඉවත දමන අභුරු කැබැල්ලකි. තවත් වරෙක කිසිත් නොවටිනා ගල් කැටයකි. එයින් බංකරය මත සිව් පදයක් කුරුටු ගාන්නට මේ වීර සොල්දාදුවන් පෙළඹෙන්නේ කිසිම හරයක් නොමැතිව ය. සරසවියේ ඩෙස් බංකු මත පෑන් තුඩකින් ලියැවුණු කුරුටු ගීයක් සීගිරි කැටපත් පවුරෙහි ලියැවුණු කුරුටු ගීයකත් නැති අන්දමේ දුක්බර බවක් බංකරයක ලියැවුණු බංකර් කුරුටු ගීයක දක්නට තිබේ. බංකරය තුළ ගෙවන වගකීම බිය අවිනිශ්චිත බව පිරුණු අනතුරු දායක ජීවිතයේ ස්වභාවයත් මව්ගුණ තම පෙම්වතියන් පිළිබඳ සිත තුළ උපදින හැඟුම් සම්භාරයත් යෞවනය දියව යන ජීවිතයේ දහසකුත් එකක් වන සොඳුරු ප්‍රාර්ථනා සම්භාරයත් බංකර් කුරුටු ගී වල ගැබ්ව තිබේ. මේවා හුදෙක් අහිංසකත්වය ගොනුකර ඇති අතර, පෙරලියක් කෝලහලයක් පෙළඹවීමක් කුරුටු ගී තුළ ඇත්තේ ම නැත. කොටි ත්‍රස්ථවාදීන් ගේ වෙඩිල්ලක් එල්ල වෙතැයි යන චේතනාවෙන් හදවත පුරවාගෙන බංකරයේ කුඩා සිදුරකින් සතුරාගේ ඉසව්වට නෙත්ලාගෙන සිටින මේ වීර සොල්දදුවෝ ඇතැම් විටෙක බංකරයේ ජීවිතය පිළිබඳව ශෝක වෙයි.

සූත්කර ගති පැතුමක් නොලැබුවෙමි ජය
ලංකර ගන්න සැප සම්පත් නොහැකි විය
පිංකර ඇති පරිදි සිදු වෙයි සියලු දෙය
බංකර් තුළ ගෙවෙයි අපගේ තරුණ විය.

සැබැවින්ම බංකරය තුළ ගෙවී යන තාරුණ්‍ය පිළිබඳ තාරුණ්‍යයේ සුව නොවිඳි සෙබලුන්ගේ සිත්වල පවත්නේ දුකකි. සංතාපයකි. වේදනාවකි. රටේ අනෙකුත් පෙදෙස්වල ආගමික හෝ ජාතික උත්සව නොඑසේ නම් වෙනත් උත්සව පැවැතිව ද සෙබලෙකුට එකී උත්සව කිසිවෙකට සහභාගී වීමට පුළුවන් කමක් නැත. ඔහු ගිනි අවිය අත දරා බංකරය රැකුමෙහි කාර්යෙහි නිරතුව සිටිය යුතු වන්නේ මය.

වෙසක් පොසොන් හෝ අවුරුදු උත්සවය
තිබුනට මොට ද නෑ අප හට එහි පල ය
තුරුලු කරන් පපුවට රුදු ගිණි අවිය
බංකර් තුල ගෙවෙයි අප සමනල තරුණ විය

බංකරයේ ජීවිතය සැම විටම අවිනිශ්චිත ය. සතුරාගේ ඉසව්වට නෙත් සිත් ලාගෙන සිටියත් ඇතැම් විටෙක සොල්දාදුවන්ගේ නෙතට හොරා සතුරාගේ වෙඩි උණ්ඩයක් බංකරය වෙත පැමිණීමට මහ වේලාවක් නොයයි එවැනි විටෙක

නිදි නැති රැයක මා තනියම සිටින විට
පිට පිට වෙඩි හඩක් ඇසුනා ඉදිරි පිට
ගිණිගත් උණ්ඩයක් වැදිලා වම් අතට
අතක් අහිමි වී යන්නෙමි මම ගමට

ඇතැම් විටෙක සතුරු ඉලක්කයට ලක්වෙන්නේ බංකරය තුළ රැය පුරා තනි නොතනියට ගත කල ස්වකීය සෙබල මිතුරා ය. එවැනි විටෙක සොල්දදුවෙකුගේ සිතක උපදින්නේ සතුරා කෙරෙහි අධික කෝපයකි. සතුරන් පසු පස ලුහුබැඳ ඔවුන් මරා දැමීමට තරම් වෛරයකි.

අද මා සමග බංකරයේ සිටි මිතුරා
හෙට එයි අඩි හයක ඉටි කොලයේ අතුරා
ලෝකය කුමක් කීවත් අම්මේ පතුරා
පින් මිස ලොවේ පව් නැත නැසුවට සතුරා

සොල්දදුවාගේ ජීවිතය බංකරය තුළ ඒකාකාරී ලෙස ගෙවී ගිහින් උදයට නැගෙන හිරු සැන්දෑවේ දී අවරගිරේ ගිලිහී යන බව නොරහසකි. ඉර බැස ගිය සැඳෑවක බංකරය තුළ හුදෙකලා වූ සොල්දදුවගේ සිත අතීතය

කරා ඇද යන්නේ තමාට ද හොර රහසේ ය. එබඳු විටෙක මුලින් ම සිහි වන්නේ අම්මා සහ තම ආදර වන්තිය නොවේ ද?

අම්මගේ දෙපා වැඳ ගෙදරින්          පිටවූවා
තිසරණ සරණ වන බැව් ඇය          පැවසූවා
අම්මා කී වදන් සැම විට          රැව්දේවා
සිත ඇය ගාව මම අද උතුරට          ආවා

අම්මාවරු මේ රාත්‍රියේ දීත් සිය සෙබළ පුතුන් වෙනුවෙන් කිසිදක නොදකින දෙවියන්ගේ පිහිට හා රැකවරණ පතයි. පංසලේ බෝධිය ළඟ වැටී බෝධි පූජා පවත්වන විරෝධාර අම්මාවරු උතුරේ සතුරු අඩවියේ සිටින තම පුත් රුවනට ආශිර්වාද කරති.එහෙත් ඒ අම්මාවරුන්ගේ සිත් තුළ ඇත්තේ පුතුණුවන් උතුරට පැමිණීම පිළිබඳ වේදනාවකි.

අඳුරුයි ලොව මුහුදේ හිරු          ගිලුනාම
දුකමයි මවට පුතු උතුරට          ආවාම
යුධ ගිනි නිවී සාමයෙ මල්          පිපුනාම
එනවා අම්මේ ඔබ දැකුමට          ඉඳුරාම

අම්මාවරු දකින්නට සෙබල පුතුන්ගේ සිත් තුළ ඇත්තේ ඉමහත් ආශාවකි. එසේම තම අහිංසක පෙම්වතිය හා වචනයක් දෙඩීමට ඇත්තේ ද නොසිඳෙන ආශාවකි. එහෙත් ඒ ආශාවන් ඉටු කර ගන්නට අත්‍යවශ්‍ය සේවයක යෙදෙන සොල්දාදුවන්ට හැකි වන්නේ කවදාදැයි ස්ථිරවම කිව හැක්කේ කා හට ද ඒ දවස තිර ලෙස උදා වන්නට නම් සාමයේ මල් විකසිත විය යුතු මය. ඒ බව දැන දැනත් සොල්දාදුවෝ මව් පියන් සොයන්නට පාරමී පුරති.

ඇතැම් සොල්දාදුවෝ ප්‍රේමවන්තයෝ වෙති. ඔවුන්ගේ සිත් වල අම්මාවරුන් පෙම්වතියන් බිරිඳ සහ සිහිති දරු පැටියන් නිරන්තරයෙන් ජීවත් වෙති. එහෙත් ඔවුන් සොයා ඇසිල්ලකින් දිව යන්නට මේ අහිංසක සොල්දාදුවන්ට වරම් තිබේ ද? සැබැවින් ම ඔවුන් සිහිනයෙන් එම අයගේ උණුසුම ලැබීමට පහස සොයා යන්නට පෙරුම් පුරති. ඔවුන්ගේ පැතුම

මලක් වෙලා ඔබ මිදුලේ          පිපෙන්න ද?
ගලක් වෙලා ඔබ කකුලේ          හැපෙන්න ද?
ගහක් වෙලා ගේ දොරකඩ          ගලන්න ද?
සිහිනෙන් ඇවිත් ඔබ තුරුලේ          නිදන්න ද?

නොසිතුව විලස හමුවීමක් ඇසට          ඇස
මතකයෙ ඇඳුනි රුව අමතක නොවන          ලෙස
නිදිකර දෙනෙත් මේරූ සිහිනයක්          රස
මොනවා කරන්න ද සිහිනෙන් දකිණු          මිස

උතුරු කරයේ මරු බිය රැඳුණු බංකරයක කල් යවන විට පෙම්වතියන් අන් පෙම්වතෙකුගේ තුරුලට යා දැයි සෙබල පෙම්වතුන්ගේ සිත්වල ඇත්තේ සැකයකි. එවන් විටෙක ඔවුන් පෙම්වතියන්ගෙන් අයැදින්නේ සිය සිත දෙපලූ කොට ඈතක ඇදී නොයන ලෙසට ය.

ලස්සන රෝස කැකුලක් ඔබ නෙලන          විට
පසු නොබසින්න එහි ඇති කටු දකින          විට
ඒ මල කොතින්තා තව මල් නෙලන          විට
යන්නට එපා ලාමක සිත් දෙපලූ          කොට

සෙබල පෙම්වතෙකු ගිණි අවිය තුරුලු කොටගන බංකරය තුළ රැඳී සිටින විට ඔහුට සිහි පත් වන්නේ සිය පෙම්වතිය තුරුලු කරගෙන සිටින ඇසිල්ලකි. ඒ ආශ්වාදනීය තත්පරය බංකරය තුළ සිටින විට ඔහුට අත් වන්නේ දරා ගත නොහැකි වේදනාවකි.

සූරනට සූරන ගෙන ලැමැදට තුරුලූ          කර
ගත කල විරාමය මතක ද අප          නිතර
කුමරිය ඔබේ කුමරුත් අද දිවි          කතර
මව් බිම රකිනවා අවියක් තුරුලූ          කර

එහෙත් බොහෝ සොල්දාදුවන් ගේ සිත්වල විරු හැඟුම් මිසක පෙම් හැඟුම් නොවේ. ප්‍රේමයේ දෝ මනුස්සයින් වියෝග කඳුලත් අමතක කර දමා ඔවුහු විරු හැඟුම් වලින් සිය සිත් පුරවාගෙන හිඳිති. එවන් සෙබලුන්ගේ විරු සිතිවිලි බංකරයට එන අන් සෙබලුන්ගේ සිත් දිරිමත් කරවන බව පැවසීම සත්‍යයකි. ඇතැම්විර සොල්දාදුවෙකු සිය සහෝදර සොල්දාදුවන්ට ප්‍රවේසම්වීමට අනතුරු අඟවති.

කවියට කලාවට නිතරම දිරිය          දෙන
අවියත් අරන් යුධ පිටියේ පෙරට          එන
යුධ සෙබලුන් යුධ පිටියෙන්          සිනාසෙන
ඉදිරියෙ බට්ටන් ඇති දෙකකුල්          බලාගෙන

යුධ අවි රැගෙන මෙසේ ඉදිරියට ඇදෙන සොල්දාදුවන්ට ත්‍රස්තවාදීන්ගේ වෙඩි හඬ ඇසෙන්නට ගනී ඇතැම් විට එම වෙඩි උන්ඩ වැදී අපේ සොල්දාදුවන් කිහිප දෙදෙනකු එකා පිට එකා ඇද වැටෙන්ට පිළිවන. එබඳු දෙයක් වූව ද සොල්දාදුවන් උකටලීව ආපසු යා යුතු නොවේ.

කොපමණ දරුණු වූව කොටියන්ගේ          සද්දේ
සෙබලුන් මැරී මැරී වැටුනත් එක          මැදදේ
නවතන්නට එපා විරු සොයුරනි          යුද්දේ
පොලියත් සමග ලඟදීම දෙනවා          යුද්දේ

යුධ බිමේ යුධ වදින සෑම සොල්දාදුවෙක්ම වැටුපක් හිමිවේ. ඇතැම් සොල්දාදුවෝ ජීවිතයට ඇති ආශාව පවා හැර දමා හමුදාවට බැඳුනේ ද හුදෙක්ම මෙම සුළු වේතනය බලාපොරොත්තුවෙන් ද? එහෙත් මෙම වැටුපෙන් අම්මා තාත්තා සහ නංගිලා මල්ලිලා ද යැපෙන අතර දහසකුත් පුද්ගලික අවශ්‍යතා ද ඉටු කර ගැනීමට මෙය ප්‍රමාණවත් ද? එසේ වූවත් සොල්දාදුවන් සිය සේවයට වැටුප් එපා යැයි පවසන්නවුන් නොමැතිවා නොවේ.

ටාගට් කරල ගහමු ද ආර්සීඑල්          වෙඩි
අඩුවක් නැතිව බඩු ඇත්නම් අපිත්          රෙඩි
මර හඬ නගා ඇද වැටෙනව සතුරු          තඩි
අද හෙට දිනමු සෙබලුන් හට එපා          පඩි

ඉස්සර තිබුණ මිනිසත් ගති          මිනිසුන්ගේ
දැන් නැත, හොඳයි පිළිවෙත් වග          වලසුන්ගේ
රීතිය පවා බිඳිමින් වන පෙත්          සතුන්ගේ
ඇයි මිනිසුනේ මස් කන්නේ          මිනිසුන්ගේ

**සෙ/13555 කෝප්‍රල් බණ්ඩා කේඑම්ටී**
(නි:කා:ම: 4/ ශ්‍රීලපාහ)
5(සෙව්) ශ්‍රීලපාහ පෙර මූලස්ථානය
යුද්ධ හමුද කඳවුර
බණිජවැලි සංස්ථාව
පුල්මුඩේ.

# Chemical Warfare

by Wg. Cdr. Mark Seneviratne SLAF (Retd)

Although there seems to be much interest shown about chemical and Gas warfare, many do not appear to know what it really means. What exactly is chemical warfare, what are chemical agents, and how dangerous or lethal can they be?

Today chemical and biological warfare remains banned thoughout the world by international treaty, and in fact it was the Geneva Protocol of 1925 that first banned such warfare, Amazingly though, America together with Japan, Brazil and Agentina did not sign that first agreement.

## CHARACTERISTICS

A chemical warfare agent is any substance which will reduce the fighting efficiency of a military force because of its poisonous, blistering or irritating effects. It can be disseminated as droplets of liquid or spray similar to Rain; in the form of aerosol similar to mist suspended in the air; as vapour or gas, or as minute particles forming something like smoke. It may however be of some consolation to know that chemical warfare agents in whatever form they may be dispersed, are affected in varying degrees by climatic and weather conditions.

Chemical agents are usually released at selected points and thereafter the wind may do the needful. Sometimes in order to avoid being detected carrying chemical agent containers to selected release points, they may be piped to those outlet points from central discharge positions through subterranean tubings. In fact it may be said that technical and tactical considerations determine the points of release while natural forces affect the dispersion of the chemical agent and its ultimate efficiency. A chemical warfare agent can pervade the atmosphere over quite an area and everyone within its compass will become exposed to its effects. In certain cases the effects can be immediate while in others, they may take awhile.

## USE OF AGENTS.

Chemical warefare agents can be used to kill; to cause casualties, to harass and reduce efficiency; to create obstacles by contaminating ground; to contaminate food, water, clothing, equipment, stores etc; and to upset the behaviour pattern of troops.

Generally in chemical warfare the tendency is to use agents of high toxicity and persistency. Toxicity is that which causes causalties while persistency is the quality that allows a chemical agent to remain effective in the field for a long time. Accordingly in chemical warfare it is the persistency of an agent which helps determine the period of time that should be allowed to elapse before troops move in to contaminated areas. Another which influences the selection of a chemical agent for warfare is its stability, because if it was to decompose rapidly it will have little value even though its other properties are highly desirable. Stability may be affected by temperature and is usually reduced by moisture.

Of course any science student will know that when a chemical compound reacts with water one or more new compounds are produced, and that the process is referred to as hydrolysis. It is no different with some chemical warfare agents which are broken down in water, often creating non-poisonous products. Thus such chemical agents disseminated during heavy monsoonal rains may not accomplish the desired effects.

Other characteristics of chemical warfare agents which influence decisions as to their use are firstly, volatility which is its capacity when in liquid form to vapourise in open air. Volatality, naturally increases with temperature. Secondly, is its vapour density because the more dense an agent happens to be the longer it would tend to cling to nooks, corners, low ground etc. Thirdly, is its solubility because most chemical warfare agents dissolve in paraffin, petrol, spirits, oils and fats. In chemical warfare this factor is important when planning for decontamination.

## CLASSIFICATION

Chemical warfare agents are classified according to their principle effects on the body. Accordingly they may be referred to as TEAR AGENTS which causes pain and a smarting sensation in the eyes, the flow of tears, irritation of the skin and a burning sensation in the breathing passages. NOSE AGENTS cause irritation in the eyes and nose, tightness of the chest, vomiting and a general sense of weakness. BLOOD AGENTS prevent the normal transfer of oxygen from the blood to the body tissues. CHOKING AGENTS are those which cause injury to breathing passages, nose, throat and lungs. In extreme cases death may result due to there being fluid and a lack of oxygen in the lungs. BLISTER AGENTS attack all parts of the body causing blisters on the skin and damage to the eyes and lungs. NERVE AGENTS even in small quantities attack the nervous system and could be lethal.

The effects of chemical warfare agents on the body depends on the amount of it absorbed into the body, which could occur either by inhalation and ingestion, or through the eyes and skin, It is possible with some chemical agents that a lethal dose may be absorbed even before the initial symptoms are recognized.

## NERVE AGENTS

Nerve agents are the most lethal in chemical warfare. Sarin which was used recently in Japanese subways is one while Tabun and Soman are other examples of it. Small doses if it can be lethal and it can be disseminated in liquid, geaerosol or vapour form. When it is breathed into the body the poison begins to react almost instantly. Liquids are of graduated persistence and emanates invisible vapours. They are also colourless, ordourless, tasteless and creates no sensation on the skin, Nerve agents in any form, absorbed through the eyes may be effective in about 30 seconds.

Nerve agents are relatively stable and may be broken down in water but as the process takes time, it could be of little military significance, Incapacitation due to nerve agents will be apparent from the start and as such early detection of symptoms is vital for timely treatment. Some of the symptoms are tightness of the chest, a running nose; dimness in vision; difficult in breathing; drooling; excessive sweating; stomach cramps; in voluntary urination and defecation; dizziness and severe headches; muscular twitching; paralysis. Detection by military purposes and it isbetter to watch out for symptoms. A well fitting respirator will protect the eyes, nose, throat and lungs from the nerve agents. However liquid nerve agents could after sometime penetrate rubber and even the eyepiece of rubber based respirators. Normal clothing will offer only temporary protection because the nerve agent will eventually penetrate it.

Decontamination of nerve agents could prove to be difficult because even small traces of it present a serious hazard. they can be destroyed by a solution of Caustic Soda, bleach paste and Chlorination. Also nerve agents do dissolve in and are absorbed by petrol,. paraffin, spirits, oils and fats.

## BLISTER AGENTS

Even though Blister agents too can be lethal, they have generally been used for their harassing and contaminating effects. Mustard, Lewisite, Ethyldichlorarsine, and Nitrogen Mustards are examples of blister agents. They can be disseminated either in liquid or vapour forms. Liquids are persistent, give off invisible vapours and may even persist under the surface of the ground which itself may appear free of liquid. Blister agents however can be light brown, black or colourless, and in general may smell like garlic and in some cases like geraniums anyway the smell becomes less noticeable with continued breathing.

Blister agents could be detected by chemical means. They attack the body when in liquid form, through the eyes and skin or when contaminated food and water are consumed; and in vapour form through the etes, the sking, the breathing passages, the throat and the lungs. Both liquid and vapour penetrate ordinary clothing but it slow in penetrating rubber. Their effects are quicker and stronger in hot and humid weather. They can cause permanent blindness and serous internal injuries. Even though blister agents are sable they can be destroyed by a solution of caustic soda or bleach paste.

Unlike in the case of nerve agents the respirator affords protection to the eyes, nose, throat and lungs against blister agents. Such agents in liquid form, if removed from the skin and suitable anti-blister ointment applied promptly, can prevent blisters forming on the skin. In the case of the agent in vapour form, particularly impregnated clothing needs to be worn as protection.

Chemical agents may be detected by chemical or other means but the process could take time and as such, it could be far quicker and safer to look for symptoms when there is even a suspision of chemical agents being present, common symptoms would be dimness of vision and difficulty in focusing on close objects; irritation and pain in the eyes' sudden headaches; tightness of the chest and throat; and a running nose.

Contamination of food and water can present a serious hazard. If ever food or water has been contaminated by liquid, liquid droplets or solid chemical warfare agents, they should be discarded. Nerve and Blister agent vapours make fatty foods unfit for consumption. Livestook killed by arsenical agents such as lewisite must be burned while crops too affected by such agents must be similarly destroyed. In the case of water, all unprotected sources of water in a contaminated area must be considered suspect until passed by a medical officer. It must however be remembered that contaminated water is difficult to decontaminate without chemical decontamination.

The main protection against chemical warfare agents is the respirator, although certain types may not be all that effective against nerve agents. In addition troops in contaminated areas will need to wear appropriate protective clothing leaving no skin surface exposed. Of course certain protective clothing would be quite cumbersome in combat conditions, and this affects the combat efficiency of the soldier.

**- CONCLUDED-**




5. යාපනයේ පැවැති ක්‍රියාත්මකයේ දී 3 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එල්බී තල්ගහගොඩ, ආර්ඩබ්පී, ශ්‍රීලපාහ ක්‍රියාත්විතය සඳහා සූදනම් වන මොහොතක.

6. රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ පනගොඩ කඳවුරේ සිටින ආබාධිත සෙනින් දෙහිවල සත්ත්ව උද්‍යානය නැරඹීම සඳහා ගිය අවස්ථාව.











7. යාපනයේ පැවැති ක්‍රියාත්විතයෙන් ජය ගැනීමෙන්
1 ශ්‍රීලපාහ සෙබළුන් විසින් එම ප්‍රදේශයේ ආරක
වලල්ලේ බංකර් සකස් කරමින් සිටින අවස්ථාවස

8. කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 41 සහ කාන්
කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 05 හි සිදු
සංචාරය සඳහා පැමිණි අවස්ථාවේ ශ්‍රීලපාහ නිලධ
නිවස්නයේ පැවති තේ පැන් සංග්‍රහයට සහභාගි
අවස්ථාව.





9. 1995 නොවැම්බර් 11 වන දින "විදුලි පහර" ක්‍රියාත්මකයේ දී හමුදාව විසින් අත්පත් කරගත් තොන්ඩමනාර් කලපුව අසල ගංවතුරෙන් යටවී තිබූ ඉදිරි ආරක්‍ෂක වලල්ලේ රාජකාරී සිදුකරන 9(සෙව්) ශ්‍රීලපාහ සෙනිත්ගේ සුවදුක් බැලීම සඳහා ගරු නියෝජ්‍ය ආරක්‍ෂක ඇමතිතුමා සහ යුධ හමුදාපති තුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පැමිණි මොහොත කැමරාවට හසු වූයේ මෙසේ ය.

10. වසර 10 කට පසුව ශ්‍රී ලංකා යුද හමුදාව සතුරු බලකොටු බිඳ දමා යාපනය නගරය සතුරාගෙන් නැවත ලබාගත් අසිරිමත් මොහොත. "රිවිරැස" ක්‍රියාත්මකයට පසුව නියෝජ්‍ය ආරක්‍ෂක අමාත්‍ය ගරු කර්නල් රත්වත්තේ මැතිතුමා ක්‍රියාත්මකය සඳහා සහභාගී වූ භට පිරිස් ඇමතූ අවස්ථාව.




11. 4 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ලුතිː කර්නල් ජ්කේඩිජේ පී සිරිවර්ධන ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී ශ්‍රීලපාහ යාපනයේ නුවර පාරේ සිට කොලොම්බුතුරේ දක්වා බලඇණි ගමන් ගන්නා ආකාරය පිළිබඳව සාකච්ඡාවක යෙදිමින් සිටි අවස්ථාවකි. ("රිවිරැස" ක්‍රියාත්මකය දෙසැ. 95)






12. 8 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අනදෙන නිලධාරී ලුති කර්නල් ජේ එස් මාසක්කාර ශ්‍රීලපාහ "රිවිරැස" ක්‍රියාත්මකය සඳහා තම නිලධාරී අණදෙන්නන් වෙත නියෝග දෙන අවස්ථාව.

13. 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලුති කුර්නල් ආර් එම් ඩී රත්නායක ශ්‍රීලපාහ ගේ නායකත්වය යටතේ එම ජනකය "රිවිරැස ක්‍රියාත්මකයේ දී සතුරන් විසින් පාවිච්චි කරනු ලැබූ ආර්සීඑල් අවියක් අත් අඩංගුවට ගත් මොහොත.